# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,495 – 1965 සැප්තැම්බර් 3 වැනි සිකුරාද – 1965.9.3

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1169 | කොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | 1203 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1179 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | 1201 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1182 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | 1201 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම ... ... ... | 1202 | විවිධ දැන්වීම් ... ... ... | 1204 |


[සැලකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයින්ගේ සහ උපදේශකවරුන්ගේ නාම ලේඛනයක් පළවේ.]

## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

දීමනා.—ජෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවක හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස්පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩදෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිය යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවයෙහි සිටින්නන්ට හැර සෙසු අයට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, යථා යෝග්‍ය පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලබන නව ප්‍රවේශකයන්ගේ ආධුනික/පරීක්ෂා කාලය අවුරුදු තුනක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථා වලම මෙන් ම මින්මතු පනවනු ලබන ව්‍යවස්ථා වලට ද අනුකූලව නව ප්‍රවේශකයන් ක්‍රියා කළ යුතුය.

(iii) (අ) ඔවුන් තම ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයයෙන් ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) ආධුනික/පරීක්ෂා කාලය ගෙවී අවසන් වූ විට සේවයෙහි ස්ථිර කරන්නේ වෙනත් කරුණු අතර කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වය තෙක් වර්ග කර ඇති සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් ඔවුන් නියමිත කාලසීමා ඇතුළත සමත් විම ලබය. නියමිත කාලසීමාව ඇතුළත මෙම ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වීමට අපොහොසත් වුවහොත් ඒවා සමත්වන තෙක්, ලැබිය යුතු පඩි වැඩිවීම් නොගෙවා හැරීම එහි ප්‍රතිඵලය වන්නේ ය. තම ආධුනික/පරීක්ෂා කාලය කෙළවර වන විට කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ විභාගයෙන් සමත් නොවන යම් නිලධාරියෙක් වේ නම් ඔහුගේ සේවය කෙළවර කළ හැකි වන්නේ ය.

සංලක්ෂ්‍යය.—සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා රාජ්‍ය සේවයට බැඳෙන අය සේවයෙහි ස්ථිර කිරීමට පෙර සිංහල ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත්වීමේ නියමයෙන් නිදහස් වෙති.

(iv) මෙම ධුරයෙහි සේවය ස්ථිර කරන දින සිට අවුරුදු දෙකක් ඇතුළත සිංහල භාෂාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකින් සමත් වීමටද ඔවුන්ට නියම වනු ඇත.

5. අවශ්‍ය සුදුසුකම්.—(i) තමා ලාංකිකයකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුතුය. "ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අවම අධ්‍යාපනික සුදුසුකම ලෙස නියමකොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු



ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය

7. අයදුම්පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ඇරඹුමේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්පත් ලැබුණු බව දන්වනු ඇත. අයදුම්පත භාරගන්නා අවසාන දිනයේ සිට සත් දිනක් ඇතුළත තම අයදුම් පත ලැබුණු බව දන්වන ලිපියක් නොලත් අයදුම්කරුවකු වේත් නම්, වහාම ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවකු මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම්පත සලකා බලනුවස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1965 අගෝස්තු මස 30 වැනි දින,
කොළඹ 1,
ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදී ය,
තැ. පෙ. 500.

9-174/1—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

අංක : ඒ.ඒ. 45/එක්ස් 1574/65.

## කොළඹ වරාය කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ පොල් තෙල් යන්ත්‍රස්ථානයේ ෆෝර්මන් තනතුර

කොළඹ වරාය කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ පොල් තෙල් යන්ත්‍රස්ථානයේ ෆෝර්මන් තනතුර සඳහා අයදුම්පත් එවන ලෙස ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මඟින් සපයනු ලබන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි පිළියෙළ කරන ලද ඉල්ලුම් පත් පහත සඳහන් දිනයන්ට හෝ ඊට පෙර මා වෙත ලැබෙන්නට එවිය යුතුය :—

(අ) මෙරට අයදුම්පත්—1965. 9. 17 දින.

(ආ) විදේශිය අයදුම්පත් 1965. 9. 24 දින.

**සටහන්.—**

(i) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලෙන් නැති වුන බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයිතිකරුවන් විසින්ම විඳ දරාගත යුතුවේ.

(ii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝර්ම විදේශවල සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. එම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචිව හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව තුළදී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iii) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික අපේක්ෂකයන් ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය වර්ෂයකට රුපියල් 5,160 පටන්ගෙන රුපියල් 360 වාර්ෂික වැඩිවීම් වලින් රු. 8,400 දක්වා වේ.

3. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.—**

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම දෙනු ලබන්නේ මූලික වශයෙන් තුන් අවුරුදු ප්‍රවාසන කාලයකට යටත් කොටය.

(ii) තෝරාපත් කර ගනු ලබන අයදුම්කරුට කෙටි දැනුම්දීමකින් තනතුර භාර ගැනීමට සිදුවනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම ඔහුට පහත සඳහන් සුදුසුකම් හිමි බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ :—

(i) 1965.9.17 වැනි දිනට වයස අවුරුදු 25 ට නොඅඩු සහ 45 ට නොවැඩි බව,

(ii) යහපත් චරිතයක් සහ සෞඛ්‍ය තත්ත්වයක් ඇති බව,

(iii) (අ) විශාල යන්ත්‍රස්ථානයක් පාලනය කිරීම පිළිබඳ පළපුරුද්ද සහිත රජයේ දෙපාර්තමේන්තුවක පළමුවෙනි ශ්‍රේණියේ යාන්ත්‍රික ෆෝර්මන් වරයෙක් බව, තොග තෙල් යන්ත්‍රස්ථානයක් ක්‍රියා කරවීම් සහ නඩත්තුව පිළිබඳ වානිජ පළපුරුද්ද ඇත්තන්ට විශේෂ සැලකිල්ල දක්වනු ලැබේ.
**හෝ**

(ආ) විශාල යන්ත්‍රස්ථානයක් පාලනය පිළිබඳ පළපුරුද්ද සහිත දෙවැනි ශ්‍රේණියේ යාන්ත්‍රික ෆෝර්මන් වරයෙකු ලෙස අවුරුදු 7ක් සේවය ඇති බව, තොග තෙල් යන්ත්‍රස්ථානයක ක්‍රියා කරවීම සහ නඩත්තුව පිළිබඳ වාණිජ පළපුරුද්ද ඇත්තන්ට විශේෂ සැලකිලි දක්වනු ලැබේ. **හෝ**

(ඇ) පහත සඳහන් කොන්දේසි සපුරාලමින් රජයේ දෙපාර්තමේන්තුවක පළපුරුද්ද ඇති බව :—

(i) භෞතික විද්‍යාව හා ගණිතය සමග ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත් වී ඇති බව.

(ii) පිළිගත් කර්මාන්ත ශාලාවක පස් අවුරුදු ආධුනිකත්වයක් සාර්ථක ලෙස නිමකර ආධුනිකත්වය අවසානයේදී පරීක්ෂණයෙන් සමත් වූ බව.

(iii) ලංකා කාර්මික විද්‍යාලයෙහි තුන් අවුරුදු යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය පිළිබඳ පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කළ බව.

(iv) II වැනි ශ්‍රේණියේ යාන්ත්‍රික ෆෝර්මන්වරයෙකු වශයෙන් උසස් කිරීමට පෙර පළමුවැනි ශ්‍රේණියේ සුළු පරිපාලක තනතුරක සේවය කර ඇති බව.

(v) II වැනි ශ්‍රේණියේ යාන්ත්‍රික ෆෝර්මන්වරයෙකු වශයෙන් අවුරුදු 5 ක (පහක) පළපුරුද්ද ඇති බව.

(vi) විශාල යන්ත්‍රස්ථානයක් පාලනය පිළිබඳ පළපුරුද්ද තිබීම, තොග තෙල් යන්ත්‍රස්ථානයක් ක්‍රියා කරවීම සහ නඩත්තුව පිළිබඳ වානිජ පළපුරුද්ද ඇත්තන්ට විශේෂ සැලකිල්ල දක්වනු ලැබේ.

**එසේ නැත්නම්.—**

(ඈ) **රජයේ සේවය නොවන අයට.**—කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ සමාන විභාගයකින් සමත් වී ඉන් අනතුරුව, ආධුනිකත්වය නිමකර ඊට අනතුරුව ඉංජිනේරු කර්මාන්ත ශාලාවක යාන්ත්‍රික ෆෝර්මන් ශ්‍රේණියක 15 අවුරුද්දක් සේවය කර තිබීම. විශාල යන්ත්‍රස්ථානයක් පිළිබඳ පළපුරුද්ද තිබීම. තොග තෙල් යන්ත්‍රස්ථානයක් ක්‍රියාකරවීම සහ නඩත්තුව පිළිබඳ වාණිජ පළපුරුද්ද ඇත්තන්ට විශේෂ සැලකිලි දක්වනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙක්ම සූදානම් විය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය (සැලකිය යුතුයි.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකාර පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ);

(ආ) උපාධිය හෝ උසස්ම අධ්‍යාපනික සහතික.

(ඇ) චරිත සහතික දෙකක්, මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් ලබාගත්තක් විය යුතුය.

(ඉ) ලබා ඇති වෘත්තිය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඊ) සිංහල විෂයයෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

**සැලකිය යුතුයි.—**

(i) අයදුම්පතට ලියවිලි හෝ ඒවායේ පිටපත් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් තම ඉල්ලුම් පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේ වුවත්, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට පළමු ඔහු වෙත ලැබෙන පරිදි ඉල්ලුම් පත්‍රයේ අනුපිටපතක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත කෙලින්ම ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්පත සහ ඒ සම්බන්ධ අනික් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන වෙත මිස මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු ඇත. අයදුම්පත් භාර ගන්නා අන්තිම දිනයේ සිට සත් දිනක් ඇතුළත තම අයදුම්පත් ලැබුණු බව දන්වන ලිපියක් නොලත් අයදුම්කරුවෙකු වේ නම් වහාම ඒ බව රාජ්‍යසේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙකු මේ අවශ්‍යතාවය පැහැර හැරියහොත් තම අයදුම්පත්‍රය සලකා බලනු මෙන් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමිවනු ඇත.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1965 අගෝස්තු මස 30 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දිය,
තැ. පෙ. 500.

9-174/2—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

අංක : ඒඒ. 2/එක්ස්. 1575/65.

## කොළඹ වරාය කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

### යාත්‍රාපති තනතුර

කොළඹ වරාය කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු තැනගේ අංශයේ යාත්‍රාපති තනතුර සඳහා ඉල්ලුම්පත් එවන ලෙස ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම්පත් පහත සඳහන් දිනයන්ට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(i) මෙරට අයදුම්පත්—1965.9.17 වැනිදා.

(ii) විදේශීය අයදුම්පත්—1965.9.24 වැනිදා.

සටහන්.—

(i) ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාදවූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(ii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝරම විදේශයන්හි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාල වලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම්පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම රටට හෝ පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළතදී භාරදීමට අයදුම්කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන.

(iii) වෛද්‍ය පරීක්ෂණය සහ නැව් ගාස්තු.—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන් ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුය.

2. සේවයේ නියුක්ත කරවීමේ විගන්ති සහ කොන්දේසි.—

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය,

(ii) තෝරාගනු ලබන අයදුම්කරුට කෙටි කාලීන දැනුම්දීමකින් වුවද තනතුර භාරගැනීම අවශ්‍ය වනු ඇත.

3. වැටුප් ක්‍රමය.—මේම තනතුරට අයත් වන්නේ රු. 4,080 වාර්ෂික වැටුපෙන් පටන්ගෙන රු. 180 වාර්ෂික වැඩිවීම් 7 කින් වර්ෂයකට රු. 5,340 දක්වා නගින වැටුප් ක්‍රමයකි.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවෙක්ම තමා—

(අ) 1965.9.17 වැනි දිනට වයස අවුරුදු 30කට නොඅඩු හා අවුරුදු 45කට නොවැඩි බවට,

(ආ) වෙරළබඩ සේවයේ (කෝස්ට් වයිස් වරෙඩ්) හෝ ඒ සමාන වෙනත් සේවයක යාත්‍රාපති වශයෙන් ප්‍රවීණතාව පිළිබඳ සහතිකයක් දරන බවට, (මීට අතිරේකව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍රය හෝ ඒ සමාන වෙනත් සහතිකයක් හෝ තිබේ නම් වැඩි සැලකිල්ලක් දක්වනු ඇත), සහ

(ඇ) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙකින් යුක්ත බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

5. පහත සඳහන් ලියකියවිලි වලින් එකක් හෝ සියල්ල අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට සෑම අයදුම්කරුවෙක්ම සූදානම් විය යුතුය :—

(i) උප්පැන්න සහතිකපත්‍රය (සැ. යු.—බව්තීස්ම සහතික පත්‍රය හෝ උපකාත පාසැල් පිළිබඳ රෙගුලාසි සංග්‍රහයේ කටයුතු සඳහා නිකුත් කරන ලද සහතිකපත්‍රය භාරගනු නොලැබේ).

(ii) උපාධිය හෝ උසස්ම අධ්‍යාපනික සහතිකපත්‍රය.

(iii) චරිත සහතික දෙකක් (මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගෙන් හෝ විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුයි).

(iv) වෘත්තීය/කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(v) සිංහලෙන් සමත්වී ඇති උසස්ම පරීක්ෂණය පිළිබඳ සහතික පත්‍රය.

සැලකිය යුතුයි :—

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුයි ;

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයදුම්පත සලකා බලනු නොලැබේ.

6. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් තම ඉල්ලුම්පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේ කළද වුවත්, ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට පළමු ඔහු වෙත ලැබෙන පරිදි ඉල්ලුම්පත්‍රයේ අත්පිටපතක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත කෙළින්ම ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරවනු ලැබේ.

9. අයදුම්පත් ලැබුණු බව දන්වනු ඇත. සත් දිනක් ඇතුළත තම අයදුම්පත ලැබුණු බව දන්වන ලිපියක් නොලත් අයදුම්කරුවකු වෙතොත් වහාම ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දන්විය යුතුයි. කිසියම් අපේක්ෂකයෙකු මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම්පත්‍රය සලකා බලනුවස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1965 අගෝස්තු මස 30 දින,
කොළඹ 1; ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදිය,
තැ. පෙ. 500.

9-174/3—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

අංක : ඒබී. 28/එක්ස්. 1576/65.

## අල්ලස් කොමසාරිස් තැනගේ දෙපාර්තමේන්තුව

### නීති නිලධාරි තනතුර

අල්ලස් කොමසාරිස් තැනගේ දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි තනතුරක් සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම්පත් අයදුම්කරුගේ අත් අකුරින්ම පුරවා පහත සඳහන් දිනයට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(අ) මෙරට අයදුම්පත්‍ර—1965.9.17 වැනිදා.

(ආ) විදේශීය අයදුම්පත්‍ර—1965.9.24 වැනිදා.

සටහන්.—

(i) ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාදවූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදු වියහැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(ii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝරම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. තම ඉල්ලුම්පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට

(ආ) උපාධිය හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය ;

(ඇ) චරිත සහතික දෙකක්. මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගේ හෝ විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය ;

(ඉ) වෘත්තිය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික ;

(ඊ) සිංහල විෂයයෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

සැලකිය යුතුයි.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිනිය යුතුයි.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් තම ඉල්ලුම්පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේ වුවත්, ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට පළමු ඔහු වෙත ලැබෙන පරිදි ඉල්ලුම්පත්‍රයේ අනුපිටපතක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත කෙලින්ම ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II) වෙනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය තනතුරු වලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්පත් ලැබුණු බව දන්වනු ඇත. සත් දිනක් ඇතුළත තම අයදුම්පත් ලැබුණු බව දන්වන ලිපියක් නොලත් අයදුම්කරුවෙකු වෙත්නම් වහාම ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙකු මේ අවශ්‍යතාවය ඉහැර හැරියොත් තම අයදුම්පත සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ල,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය,
තැපැල් පෙට්ටිය 500,
කොළඹ 1.
1965 අගෝස්තු මස 30 වැනි දින දීය.

9-174,5—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

අංක: ඒඒ. 37/එක්ස්. 1578/65.

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### හාල් මෝල් ඉංජිනේරු තනතුර

ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ හාල් මෝල් ඉංජිනේරු තනතුරක් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මේ කාර්යාලයෙන් සැපයෙන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි විය යුතු අයදුම්පත් පහත දැක්වෙන දිනයන්හි හෝ ඉන්පෙර මා වෙත ලැබිය යුතුයි.—

(අ) මෙරට අයදුම්පත් : 1965.9.17 වැනිදා.

(ආ) පිටරට අයදුම්පත් : 1965.9.24 වැනිදා.

සටහන :

(i) අයදුම්පතක් හෝ එවැන්නක් පිළිබඳ ලිපියක් හෝ තැපැලේදී නැතිවීමක් හෝ පමාවීමක් හෝ ගැන කරන කිසිම චෝදනාවක් පිළිබඳව සලකා බැලිය නොහැක. අවසාන දිනය දක්වා සිය අයදුම් පත් එවීම පමා කරන අයදුම්කරුවන් ඉන් විය හැකි පාඩුව තමන් විසින් ම විඳ දරාගත යුතු වන්නේය.

(ii) පිටරට අයදුම්කරුවන් හට මුද්‍රිත ආකෘතිපත්‍ර ඒරට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයෙන් ලබාගත හැකිය. කැමැති නම් සිය අයදුම්පත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නව හෝ රටට පත් කර සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී බාරදීම වුවද ඔවුන්ට කළ හැකිය.

(iii) වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු ලක් රජය යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැන ගැනීම පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුයි. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත්, ඔවුන් විසින්ම ගෙවිය යුතු වන්නේය.

2. වැටුප් ක්‍රමය.—මෙම තනතුරට නියමිත වැටුප් ක්‍රමය මෙසේය :—

වර්ෂයකට රු. 4,080—360×12, 480×10—රු.13,200. (රු. 9,360ට හා රු. 11,760ට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇති අතර රු. 11,280දී අවුරුදු දෙකක් යනතුරු වැටුප් වැඩිවීම නවතාලනු ඇත.)

සටහන :

(1) වෘත්තිය සුදුසුකම් රහිත නිලධාරීන් හට පූර්වෝක්ත වැටුප් ක්‍රමයෙහි රු. 8,880 වැටුප ඉක්මවිය නොහැක.

(2) සම්පූර්ණ වෘත්තිය සුදුසුකම් ඇති අයදුම්කරුවෙකුට පූර්වෝක්ත වැටුප් ක්‍රමයෙහි වර්ෂයකට රු. 5,880 ක ආරම්භක වැටුපක් හිමිවනු ඇත.

3. සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.—මේ තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

4. සුදුසුකම්.— අයදුම්කරුවන් 1965 සැප්තැම්බර් මස 17 වැනි දිනට වයස අවුරුදු 21 ට නො අඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතු අතර, පහත සඳහන් සුදුසුකම් ඔහුට තිබෙන බවට සතුටුදායක සාක්ෂි සෑම අයදුම්කරුවෙකු විසින් ම ඉදිරිපත් කළ යුතු ය:—

(අ) (ලන්ඩන්හි) යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයේ සහවර සාමාජිකත්වය හෝ (ලන්ඩන්හි) විදුලි ඉංජිනේරු ආයතනයේ සහවර සාමාජිකත්වය හෝ,

(ආ) යාන්ත්‍රික ඉංජිනේරු විෂය හෝ විදුලි ඉංජිනේරු විෂය පිළිබඳව පිළිගත් විශ්ව විද්‍යාලයයක උපාධියක් හෝ (ලන්ඩන්හි) යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයේ සහවර සාමාජිකත්වයේ 1 වැනි හා 2 වැනි කොටස්වලින් හෝ (ලන්ඩන්හි) විදුලි ඉංජිනේරු අයතනයේ සහවර සාමාජිකත්වයේ 1 වැනි 2 වැනි හා 3 වැනි කොටස්වලින් සාමාර්යක් හෝ එම විභාගවලින් නිදහස් කරනු ලබන වෙනත් විභාගයකින් හෝ සාමාර්ථයක් ලබා තිබීම හෝ,

(ඇ) පිළිගත් යාන්ත්‍රික ඉංජිනේරු කර්මාන්ත ශාලාවක අවුරුදු 5 ක ආධුනික සමයක් සාර්ථක ලෙස සම්පූර්ණකර ඉන්පසුව යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳව විශාල කර්මාන්ත ශාලාවක පරිපාලක තත්ත්වයේ හා කම්කරු පාලනය සහිත තත්ත්වයක අවුරුදු 15 ක අත්දැකීමක් ඇතිව සිටිය යුතු අතර රජයේ වැඩ දෙපාර්තමේන්තුව හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුව දුම්රිය හෝ වෙනත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවක් හෝ මගින් පැවැත්වෙන සහකාර ඉංජිනේරු ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්කරුවන් හට සුදුසුකම් ලබා දෙන දෙපාර්තමේන්තු විභාගයෙන් ද, සමත් වී සිටිය යුතු ය.

(ඈ) විශිෂ්ට චරිතයෙන් හා යහපත් ශරීර සෞඛ්‍යයෙන්ද යුක්ත විය යුතුය.

5. සේවා කොන්දේසි

(i) පත්වීම තුන් අවුරුදු ආධුනික කාලයකට යටත් ය.

(ii) තෝරාගනු ලබන අයදුම්කරුවන් නියම කරනු ලබන විෂයයන් පිළිබඳව දෙපාර්තමේන්තු විභාගයකින්ද සමත්විය යුතු වන්නේය.

6. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් තම ඉල්ලුම් පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේ වුවත්, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට පළමු ඔහු වෙත ලැබෙන පරිදි ඉල්ලුම් පත්‍රයේ අනුපිටපතක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත කෙලින්ම ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්කරුවන් පහත දැක්වෙන ලියකියවිලි එකක් හෝ සියල්ලම දැන්වූ විටක ඉදිරිපත් කළ යුතුයි.:—

(අ) උප්පැන්න ලියාපදිංචි කිරීමේ සහතිකය (සැ.යු.—උපකාත පාඨශාලා සඳහා අධ්‍යාපන රෙගුලාසි පරිදි නිකුත් කෙරෙන උප්පැන්න සහතික හෝ බව්තීස්ම සහතික හෝ පිළිගනු නො ලැබේ.)

(ආ) උපාධි හෝ ඉහළම අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක් ; මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් හෝ විය යුතුය.

(ඈ) ලබා ඇති වෘත්තිය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) සිංහල පිළිබඳව සමත් වී ඇති ඉහළම විභාග සහතිකය.

සටහන.—

(i) කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ අයදුම්පතට නො ඇමිනිය යුතුයි.

(ii) නියමකළ විටකදී ලියකියවිලි ඉදිරිපත් කිරීමට අසමත් වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

8. අයදුම්පත් හෝ ඒ පිළිබඳ වෙනත් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නො එවිය යුතුය.

9. මේ අයදුම් පත්‍රයෙහි I වෙනි කොටසේ (II) වෙනි ඡේදය ආරම්භයෙහි පළකොට ඇති, රාජ්‍ය සේවා තනතුරුවලට කෙරෙන පත්වීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කෙරේ.

10. සියළුම අයදුම්පත් ලැබුණු බව දන්වන අතර, අයදුම්පත් අවසන් කෙරෙන දිනයෙන් සත් දිනක් ඇතුලත එවැනි දැන්වීමක් නොලබන කිසියම් අයදුම්කරුවකු වෙතොත් ඔහු විසින් වහාම ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන වෙත දැන්විය යුතුය. මේ විධිවිධාන අනුව ක්‍රියා නොකරන අයදුම්කරුවන්හට, සිය අයදුම් පත් සලකා බලනු සඳහා ඉල්ලා සිටීමේ අයිතිය අහිමිවනු ඇත.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1965 අගෝස්තු මස 30 වැනි දින,
කොළඹ 1,
ගාළු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය,
තැ. පෙ. 500.

9-174/6—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

## අනියම් ලඝුලේඛක තනතුරු

මෙම දෙපාර්තමේන්තුවේ අනියම් ලඝුලේඛක තනතුරු කිහිපයක් සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

මෙම තනතුරු මුලුමනින්ම අනියම් තනතුරු වේ. පහත දක්වා ඇති ආකෘතියේ විය යුතු අයදුම් පත් 1965 සැප්තැම්බර් මස 10 වෙනි දින හෝ ඊට පෙර හෝ ලැබෙන සේ කොළඹ 2, පහල වැව පාරේ පිහිටි කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු කොමසාරිස් වෙත එවිය යුතුය.

2. අධ්‍යාපනික සුදුසුකම්.—ලඝුලේඛක II ශ්‍රේණිය—කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඒ හා සමාන වෙනත් සහතිකයක් (සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුය).

ලඝුලේඛනයේ වේගය—මිනිත්තුවට වචන 80
යතුරු ලියනයේ වේගය—මිනිත්තුවට වචන 30.

ලඝුලේඛක I ශ්‍රේණිය—කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඒ හා සමාන වෙනත් සහතිකයක්. (සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුය).

ලඝුලේඛනයේ වේගය—මිනිත්තුවට වචන 120.
පිටපත් කිරීමේ වේගය—මිනිත්තුවට වචන 16.

3. ගෙවනු ලබන වැටුප.—

II ශ්‍රේණිය—දිනකට රු. 3.50
I ශ්‍රේණිය—දිනකට රු. 4.25.

රජයේ දීමනා ප්‍රමාණයන් අනුව ජීවන වියදම් දීමනා හා විශේෂ ජීවන දීමනා ද ගෙවනු ලැබේ.

4. සේවා කොන්දේසි.—පත්වීම මුලුමනින්ම අනියම් පදනමක් මත කරනු ලැබේ.

එන්. එල්. අබේවීර,
කම්කරු කොමසාරිස්.

1965 අගෝස්තු මස 28 වන දින,
කොළඹ 3,
පහල වැව පාරේ,
කම්කරු දෙපාර්තමේන්තුවේ දීය.

### අයදුම් පත්‍රයේ ආකෘතිය

#### අනියම් ලඝුලේඛක තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. ස්ථිර ලිපිනය :————.
3. වයස හා උපන් දිනය :————.
4. අධ්‍යාපනික සුදුසුකම් :————.
5. (අ) ලඝුලේඛනයේ වේගය :————.
   (ආ) යතුරු ලියනයේ වේගය :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9-100—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

## රජයේ විදුලි දෙපාර්තමේන්තුව

### කාර්මික සහකාර තනතුරු

රජයේ විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුවේ කාර්මික සහකාර තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වෙන ආකෘතිපත්‍රය අනුව පිළියෙල කරගත් අයදුම්පත් 65.9.25 වැනි දින හෝ ඊට පෙර මට ලැබෙන සේ එවිය යුතුයි.

2. වැටුප් සහ සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.—වර්ෂයකට රු. 1,860—120—රු. 3,780 යන වැටුප් ක්‍රමය මෙම තනතුරට අදාලවේ.

3. මෙම තනතුරු ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම් දෙනු ලබන්නේ අවුරුදු තුනක ආධුනික කාලයකට යටත්වය.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි:—

(i) 65.9.25 වැනි දිනට අවුරුදු 18ට නොඅඩු අවුරුදු 35ට නොවැඩි විය යුතුයි. (දෙපාර්තමේන්තුවේ සේවකයන්ට වයස් සීමාව බලපානු නොලැබේ);

(ii) විශිෂ්ඨ චරිතයක් හා මනා දේහ ලක්ෂණයෙන් යුක්ත බව;

(iii) ලන්ඩන් හෝ ලංකාවේ බී.ඇස්.සී. (ඉංජිනේරු) විභාගයේ I වැනි අවසාන කොටස හෝ ඒ.ඇම්.අයි.ඊ.ඊ. I වැනි කොටස හා II වැනි කොටස හෝ ආදී නීති යටතේ ඒ.ඇම්.අයි.ඊ.ඊ. විභාගයේ "අ" කොටස.

5. දනට රාජ්‍ය සේවාවෙහි නියුක්ත අයදුම්කරුවන්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතුයි. එවැනි අයදුම්පත් නියමිත දිනට පසුව මෙම දෙපාර්තමේන්තුවට ලැබුන හොත්, එම අයදුම්පත් ඒ ඒ අයදුම්කරුවන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත නියමිත දිනට කලින් ලැබුන බව සඳහන් කර එම අයදුම්පත් ප්‍රමාදවීමට සැහෙන හේතුන් දක්වමින් දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් එම අයදුම්පත් භාරගන්නා ලෙසට නිර්දේශ කළ හොත් පමණක් එසේ ප්‍රමාදව ලැබෙන අයදුම්පත් භාරගනු ලැබේ.

6. අයදුම්කරුවන්ට සිය අයදුම්පත්වලට—

(අ) ලබා ඇති උසස්ම අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකපත් :

(ආ) අයදුම්කරුවන්ගේ චරිත හා මෙම තනතුර සඳහා ඇති සුදුසුකම් පිළිබඳව මෑතකදී ලබාගත් සහතිකපත් තුනක (මෙම අනුඡේදය යටතේ දනට රාජ්‍ය සේවයෙහි නියුක්ත අයදුම්කරුවන් සහතික පත් ඉදිරිපත් කිරීම අනවශ්‍යය.) පිටපත් (මුල් සහතික නොවේ.) ඇමිණිය යුතුයි.

7. අයදුම්පත් ගැන හෝ මේ සම්බන්ධ අන් හැම ලිපි ගණුදෙනුවක්ම කළ යුත්තේ වැඩ බලන ප්‍රධාන කළමනාකරු සමග මිස, මෙම දෙපාර්තමේන්තුවේ අන් කිසි නිලධාරියෙකු සමග පුද්ගලිකව නොවේ.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසෙහි (II) වැනි ඡේදයෙහි පටන් ගැන්මෙහි පළකර තිබෙන රාජ්‍ය සේවා තනතුරු සඳහා පත් කිරීම්වලට අදාල පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

ඇස්. ඩබ්ලිව්. පීරිස්,
වැඩ බලන ප්‍රධාන කළමනාකරු.

කොළඹ රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ දීය.

## අයදුම්කිරීමේ ආකෘතිපත්‍රය

**කාර්මික සහකාර තනතුර**

(1) සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

(අ) පෙළපත් නම :————.

(ආ) අනික් නම් :————.

(2) ලිපිනය :————.

(3) (අ) ——වැනි දිනට නියමිත වයස :— අවුරුදු——, මාස——, දින——.

(ආ) උපන් දිනය :————.

(4) පුරවැසි බව සහ එය ලබාගත් අන්දම :————.

(5) පහත සඳහන් අයගේ උපන්ස්ථාන සඳහන් කරන්න :—

(අ) අයදුම්කරුගේ :————.

(ආ) අයදුම්කරුගේ පියාගේ :————.

(ඇ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.

අයදුම්කරු ලංකාවේ උපන්නේ නම් (ආ) හෝ (ඇ) සහ (ඈ) යන දෙකම පිරවිය යුතුයි. අයදුම්කරු ලංකාවේ නොඋපන්නේ නම් (අ) වලට අමතරව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) වෙනම පිරවිය යුතුයි.

(6) අයදුම්කරු විවාහකද, අවිවාහකද හෝ වැන්දඹු භාවය :————. (විවාහක නම් විවාහ වූ දිනය සහ දරුවන් ගණන සඳහන් කරන්න)

(7) (අ) පොදු අධ්‍යාපනය සඳහා :————.

(ආ) වෘත්තීය අධ්‍යාපනය සඳහා :————.

(ඉගෙනීම ලත් පාසැල් හා විද්‍යාල, ඒවාට ඇතුළත් වූ හා අස් වූ දිනයන් සමග.)

(8) අධ්‍යාපන සුදුසුකම් :————.
(ලබා ඇති උපාධි සහ ඒවා ලබාගත් දින, පංතිය සහ ඉදිරිපත්වුණු විෂයයන් සඳහන් කරන්න. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව ලබා ඇති උසස්ම සහතික පත්වල පිටපතක් ඇමිණිය යුතුයි.)

(9) ලබා ඇති වෘත්තීය හා කාර්මික සුදුසුකම් යමක් ඇතොත් දින සමග :————.
(පිළිගත් ආයතනවල සාමාජිකත්වය, ලැබූ ඩිප්ලෝමා හෝ වෙනත් සුදුසුකමක් ඇතොත් ඒවායේ පිටපත් ඇමිණිය යුතුයි.)

(10) පාසැල හෝ විද්‍යාල හැරයාමෙන් පසු කළ රක්ෂා, නියුක්තව සිටි හා හැරගිය දින සමග ලද වැටුප් :————.

(11) විශේෂ අයිතිවාසිකම්, සුදුසුකම්, පුහුණුවීම් හෝ පළපුරුදුකම් :————.

(12) ඔබ ගැන කරුණු දත හැකිමට හැකි අයවලුන් තිදෙනෙකුගේ නම්, ලිපිනය හා නිලතල :————.

(13) චරිත සහතික පත් ඉදිරිපත් කර ඇති සම්භාවනීය පුද්ගලයින් තිදෙනාගේ නම් සහ පදවි නාමයන් :————.
(සහතික පත්වල පිටපත් ඇමිණිය යුතුයි.)

(14) ඔබ ණය ගැති කමින් නිදහස් ද? නොඑසේ නම් කොතෙක් දුරට ණය ගැතිද? :————.

(15) ඔබ සතුව මෝටර් රියක් තිබේද? නැතහොත් මෝටර් බයිසිකලයක් පැදිය හැකිද? :————.

මේ අයදුම් පතෙහි මවිසින් සපයා ඇති කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. තවද, මෙහි අන්තර්ගත කරුණු අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට කලින් දැනගතහොත් මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු කිරීමට හැකි බවත්, පත්කරනු ලැබුවායින් පසු සොයාගතහොත් කිසිම වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකර දැමිය හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන,

දිනය :————.

9-32—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

## ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය

**සහකාර ඉංජිනේරුවෝ (සිවිල් යාන්ත්‍රික හා විදුලි) සහකාර රසඥයෝ**

සුදුසුකම්.—

(අ) සහකාර ඉංජිනේරුවෝ.—පිළිගත් විශ්ව විද්‍යාලයක, බී.එස්.සී (ඉංජිනේරු) උපාධිය හෝ සමාන සුදුසුකම්.

සහකාර රසඥයෝ.—පිළිගත් විශ්ව විද්‍යාලයක, භෞතික විද්‍යාව හෝ ගණිතය උප විෂය සහිතව, රසායන විද්‍යාව පිළිබඳ බී.එස්.සී (විශේෂ) උපාධිය.

පළමුවැනි හා දෙවැනි පන්තියේ ගෞරව උපාධිධාරීන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ආ) ලංකාවේ පුරවැසිකම.

(ඇ) වයස.—අවුරුදු 26න් පහළ.

වැටුප් ක්‍රමය.—

(i) වර්ෂයකට රු. 4,800—360—8,400 මූලික වැටුප. ඉංජිනේරු උපාධිධාරීන්ට මෙම වැටුප් ක්‍රමයේ වර්ෂයකට රු. 5,880ක ආරම්භක වැටුපක්ද, රසායන විද්‍යා උපාධිධාරීන්ට රු. 5,160ක ආරම්භක වැටුපක්ද ගෙවනු ලැබේ.

(ii) පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමෙන් පසු ඔවුන්, වර්ෂයකට රු. 8,400—480 සහ 600—රු. 14,400 මූලික වැටුප් ක්‍රමයේ උචිත වැටුපක් ලැබීමට සුදුස්සන් වනු ඇත.

(iii) සංයුක්ත මණ්ඩලයේ ප්‍රමාණයන්ට අනුව දීමනා ගෙවනු ලැබේ. මෑත දී පැවැත්වුණු විශ්ව විද්‍යාල පරීක්ෂණ ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින අපේක්ෂකයන්ට ද ඉල්ලුම් කළ හැක.

තෝරා ගනු ලැබූ අපේක්ෂකයන්, රජයේ භාෂා ප්‍රතිපත්තිය, විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා දැනට සකස් කර ඇත්තාවූත්, ඉදිරියට පනවනු ලබන්නාවූත්, නීති රීති අනුව ක්‍රියා කළ යුතුය.

නිෂ්පාදනය, සංවර්ධනය, විකුණුම් පර්යේෂණ ආදිය සම්බන්ධයෙන් වූ තනතුරුවලට යෝග්‍යතා ලබා ගත හැකි වන අයුරින්, තෝරා ගනු ලැබූ අපේක්ෂකයන්ට උචිත පරිදි, සැලසුම්, ඉදිකිරීම්, නිර්මාණ, ආකර විද්‍යාව, ලෝහ විද්‍යාව, රසායන ඉංජිනේරු විද්‍යාව, විදුලි බල ජනනය, ඉලෙක්ට්‍රොනික, ව්‍යාපාර පරිපාලන මූල ධර්ම ආදිය පිළිබඳ පුහුණුවක් දෙනු ලැබේ.

හැකි හැම අවස්ථාවක දීම, විදේශීය රජයන් මගින් හා ජාත්‍යන්තර ආයතන මගින් පිරිනැමෙන ශිෂ්‍යත්ව ප්‍රයෝජනයට ගනිමින් විදේශ පුහුණුව සඳහා පහසුකම් සලසනු ඇත.

මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි නියමිත ආකෘති පත්‍රයෙහි ලියන ලද අයදුම්පත්, ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ අතින්, කොළඹ 3, ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලයේ (තැ. පෙ. 1382) කළමනාකාර අධ්‍යක්ෂ වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

අයදුම් පත් බාර ගැනීම 1965 සැප්තැම්බර් 20 වැනි දින අවසන් වෙයි.

පාලන අධ්‍යක්ෂ,
ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය.

1965 අගෝස්තු 27 දින.

9-63—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගුවන් විදුලි හා ප්‍රචාරක දෙපාර්තමේන්තුව

**සහන නිවේදක තනතුර—දෙමළ**

අධිකාල සහන නිවේදක (දෙමළ) තනතුරු සඳහා ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මගින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් අනියම් පදනමක් පිට සේවයට බඳවාගනු ලබන අතර, දිනකට රු. 12 සීමාවට යටත්ව පැයකට රු. 1.75 ගණනේ ගෙවනු ලැබේ. ගමන් ගාස්තු හෝ වෙනත් දීමනා ගෙවනු නොලැබේ. අයදුම්කරුවන් මයික්‍රෆෝන පරීක්ෂණයකට හා සම්මුඛ පරීක්ෂණයකටද පෙනී සිටිය යුතුවේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් ගෙවීම් නොමැති කෙටි කාලීන පුහුණුවක් ලබාගත යුතුයි. පුහුණුවීමෙන් පසුව නිතිපතා රක්ෂාව ලැබෙන බවට සහතිකයක් නොමැත. මෙම සේවයට ඇතුළුකර ගැනීම නිසා මතුවට මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයෙහි ඇතිවන කිසියම් ඇබෑර්තුවක් සඳහා කවර ආකාරයකින් හෝ හිමිකම් නොලැබේ. අධිකාල සහන නිවේදකයින් වශයෙන් සේවය සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් මෙම ආයතනයේ නිත්‍ය සේවකයින් නොවන්නාහ. මෙම දෙපාර්තමේන්තුවේ අනුමත කළ සහන නිවේදක නාම ලේඛනය අනුව වුවමනා අවස්ථාවන්හිදී ඔවුන් සේවයට කැඳවනු ලැබේ.

2 අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 18 ටත් 40 ටත් අතර විය යුතුයි. ඔවුන් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට වඩා උසස් විභාගයකින් හෝ සාමාර්ථය ලබාගත්, නැතහොත් ගුවන්

විදුලි ප්‍රචාරක කටයුතු පිළිබඳ පළපුරුද්දකම් හෝ ඇති අය විය යුතුයි. දෙමළ පිළිබඳ විශේෂ දැනුමක් අවශ්‍යවේ. සිංහල හා ඉංග්‍රීසි පිළිබඳ සැලකිය යුතු දැනීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ. ලංකා ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සේවය කරන යථෝක්ත සුදුසුකම් ඇති නිලධාරීන් වද මෙම තනතුරු සඳහා ඉල්ලුම් කළ හැකි ය. අයදුම්කරුවන් වොරිංටන් චතුරශ්‍රයේ සිට සැතපුම් 6 ක සීමාව තුළ පදිංචි අය විය යුතුය.

3. මේ දැන්වීම සමග ඇති ආදර්ශ ආකෘතියේ ආකාරයට සැපයිය යුතු ඉල්ලුම් පත්‍ර 1965.9.17 වැනි දින නොයික්මවා ලැබෙන පරිදි කොළඹ, ලංකා ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් නමට එවිය යුතුයි. ආකෘති පත්‍ර සපයනු නොලැබේ. ලියුම් කවරයේ වම් කෙළවරේ "සහන නිවේදක—දෙමළ" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුයි.

4. මේ පිළිබඳ ඉල්ලුම් පත්‍ර හෝ වෙනත් ලිපි ආදිය හෝ ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් නමට එවිය යුතු අතර ඒවා මෙම දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නො එවිය යුතුයි.

5. ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ.

වින්සන්ට් පණ්ඩිත,
වැඩබලන ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්.

වන 1965 සැප්තැම්බර් 3 වැනි දින,
කොළඹ 7,
ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ දී ය.

## ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

### සහන නිවේදක තනතුර—දෙමළ

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන් ලියන්න) :———.
   (අ) වාසගම :———.
   (ආ) සෙසු නම් :———.
2. ස්ථිර ලිපිනය :———.
3. (අ) 1965.9.17 වැනි දිනට නියම වයස :
   අවුරුදු :——— මාස :——— දින :———.
   (ආ) උපන් දිනය හා ස්ථානය :———.
   (උප්පැන්න සහතික පිටපත ඇමිණිය යුතුයි)
4. ජාතිය :———.
   ලාංකිකත්වය ලියාපදිංචි කිරීමෙන් ද පෙළපතින් ද යන වග :———.
5. අධ්‍යාපනික සුදුසුකම් :———.
   (සහතික පිටපත් අමුණන්න.)
6. ගුවන් විදුලි ප්‍රචාරක කටයුතු පිළිබඳ පළපුරුද්ද :———.
7. පදිංචි ස්ථානයේ සිට වොරිංටන් චතුරශ්‍රයේ ගුවන් විදුලි කාර්යාලයට ඇති දුර ප්‍රමාණය :———.
8. අමුණා ඇති චරිත සහතික ලබාගත් අයගේ නම් සහ ලිපිනයන් :
   ———.
9. තෝරාගැනීමේදී ප්‍රයෝජනය විය හැකි යම් විශේෂ හිමිකම් හෝ සුදුසුකම් හෝ ඇත් නම් ඒ පිළිබඳ විස්තර :———.
10. රජය යටතේ කිසිවිටෙක සේවය කර ඇත් නම් ඒ කවදා, කොතැනද යන්න :———.
    (එක් එක් දෙපාර්තමේන්තුවේ කළ සේවා කාලයන් දක්විය යුතු ය.)

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

9-110—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

## ගල්ඔය සංවර්ධන මණ්ඩලය

### උඩවලවේ ජලාශ යෝජනා ක්‍රමය

### උපාධිධාරීන් පුහුණුවීමේ තනතුරු

ගණිතය සහතව, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ව්‍යවහාරික ගණිතය භූ ගර්භ විද්‍යාව හෝ භූගෝල විද්‍යාව හෝ යන විෂයයන් අතුරෙන්, විෂය දෙකකින් සමත් ඉංජිනේරු සහායකයන් ලෙස පුහුණු කිරීම සඳහා විද්‍යා උපාධිධාරීන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

තෝරාගත් අයදුම්කරුවන්ට සිද්ධාන්තය පිළිබඳ හය මසක පුහුණුවක් සහ දොළොස් මසක ක්ෂේත්‍ර පුහුණුවක් ද, දෙනු ලැබේ. මෙම කාලය තුළ පළමුවන හය මාසයේදී රු. 200 ක් ද, ඊළඟ දොළොස් මාසයේදී රු. 300 ක් ද, යන මාසික දීමනාවක් මෙම අභ්‍යාසය ලබන්නවුන්ට ගෙවනු ලැබේ. මෙම පාඨමාලාව අවසාන යේදී සාමාර්ථය ලද අයට රු. 3,600—180—රු. 5,400 වාර්ෂික වැටුප් ක්‍රම යටතේ VI වන ශ්‍රේණියේ ක්ෂේත්‍ර නිලධාරීන් ලෙස පත්වීම් දෙනු ලබන අතර, රු. 5,760—240—රු. 7,200 වාර්ෂික වැටුප් ක්‍රමය යටතේ V වන ශ්‍රේණියේ ඉංජිනේරු සහායකයන් ලෙස උසස් වීමටද අවස්ථාව ලැබෙනවා ඇත. මීට අමතරව රජයේ නියමිත ක්‍රමයට අනුව වෙනත් දීමනා ගෙවනු ලැබේ.

පුහුණුවන්නන්ද ඉංජිනේරුවන් ලෙස මණ්ඩලයේ සේවයට උසස් වීමට හිමිකම් ලබාදෙන ඒ. ඇම්. අයි. සී. ඊ. වැනි ඉංජිනේරු උපාධි ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථා තිබේ.

ඉල්ලුම් පත්‍ර පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සකස් කර ඇඹිලිපිටියේ උඩවලවේ යෝජනා ක්‍රමයේ සාමාන්‍යාධිකාරී වෙත 1965 සැප්තැම්බර් මස 15 වැනි දින හෝ ඊට කලින් ලැබෙන සේ එවිය යුතුය.

සාමාන්‍යාධිකාරී,
උඩවලවේ ජලාශ යෝජනා ක්‍රමය,
ගල්ඔය සංවර්ධන මණ්ඩලය.

ඇඹිලිපිටිය,
1965. 8. 25.

### ගල්ඔය සංවර්ධන මණ්ඩලය—උඩවලවේ බහුකාර්ය ජලාශ යෝජනා ක්‍රමය

### සේවයට බඳවා ගැනීමේ ආකෘති පත්‍රය

1. ඉල්ලුම් කරන තනතුර :———.
2. සම්පූර්ණ නම (වාසගම මුලින් සඳහන් කළ යුතුයි) :———.
3. ජාතිය :———.
4. ලිපිනය :———.
5. අයදුම්කරු උපන් දිනය හා වයස :———.
6. අධ්‍යාපනය ලැබූ ස්ථානය සහ පාඨශාලාවෙන් හෝ විද්‍යාලයෙන් අස්වූ පිළිවෙළට, දින සඳහන් කළ යුතුයි :———.
7. අධ්‍යාපනික සුදුසුකම් :———.
   (සමත් වී ඇති උසස්ම විභාගය හා විෂයයන් සඳහන් කරන්න.)
8. වෙනත් කරුණු :———.

ඉහත සඳහන් විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, (අ) යම් හෙයකින් මෙහි යම්කිසි වරදක් තිබෙන බව තෝරා ගැනීමේ විභාගයට පෙර දැනගන්නට ලැබුනොත් එය නුසුදුසුකමක් ලෙස සලකන බවත් (ආ) තෝරා ගැනීමෙන් පසු එවැනි වරදක් දැනගන්ට ලැබුණොත් කලින් දැන්වීමක් නොමැතිව වහාම සේවයෙන් පහකරන බවත් මා දන්නා බව මින් සහතික කරමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

9-165—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

### පුරප්පාඩු

මණ්ඩලීය සංවිධානයේ සිවිල් ඉංජිනේරු කොට්ඨාශයේ පහත සඳහන් තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර එවන මෙන් ලංකාවේ පුරවැසියන්ගෙන් මෙයින් ආරාධනය කරනු ලැබේ.

(අ) 2 වෙනි ශ්‍රේණියේ සහකාර විදුලි ඉංජිනේරු තනතුර.

(ආ) 3 වෙනි ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර (විදුලි) තනතුර

2. පඩි ක්‍රමයන් (සියළු දීමනා ඇතුළුව) මසක :

(අ) 2 වෙනි ශ්‍රේණියේ සහකාර විදුලි ඉංජිනේරු තනතුර—
රු. 600 — 40 × 10 — රු. 1,000

(ආ) 3 වෙනි ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර (විදුලි) තනතුර—
රු. 510 — 20 × 5 හා 25 × 8 — රු. 800.
රු. 625ට හා රු. 750ට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම්.

සැ. යු.—තෝරාගනු ලබන අපේක්ෂකයින් ඔවුන්ට ඇති සුදුසුකම් හා පළපුරුද්ද අනුව යථෝක්ත පඩික්‍රමවල සුදුසු පියවරවල තැබිය හැකිය.

3. සුදුසුකම්:

(අ) 2 වෙනි ශ්‍රේණියේ සහකාර විදුලි ඉංජිනේරු තනතුර—

(i) වයස.—1965.8.1 වෙනිදට අවුරුදු 25 කට නොඅඩු අවුරුදු 45කට නොවැඩි විය යුතුයි :

(ii) (අ) පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු උපාධියක් හෝ එංගලන්තයේ විදුලි ඉංජිනේරු සමිතියේ විභාගයේ කොටස 1 සහ 2න් සමත්වීම ; හෝ

11. පාසැලින් අස්වූවාට පසුව කළ රැකියාවන් :————.
12. දැන් දරණ තනතුර හා පඩිය :————.
13. තොරතුරු සොයා ගත හැකි අයගේ නම් හා ලිපිනයන් :—
    1. ————.
    2. ————.
    3. ————.
14. සහතික නිකුත් කරනු ලැබූ අයගේ නම් :—
    1. ————.
    2. ————.
    3. ————.
15. මීට පෙර ලං. ග. ම.යේ යම්කිසි තනතුරක් සඳහා ඉල්ලුම් කළේ ද ?
    එසේ නම් එහි ප්‍රතිඵල :————.
16. තමා උසාවියක දී දඩ මිනල් වරදකට වරදකරුවෙකු වී සිටියේ ද? එසේ නම් විස්තර දක්වන්න :————.

මා මෙහි සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මින් සහතික කරමි. යම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව තෝරා ගැනීමට කලින් සොයා ගත හොත්, එයින් මා නුසුදුස්සෙකු විය හැකි බව හා තෝරා ගැනීමෙන් පසුව සොයා ගතහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකර දමනු හැකි බව මා දන්නා බවත් මෙයින් ප්‍රකාශ කරමි

————.

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9-191—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

අංකය : 1/23/8/11/(ජී)

## භාෂණ පරිවර්තකයින් සඳහා විභාගය—1965 නොවැම්බර්

**විභාග දිනය :**

භාෂණ පරිවර්තකයින් වශයෙන් පත්වීම සඳහා සුදුසුකම් ලැබීමට කැමැති සාමාන්‍ය ලිපිකාර සේවයේ නිලධාරීන් සඳහා විභාගයක්, විභාග කොමසාරිස්වරයා විසින් 1965 නොවැම්බර් 6 වැනි දින සිට කොළඹ දී පවත්වනු ලැබේ.

**2. සුදුසුකම් :**

උසාවිවල භාෂණ පරිවර්තකයින් වශයෙන් පත්වීම් දරණ සාමාන්‍ය ලිපිකාර සේවයේ නිලධාරීන්, විධායක ලිපිකරු පංතියේ II වැනි ශ්‍රේණියේ නිලධාරීන් සහ ස්වකීය තනතුරුවල ස්ථිර කරනු ලැබ ඇති භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේ පාලනය යටතේ පවත්නා සාමාන්‍ය ලිපිකරු සේවයේ සාමාන්‍ය ලිපිකරු පංතියේ නිලධාරීන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සන් වේ.

**3. ඉල්ලුම් පත් :**

(i) මේ විභාගයට ඇතුළත් වීමේ ආදර්ශ ෆෝරමයක් මේ නිවේදනයට යාකොට ඇත. අයදුම්කරුවන් විසින් බැග ප්‍රමාණයේ ෆුල්ස්කැප් කඩදාසියක තම අයදුම්පත් පිළියෙල කළ යුතු ය. (මේ සඳහා වෙන අන් ප්‍රමාණයක කඩදාසි පාවිච්චි නො කළ යුතු යි.)

(ii) අයදුම්පත් නිවැරදිව ද, පැහැදිළිව ද, අපේක්ෂකයාගේ අත් අකුරින් ම සම්පූර්ණ කොට 1965 සැප්තැම්බර් මස 24 වැනි දා හෝ ඊට කලින් හෝ විභාග කොමසාරිස් වෙත ලැබෙන ලෙස, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙන්, ලියාපදිංචි කල තැපෑලෙන් යැවිය යුතු ය. අයදුම්පත් ෆෝරමයේ අගට යොදා ඇති අන්දමේ සහතිකයක් දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් දිය යුතු ය. නියමිත දිනයට පසුව ලැබෙන කවර අයදුම්පතක් හෝ ප්‍රතික්ෂෙප කරනු ලැබේ. ෆෝරමය බහා එවන ලියුම් කවරය මුදුනේ වම් කෙළවරෙහි, විභාගයේ නම පැහැදිලි ව ලිවිය යුතු ය. මේ ක්‍රියාපිළිවෙල අනුගමනය නො කරන සියලු ම අපේක්ෂකයන් ගේ අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

(iii) 1965 සැප්තැම්බර් 24 වැනි දිනයට හෝ ඊට පෙර හෝ විභාග කොමසාරිස් වෙත ලැබෙන පරිදි යවන්නට කියන ඉල්ලීම කුත් සමග ස්වකීය අයදුම් පත් තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් වෙත කල් ඇතිව ඉදිරිපත් කරන මෙන් අයදුම්කරුවන්ට දන්වා සිටිනු ලැබේ.

**4. නිවාඩු බවා සහ ගමන් වියදම් :**

විභාග කොමසාරිස් විසින් පිළිගත් ඉල්ලුම් පත්‍ර යවන ලද නිලධාරීන්ට, එම පරීක්ෂණයට පෙනී සිටීම පිණිස, එම දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින් රාජකාරි නිවාඩු දිය යුතුය.

පරීක්ෂණයේ දී පහත සඳහන් අඩු ම ලකුණු ප්‍රමාණයන් ලබා ගන්නා පිට පළාත්වල අයදුම්කරුවන්ට බවා සහ ගමන් වියදම් ගෙවනු ලැබේ :—

ඉංග්‍රීසි භාෂාවෙන් සියයට 30 ක්,
සිංහල භාෂාවේ මුළු ලකුණු ගණනින් සියයට 30 ක්,
දෙමළ භාෂාවේ මුළු ලකුණු ගණනින් සියයට 30 ක්.

5. විභාග පරිපාටිය.—පරීක්ෂණයේ විෂයයන් සහ එම විෂයයන් ගේ නිර්දේශ පත්‍රිකා පහත දැක්වේ :—

(අ—විෂයය)—ඉංග්‍රීසි භාෂාව.—(පැය දෙකක කාලයකට සීමා වූ ප්‍රශ්න පත්‍රයකි.) අයදුම්කරුවන්ගේ පහත සඳහන් සමත් කම් පරීක්ෂා කර බලනු පිණිස ප්‍රශ්න දෙනු ලැබේ :—

(අ) ප්‍රකාශ කිරීමේ ශක්තිය ;

(ආ) සාමාන්‍ය දුෂ්කරතාවන් ඇති වාක්‍ය ඛණ්ඩයන්ගේ අවබෝධය (මෙම ඡේදයන් ප්‍රවෘත්ති පත්‍ර, කාර්යාලයීය ප්‍රකාශන හෝ වර්තමාන කර්තෘවරුන්ගේ ග්‍රන්ථයන්ගෙන් උපුටාගනු ඇත.) ; සහ

(ඇ) භාෂා සම්ප්‍රදාය සහ වචන මාලාව පිළිබඳ දැනුම.

(ආ—විෂයය)—සිංහල භාෂාව.—මෙම විෂයයට ලිඛිත ප්‍රශ්න පත්‍ර දෙකක් සහ වාචක පරීක්ෂණයක් ද අයත් වේ :—

(අ) සිංහල භාෂාව I (සිංහලෙන් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම—කාලසීමාව පැය 1½) අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන දේ ඉංග්‍රීසියට පරිවර්තනය කළ යුතු ය :—

(i) ප්‍රවෘත්ති පත්‍රයකින් හෝ වර්තමාන ගද්‍ය ග්‍රන්ථයකින් උපුටාගත් කොටසක් ;

(ii) සාමාන්‍ය දුෂ්කරතාවයෙන් යුතු ලියමනක්, පෙත්සමක්, ඔප්පුවක් හෝ වාර්තාවක්.

වාක් සම්ප්‍රදායානුකූල යෙදීම් නිවැරදි ව සම්ප්‍රදායානුකූල ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම සම්බන්ධයෙන් අයදුම් කරුවාට ඇති දක්ෂකම පරීක්ෂා කිරීමට ප්‍රශ්න දෙනු ලැබේ. පරිවර්තනය කිරීම සඳහා වූ ඡේද, අත් පිටපත් මගින් දෙනු ලැබේ.

(ආ) සිංහල භාෂාව II ඉංග්‍රීසියෙන් සිංහලට පරිවර්තනය කිරීම, කාලසීමාව පැය 1 1/2 යි) පහත සඳහන් එකක් හෝ ඊට වැඩි ගණනක් අයදුම්කරුවන් විසින් පරිවර්තනය කළ යුතු ය :—

මහේස්ත්‍රාත් උසාවියක හෝ දිස්ත්‍රික් උසාවියක විභාග වූ නඩුවක තීන්දුව, ආඥාපනතකින්, අතුරු නීතියකින්, ගැසට් නිවේදනයකින්, හැන්සාඩ් වාර්තාවකින් හෝ වෙනත් ආණ්ඩුවේ ප්‍රකාශයකින් උපුටා ගත් කොටසක් අයදුම්කරුවන් විසින් ඉංග්‍රීසි වාක් සම්ප්‍රදායානුකූල ඡේදයන් පරිවර්තනය කිරීම ද අවශ්‍ය වන්නේ ය.

(ඇ) වාචක පරීක්ෂණ.—මෙහි දී පහත දැක්වෙන දේවලට අවධානය යොමු කරවනු ලැබේ. ව්‍යවහාරයෙහි ඇති සාමාන්‍ය පාරිභාෂිත පද පරිවර්තනය කිරීම, සිංහලෙන් අදහස් ප්‍රකාශ කිරීමේ ඇති පහසුකම්, සිංහලෙන් සහ ඉංග්‍රීසියෙන් වාක් සම්ප්‍රදායානුකූල ඡේදයන් උච්චාරණය කිරීම සහ ඒ පිළිබඳ දැනීම.

කලින් සූදානමක් නැතිව, ප්‍රථම වතාවට දෙන ලද, ඉංග්‍රීසි ලිපියක, වාර්තාවක හෝ වෙනත් කාර්යාලයීය ලිපි කඩදාසියක පරිවර්තන යක්, කට වචනයෙන් දීමට අයදුම්කරුවන්ගෙන් බලාපොරොත්තු වනු ලැබේ.

(ඇ—විෂයය)—දෙමළ භාෂාව.—මෙම විෂයයට ලිඛිත ප්‍රශ්න පත්‍ර දෙකක් සහ වාචික පරීක්ෂණයක් ද අයත් වේ.

(අ) දෙමළ භාෂාව I (දෙමළ භාෂාවෙන් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම—කාලසීමාව පැය 1½) ;

(ආ) දෙමළ භාෂාව II (ඉංග්‍රීසි භාෂාවෙන් දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම—කාලසීමාව පැය 1½ යි) ;

(ඇ) වාචික පරීක්ෂණය.—දෙමළ භාෂාව I, දෙමළ භාෂාව II සහ දෙමළ වාචික පරීක්ෂණය සඳහා වූ නිර්දේශ පත්‍රිකා, සිංහල භාෂාව I, සිංහල භාෂාව II සහ සිංහල වාචික පරීක්ෂණය සඳහා වූ නිර්දේශ පත්‍රිකා මෙනි.

6. පරීක්ෂණයෙන් සාමාර්ථ්‍යයක් ලබා ගැනීමට, අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන අන්දමින් ලකුණු ලබාගත යුතු ය :—

| | |
|---|---|
| ඉංග්‍රීසි භාෂාවෙන් සියයට | ... 40 ක් |
| සිංහල භාෂාවේ ලකුණුවල මුළු ගණනින් සියයට | ... 40 ක් |
| දෙමළ භාෂාවේ ලකුණුවල මුළු ගණනින් සියයට | ... 40 ක් |

7. අ, ආ සහ ඇ යන විෂයයන්ගෙන් විෂයයන් දෙකකින් සාමාර්ථ්‍ය ලබන අයදුම්කරුවන්ට, ඔවුන් විසින් සාමාර්ථ්‍යය ලබන ලද එක් එක් විෂයයේ ලකුණුවල මුළු ගණනින් සියයට 50 ක් ලබා තිබුණ හොත් තුන්වෙනි විෂයය එම විභාගය පවත්වන ඊළඟ අවස්ථාවේ දී පමණක් ගැනීමට අවසර දෙනු ලැබේ.

8. පරීක්ෂණය පැවැත්වීම සඳහා විභාග කොමසාරිස් විසින් නියම කර ඇති නීති සහ රෙගුලාසිවලින් අයදුම්කරුවන් බැඳී සිටිනු ඇත.

9. දීමනා :

සාමාන්‍ය ලිපිකරු සේවයේ නිලධාරීන්ට (විශේෂ ශ්‍රේණියේ සාමාජිකයින් හැරෙන්නට) පහත දැක්වෙන කොන්දේසි යටතේ රුපියල් 20 ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ :—

(i) නිලධාරියා භාෂා පරිවර්තකයකු වශයෙන් සේවයේ යෙදී සිටිය යුතු ය. උසාවිවල අතිරේක භාෂණ පරිවර්තකයින් මෙන් සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ට දීමනාව හිමි නො වන්නේ ය ;

(ii) නිලධාරියා භාෂණ පරිවර්තකයින් සඳහා වූ පරීක්ෂණයෙන් සමත් විය යුතු වෙයි. දැනට භාෂණ පරිවර්තකයින් වශයෙන් සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ට, එම පරීක්ෂණයෙන් සමත් වන තුරු දීමනාවට හිමිකමක් නො ලැබෙන්නේ ය ;

(iii) තෙමසක කාල සීමාවක් තුළ, මහේස්ත්‍රාත්වරයා, විනිශ්චයකාරතුමා හෝ කොමිසමේ සභාපතිවරයා තෘප්තවන අයුරින් ඔහු උසාවියක, විනිශ්චය සභාවක, පරීක්ෂණ කොමිසමක ආදියෙහි කටයුතුවල දී භාෂණ පරිවර්තකයකු වශයෙන් ක්‍රියා කොට තිබිය යුතුය. මේ කාල සීමාව තුළ දී, ඔහුට දීමනාව ගෙවනු නො ලැබේ. ඔහු භාෂණ පරිවර්තකයින් සඳහා වූ පරීක්ෂණයෙන් සමත් වී තිබුණත්, එම කාල සීමාව තුළ දී මහේස්ත්‍රාත්වරයා විනිශ්චයකාරතුමා, නායකයා හෝ සභාපතිවරයා තෘප්තියට පැමිණවීමට ඔහු අසමත් වුවහොත්, ඒ හේතුවෙන් දීමනා සම්බන්ධයෙන් ඔහුට ඇති හිමිකම් වැළකී යනු ඇත. එමෙන්ම ඔහුගේ එම අසමත්වීම් නිසා, ඔහු අවස්ථාවට සුදුසු පරිදි, සාමාන්‍ය ලිපිකරු සේවයේ වෙනත් තනතුරකට මාරු කරනු ලැබිය හැක. එම නිලධාරියා විසින් මහේස්ත්‍රාත්වරයා, විනිශ්චයකාරතුමා, නායකයා හෝ සභාපතිවරයා තෘප්තියට පත් කරන ලද්දේ නම්, අතීතයට ද බලපාන සේ ඔහුට දීමනාවන් ගෙවනු ලැබිය හැක. එම දීමනාවන් ඔහුට ගෙවනු ලබන්නේ භාෂණ පරිවර්තකයන්ගේ පරීක්ෂණය හෝ එම තනතුරට පත් කරනු ලැබීම යන දෙකින් වඩා මෑතක වූ දෙය සිදු වූ දින සිට ය ;

(iv) භාෂණ පරිවර්තකයින්ගේ පරීක්ෂණයෙන් සමත්ව දීමනාව ලබාගත් නිලධාරියෙක් වෙනත් වැඩකට මාරු කරනු ලැබ, නැවත වරක් භාෂණ පරිවර්තක තනතුරකට මාරු කරන ලද නම්, තව දුරටත් විභාගයක් නො පවත්වා, දීමනාව ගෙවනු ලැබේ. එසේ කරනු ලබන්නේ ඔහු භාෂණ පරිවර්තක තනතුරින් ඉවත්ව ගත වූ කාලය අවුරුද්දකට අඩුවේ නම් පමණකි. එසේ ගත වූ කාලය අවුරුද්දකට වැඩිවේ නම් දීමනාව ලැබීමට සුදුසුවීම ප්‍රථම එම නිලධාරියා විසින් (ii) වෙනි වගන්තියේ ප්‍රකාර, ඔහුගේ සමාර්ථතාවය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයා, විනිශ්චයකාරතුමා, නායකයා හෝ සභාපතිවරයා තෘප්තියට පත් කළ යුතු වන්නේය.

ශී. ඒ. කුරේ,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1965 අගෝස්තු මස 19 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

| |
|---|
| විභාග අංකය |
| ................................ |
| කාර්යාලයීය ප්‍රයෝජනය පිණිසයි. |

## ආදර්ශ ඉල්ලුම් පත්‍ර පෝරමය

**භාෂණ පරිවර්තකයන් සඳහා වූ විභාගය — 1965 නොවැම්බර්**

| | |
|---|---|
| 1. ඔබේ මුලකුරු අත්සන :<br>මුල් අකුරු සහිත ඔබේ නම :<br>(පැහැදිලි රෝමානු අකුරෙන්)<br>ඔබේ නම සියල්ල සම්පූර්ණයෙන් :<br>(පැහැදිලි රෝමානු අකුරෙන්) | |
| 2. සම්පූර්ණ ලිපිනය :<br>(කාර්යාලයීය පමණකි) : | |
| 3. පහත සඳහන් කරුණු පිළිබඳ තොරතුරු සපයන්න :—<br>(i) ඔබ දැනට උසාවියක භාෂණ පරිවර්තකයකු පදවියක් දරන්නෙහි ද යන වග :<br>(ii) ඔබ සාමාන්‍ය ලිපිකාර සේවයෙහි සාමාජිකයෙක් වන්නෙහි ද යන වග සහ එසේ නම් ඔබේ පන්තිය සහ ශ්‍රේණිය : | |
| 4. ඔබ සේවය කරන දෙපාර්තමේන්තුවේ නම : | |
| 5. විභාගය සම්පූර්ණ කිරීම පිණිස ඔබ ගනු ලබන්නේ එක් විෂයයක් පමණක් නම් පහත සඳහන් කරුණු පිළිබඳ තොරතුරු සපයන්න :—<br>(i) ඔබ සුදුසුකම් ලැබූ පසුගිය විභාගය සඳහා ලද සුචි අංකය :<br>(ii) ඔබ දැන් ගන්නා විෂයය : | |

මා විසින් කරන ලද මේ ප්‍රකාශයන් මගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය බව මගේ අත්සන තැබීමෙන් මම සහතික කරමි. භාෂණ පරිවර්තකයකු ලෙස මා පත් කෙරෙන ලංකාවේ ඕනෑම පෙදෙසක සේවය කිරීමටත්, මෙම විභාගය පිළිබඳ රෙගුලාසිවලට එකඟව ක්‍රියා කිරීමටත් බැඳෙමි.

................................
අපේක්ෂකයාගේ අත්සන.
(දෙපාර්තමේන්තු ප්‍රධානියා ඉදිරිපිට දී)

දිනය :

### දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

ඉහත විස්තර දැක්වෙන අපේක්ෂකයා විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබා ඇති බව මෙයින් සහතික කරමි.

................................
(අත්සන සහ අත්සන් කරන නිලධාරියාගේ පදවි නාමය)
(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පදවි නාමය)

දිනය :

## ලංකාවේ විභාග දෙපාර්තමේන්තුව

**විභාගාපේක්ෂකයන් සඳහා නීති**

සියලුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි හෝ පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයට ම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම ;

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සකු කිරීම ;

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම ;

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම ;

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම ;

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම් :—ලියනකඩදාසි, තීන්ත පොවන කඩදාසි, ප්‍රස්තාර කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණොත් ඒ බව නො පමාවම විභාගශාලාධිපතීන්ට දැන්විය යුතු ය. විභාග ශාලාවේ දී ඔබට ම දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක් වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නො කළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නො කර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්සමෙන් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්ට හැරිය යුතුයි ;

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත තුඩු, මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි ;

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියක ම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නො පමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේ ම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක් වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක් ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නො හැකි ලෙස නො ලිය යුතුයි ;

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන් කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වැරදීම් යෙදීම විභාගලත්ව යකට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමෙන් නිවැරදි ලෙස යෙදිය යුතුයි ;

(viii) අනිවාර්ය ප්‍රශ්න ද තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධ ව ප්‍රශ්න පත්‍රයේ මුලින් ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුයි. මෙය නො සලකා හැරීමෙන් බොහෝවිට පැටලි සිදු විය හැකිය ;

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගණන් බැලීම් සහ සටහන් වැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන ප්‍රමාණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමු කර විය යුතු අවස්ථාවලදී ඒ රූප සටහන නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ ;

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙළ අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කෑබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න ;

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ සියතින් ම බාර දිය යුතුය. නැත හොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේ ම වාඩි වී සිටිය යුතු ය. මෙසේ නො කිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නො වුවකුසේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයකුට හෝ බාර නො දිය යුතුය ;

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නො නැගිට අත උස්සා එසවිය යුතු ය.

එච්. එල්. විමලසූරිය,
වැඩ බලන විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ වීදියේ
විභාග දෙපාර්තමේන්තුවේ දීය.

9–26—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

## ටැන්ඩර් කැඳවීමේ දැන්වීම

### 1965–66 මුදල් වර්ෂය තුළ බන්ධනාගාර හා සිරසැල්වල සිටින සිරකරුවන්ටත්, උසාවිවලට ඉදිරිපත්කරනු ලබන සිරකරුවන්ටත් පිසන ලද ආහාර සැපයීම

බන්ධනාගාර හා සිරසැල්වල සිටින සිරකරුවන්ටත්, උසාවිවලට ඉදිරිපත් කරනු ලබන සිරකරුවන්ටත් 1965 ඔක්තෝබර් මස 1 ද සිට 1966 සැප්තැම්බර් මස 30 වැනි දින තෙක් වූ අවුරුදු කාලය තුළ පිසනු ලැබූ ආහාර සැපයීම සඳහා 1965.9.23 දින පෙරවරු 10 දක්වා ඒ ඒ බන්ධනාගාර අධිකාරීන් විසින් ටෙන්ඩර්, ලාංකිකයන් ගෙන් (ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රට වැසියකු වූවෙකි.) භාරගනු ලැබේ. එම දිනවල පෙරවරු 10.05ට ටෙන්ඩර් විවෘත කරනු ලබනවා ඇත. ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී එහි පෙනී සිටීමට ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන් ආහාර සඳහා මිළ ගණන් ඉදිරිපත් කිරීමේ දී ඉලක්කමින් මෙන්ම වචනයෙන් ද ඒවා සඳහන් කළ යුතුව ඇත. ඉලක්කමින් සඳහන් මිළ ගණන් වචනයෙන් සඳහන් කිරීමේ දී අසමානත්වයක් ඇතිවී තිබුණහොත් හෝ මිළ ගණන් වචනයෙන් සඳහන් වී නැති නම් හෝ එබඳු ටෙන්ඩර් ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇත්තේය.

3. ආහාර සැපයීම පිළිබඳ විස්තර පහත සඳහන් වේ :—

උදය ආහාරය—

(අ) ආප්ප හෝ ඉඳිආප්ප (අවුන්ස 6කට නොඅඩු විය යුතුයි) ;
(ආ) හකුරු අවුන්ස එකක් හෝ සම්බෝල ;
(ඇ) සීනි දමන ලද තේ කෝප්පයක්.

දිවා නෝස්වරු භෝජනය—

(අ) හාල් අවුන්ස 8 ප්‍රමාණයේ තැම්බූ බත් පිඟානක් ;
(ආ) හරක් මස් හෝ මාලු හෝ කරවල අවුන්ස 2 යි ;
(ඇ) එළවළු ව්‍යංජන දෙකයි. එක ව්‍යංජනයක් අවුන්ස 2 ප්‍රමාණය විය යුතුයි.

සැ.යු.—(1) සලාක කිරීම නිසා නොහොත් වෙනත් ප්‍රමාණවත් හේතුවක් නිසා සම්පූර්ණ ආහාර ප්‍රමාණයක් හෝ ඉන් කොටසක් හෝ සැපයිය නො හැකි නම්, අධිකාරි තැනගේ අභිමතය පරිදි කොන්ත්‍රාත්තුවට බැඳී ඇති වෙළඳ මිල ප්‍රමාණයට සෑහෙන සේ ආදේශක ආහාර සැපයීමට කොන්ත්‍රාත්කරුවනට පිළිවන.

(2) කොන්ත්‍රාත්තරුවන්ගෙන් උදය ආහාරය ලබාගනු ලබන්නේ ආයතනය මගින් එය අඩු මිලකට සපයා ගැනීමට නොහැකි වුවහොත් පමණකි.

4. සියළුම ටෙන්ඩර් පත්‍ර ලනු පිටපතක් සහිතව ලියුම් කවරයක බහා සීල් තබා උපලේඛනයේ සඳහන් අධිකාරි තැන වෙත රෙජිස්ටර් තැපෑලෙන් යැවිය යුතුයි. රෙජිස්ටර් තැපෑලෙන් නොයවන ටෙන්ඩර් පත්‍ර එම අධිකාරි තැනට හෝ ඔහු විසින් පත් කරන ලද බලයලත් නියෝජිතයෙකු වෙතනම් ඔහුට හෝ භාරදී එය භාර ගත් බවට ලියවිල්ලක් ලබා ගත යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර බහා ලූ කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ "1965-66 වර්ෂය තුළ බන්ධනාගාර සහ සිරසැල්වල සිටින සිරකරුවන්ටත්, උසාවිවලට ඉදිරිපත් කරනු ලබන සිරකරුවන්ටත් පිසන ලද ආහාර සැපයීමේ ටෙන්ඩරය" යැයි ලියා උපලේඛනයේ සඳහන් දිනවල මෙහි 1 වැනි ඡේදයේ සඳහන් වේලාවට ප්‍රථම නියමිත අධිකාරි තැනට ලැබිය යුතු සේ එවිය යුතුයි.

6. ටෙන්ඩර් සඳහා නියමිත පෝරම ඒ ඒ ආයතන භාර අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. නියමිත පෝරමයේ ලියා නැති ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

7. ටෙන්ඩර් භාර ගැනීම නතර කළ දින සිට සති 8ක් යනතුරු ටෙන්ඩර්කරුවන් තමන්ගේ ටෙන්ඩර් පත්‍ර සැළකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුයි.

8. ටෙන්ඩර්වල සියලුම වෙනස් කිරීම් හා මැකීම්වලට ටෙන්ඩර්කරුවන් විසින් තම කෙටි අත්සන යෙදිය යුතුයි.

9. මෙහි පහත උපලේඛනයෙහි සඳහන් පරිදි ටෙන්ඩර් පත්‍ර සඳහා තැන්පත් කළ යුතු මුදල් බන්ධනාගාර අධිකාරීන්ගේ කාර්යාලවල හෝ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ (කොළඹ කච්චේරිය හැර) වෙන ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝරම ලබා ගත හැකිය.

යමෙකුට ඔහුගේ ටෙන්ඩරය පිළිගත් බව ලියමනකින් දන්වනු ලැබීමෙන් දින 10ක් ඇතුළත දී අවශ්‍ය ඇප මුදල් ඉදිරිපත් කිරීම පුරවන් නොවිනි නම් හෝ එසේ කිරීමෙන් වැළැකී සිටිනම් හෝ තැන්පත් කරන ලද මුදල් රාජසන්තක වෙනවා ඇත. ඉන් පසු රජය සම්බන්ධ කවර කොන්ත්‍රාත්තුවකට හෝ බැඳීමට නොහැකි වනසේ ඔහුගේ නම කොන්ත්‍රාත් කඩ කරන්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනවා ඇත. තවද, කොන්ත්‍රාත්තුව කඩ කිරීමේ අලාභ වශයෙන් ලංකාවේ වලංගු මුදලෙන්, ඒ ඒ කොන්ත්‍රාත්තුවට තබා ඇති ඇප මුදලට සමාන මුදලක් රජය වෙනුවෙන් බන්ධනාගාර කොමසාරිස්වරයාට ගෙවීමට, එම ටෙන්ඩර්කරුවනට සිදු වෙනවා ඇත. මෙම මුදල අලාභ වශයෙන් නීති මාර්ගයෙන් අයකර ගැනීමේ බලය බන්ධනාගාර කොමසාරිස්වරයා වෙත පැවරී ඇත.

ටෙන්ඩරය පිළිගත් බව දන්වන නිවේදනය ටෙන්ඩර්කරු විසින් දෙනු ලබන ලිපිනයට තැපැලෙන් යවනු ලැබුවහොත් හෝ නො එසේව එහි ගෙන ගොස් භාරදුනහොත් හෝ එම නිවේදනය ටෙන්ඩර්කරුවා වෙත ලැබුණු ලෙස සලකනු ලැබේ. අන්‍ය සියලු තැන්පත් මුදල්, කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු ආපසු ගෙවනු ලැබේ.

10. ටෙන්ඩර් පිළිගැනීමෙන් පසු, එසේ පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුවෝ, කොන්ත්‍රාත්තුව මනා අන්දමින් ඉටු කරන වගට ඇපකරුවන් වශයෙන් ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට කැමති වග කිවයුතු පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් ඉදිරිපත් කළ යුතුයි. කොන්ත්‍රාත්කරුවන් විසින් වැඩෙහි යෙදවිය යුත්තේ ලාංකිකයන් පමණකි.

11. සේවය නිසියාකාර ඉටු කිරීමේ දී දත යුතු සියලුම අවශ්‍ය කරුණු දැන ගැනීම සඳහා උපලේඛනයේ සඳහන් අධිකාරිවරුන් ගෙන් විමසනු මැනවි.

12. ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින බන්ධනාගාර කොමසාරිස්වරයා සමඟ කොන්ත්‍රාත්තුවට අත්සන් තැබිය යුතුයි. එබඳු නිලධාරියෙකුගේ පදවි නාමයෙන් ඇඟෙස් කළ යුත්තේ ද ගිණිය යුත්තේ ද ලංකාණ්ඩුව යටතේ දැනට එම පදවිය දරන්නා වූ ද නිලධාරියා ද ඔහුට පසු එම පදවිය දරන්නා වූ නිලධාරියා ද වේ.

1965 අගෝස්තු මස 30 වෙනි දින,
කොළඹ 9,
බන්ධනාගාර මූලස්ථානයේ දී ය.

පී. වී. පෙරේරා,
වැ.බ. බන්ධනාගාර කොමසාරිස්.

## උපලේඛනය

| | ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රුපියල් | ඇප මුදල රුපියල් | ටෙන්ඩර් භාරගන්නා නිලධාරියා |
|---|---|---|---|---|
| 1. | බණ්ඩාරවෙල මහෙස්ත්‍රාත් උසාවිය | 5 | 25 | බදුල්ල බන්ධනාගාර අධිකාරී |
| | මොනරාගල | 5 | 25 | එම |
| | නුවරඑළිය සිරසැල සහ උසාවිය | 10 | 50 | එම |
| 2. | කළුතර සිරසැල සහ උසාවිය | 10 | 50 | කොළඹ රිමාන්ඩ් අධිකාරී |
| 3. | මහර බන්ධනාගාරය | 25 | 100 | මහර බන්ධනාගාර අධිකාරී |
| 4. | බදුල්ල බන්ධනාගාරය | 10 | 50 | බදුල්ල බන්ධනාගාර අධිකාරී |
| | බණ්ඩාරවෙල මහෙස්ත්‍රාත් උසාවිය | 5 | 25 | එම |
| | මොනරාගල | 5 | 25 | එම |
| | නුවරඑළිය සිරසැල සහ උසාවිය | 10 | 50 | එම |
| 5. | කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය | 25 | 150 | කොළඹ රිමාන්ඩ් අධිකාරී |
| | අළුත්කඩේ බන්ධනාගාරය සහ කොළඹ උසාවිය | 25 | 150 | එම |
| | හොරණ මහෙස්ත්‍රාත් උසාවිය | 5 | 25 | එම |
| | කළුතර සිරසැල සහ උසාවිය | 10 | 50 | එම |
| | මැගසින් බන්ධනාගාරය | 25 | 100 | එම |
| | මතුගම මහෙස්ත්‍රාත් උසාවිය | 5 | 25 | එම |
| | පානදුර සිරසැල සහ උසාවිය | 10 | 50 | එම |
| | වැලිකඩ බන්ධනාගාරය | 25 | 150 | එම |
| 6. | බලපිටිය සිරසැල සහ උසාවිය | 10 | 50 | ගාලු බන්ධනාගාර අධිකාරී |
| | ගාලු බන්ධනාගාරය සහ උසාවිය | 25 | 100 | එම |
| 7. | වවුනකච්චේරිය සිරසැල සහ උසාවිය | 5 | 25 | යාපනයේ බන්ධනාගාර අධිකාරී |
| | යාපනය බන්ධනාගාරය සහ උසාවිය | 25 | 100 | එම |
| | කයිට්ස් සිරසැල සහ උසාවිය | 5 | 25 | එම |
| | මන්නාරම සිරසැල සහ උසාවිය | 5 | 25 | එම |
| | මල්ලකම් සිරසැල සහ උසාවිය | 5 | 25 | එම |
| | මුලතිව් සිරසැල සහ උසාවිය | 5 | 25 | එම |
| | පොයින්ට් පේද්‍රු සිරසැල සහ උසාවිය | 5 | 25 | එම |
| | වවුනියා සිරසැල සහ උසාවිය | 5 | 25 | එම |
| 8. | ගම්පොල සිරසැල සහ උසාවිය | 5 | 25 | නුවර බන්ධනාගාර අධිකාරී |
| | හැටන් සිරසැල සහ උසාවිය | 25 | 150 | එම |
| | කෑගල්ල සිරසැල සහ උසාවිය | 25 | 100 | එම |
| | කුරුණෑගල සිරසැල සහ උසාවිය | 50 | 200 | එම |
| | නුවර බන්ධනාගාරය සහ උසාවිය | 50 | 200 | එම |
| | මාතලේ සිරසැල සහ උසාවිය | 10 | 50 | එම |
| 9. | ගම්පහ සිරසැල සහ උසාවිය | 10 | 50 | මහර බන්ධනාගාර අධිකාරී |
| | කුලියාපිටිය සිරසැල සහ උසාවිය | 25 | 150 | එම |
| 10. | හම්බන්තොට සිරසැල සහ උසාවිය | 5 | 25 | මාතර බන්ධනාගාර අධිකාරී |
| | මාතර බන්ධනාගාරය | 25 | 100 | එම |
| | තංගල්ල බන්ධනාගාරය සහ උසාවිය | 10 | 50 | එම |
| | තිස්ස සිරසැල සහ උසාවිය | 5 | 25 | එම |
| | වලස්මුල්ල සිරසැල සහ උසාවිය | 5 | 25 | එම |
| 11. | හලාවත සිරසැල සහ උසාවිය | 10 | 50 | අධිකාරී/ත.ව.අ.වි. මීගමුව |
| | කතුවන මහෙස්ත්‍රාත් උසාවිය | 5 | 25 | එම |
| | මාරාවිල | 5 | 25 | එම |
| | මීගමුව බන්ධනාගාරය සහ උසාවිය | 10 | 50 | එම |
| | පුත්තලම සිරසැල සහ උසාවිය | 10 | 50 | එම |
| 12. | අවිස්සාවේල්ල සිරසැල සහ උසාවිය | 25 | 100 | වැලිකඩ බන්ධනාගාර අධිකාරී |
| | බලන්ගොඩ සිරසැල සහ උසාවිය | 5 | 25 | එම |
| | රත්නපුර සිරසැල සහ උසාවිය | 25 | 100 | එම |
| | රක්වාන සිරසැල සහ උසාවිය | 5 | 25 | එම |

## කොළඹ වරාය කොමිෂන් සභාව

ජනසතු සේවා අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1965 ඔක්තෝබර් මස 6 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවට තෙල් බවුසරයක් සපයා භාර දීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. 1965 ඔක්තෝබර් මස 6 වෙනි දින පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර පිළිස්වර් තැපැලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් ටෙන්ඩර් භාර ගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබා ගත යුතුය.

3. ටෙන්ඩර් පිළිබද ලිපි ලේඛන කොළඹ වරාය කොමිෂන් කාර්යාලයේදී පරීක්ෂා කළ හැක. රු. 25 ක මුදලක් වරාය කොමිෂන් කාර්යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝරම කොළ ලබා ගත හැක. ටෙන්ඩර් කොන්දේසි වලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබා ගත් පෝරම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1965 ඔක්තෝබර් මස 4 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝරම කොළ නිකුත් කරනු ලැබේ.

ආර්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

1965.9.3.
කොළඹ, වරාය කොමිෂන් කාර්යාලයේදිය.

9–156—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

## රජයේ රේගුවේ ටෙන්ඩර් පත් මගින් අත් ඔර්ලෝසු විකිණීම

කොළඹ රජයේ රේගුවේ, ප්‍රධාන රේගු අයකැමි තුමා විසින් පහත සඳහන් ඔර්ලෝසු කොටස් වශයෙන් මිලයට ගැනීම සඳහා මුද්‍රාව තබන ලද ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1965ක්වූ සැප්තැම්බර් මස 16 වෙනි දින දවල් 12 දක්වා භාරගනු ලැබේ:—

| | | | |
|---|---|---|---|
| 1. | පී.ඩී.ඇම්. 90/61 | ... මහතුන්ගේ "වික්ටර්" ගල් 17 ඔර්ලෝසු ... ... ... ... | 1 |
| 2. | පී.ඩී.ඇම්. 563/62 | ... මහතුන්ගේ, "කැස්ටල්" (පිරිමියර්) වර්ගයේ ගල් 17 අත් ඔර්ලෝසු ... ... | 20 |
| 3. | පී.ඩී.ඇම්. 679/62 | ... මහතුන්ගේ, අත් ඔර්ලෝසු (ටෛර් ස්විස් යන්ත්‍ර 1 සහ මිරෝමා ස්විස් යන්ත්‍ර 1) ... ... | 2 |
| 4. | පී.ඩී.ඇම්. 668/62 | ... මහතුන්ගේ, අත් ඔර්ලෝසු මිරෝමා ඩිලක්ස් ස්විස් යන්ත්‍ර ... ... ... | 1 |
| 5. | පී.ඩී.ඇම්. 659/62 | ... මහතුන්ගේ, පාර්විලුබා ජිනීව පිකින්ග් පටි සහිත ඔර්ලෝසු ... ... ... | 1 |
| 6. | පී.ඩී.ඇම්. 361/63 | ... මහතුන්ගේ, පැකාර්ඩ් වර්ගයේ ගල් 17 පටි සහිත ඔර්ලෝසු ... ... ... | 1 |
| 7. | පී.ඩී.ඇම්. 339/64 | ... මහතුන්ගේ, අත් ඔර්ලෝසු (මිකී ඩිලක්ස් රෝල්ඩ් ගෝල්ඩ් පටි සහිත 3, මිකී ඩිලක්ස් සුදු මුහුණ සහිත 5.) | 8 |
| 8. | පී.ඩී.ඇම්. 340/64 | ... මහතුන්ගේ, පාවර්ලුබා ජිනීව පිකින්ග් ස්විස් සාදා ලද පටි සහිත ඔර්ලෝසු ... ... | 2 |
| 9. | පී.ඩී.ඇම්. 673/64 | ... මහතුන්ගේ, අත් ඔර්ලෝසු (වියුනිස් රෝයල් වයිට් 707 ස්විස් යන්ත්‍ර කළු මුහුණ 4, වියුනිස් රෝයල් වයිට් ගල් 21 ස්විස් යන්ත්‍ර 3) | 7 |
| 10. | පී.ඩී.ඇම්. 670/64 | ... මහතුන්ගේ, "ඔරනිමා 77" අත් ඔර්ලෝසු ... ... ... ... | 3 |
| 11. | පී.ඩී.ඇම්. 646/64 | ... මහතුන්ගේ, සාන් ජෝස් සිල්වර් ලයින් ඉන්කා බොලොක් ස්විස් යන්ත්‍ර අත් ඔර්ලෝසු ... ... | 3 |
| 12. | පී.ඩී.ඇම්. 619/64 | ... මහතුන්ගේ, පාවර්ලුබා "ජිනීව" පී කින්ග් පටි සහිත අත් ඔර්ලෝසු ... ... ... | 1 |
| 13. | පී.ඩී.ඇම්. 237/64 | ... මහතුන්ගේ, ඔරනිමා වර්ගයේ රෝල්ඩ් ගෝල්ඩ් ස්විස් යන්ත්‍ර ඔර්ලෝසු ... ... | 40 |
| 14. | පී.ඩී.ඇම්. 31/65 | .. මහතුන්ගේ, රෝලෙක්ස් ඔයිස්ටර් පිරිපිචන් ස්විස් ඔර්ලෝසු ... ... ... | 1 |
| 15. | පී.ඩී.ඇම්. 32/65 | ... මහතුන්ගේ, මිකී රෝල්ඩ් ගෝල්ඩ් ස්විස් යන්ත්‍ර ඔර්ලෝසු ... ... ... | 14 |
| 16. | පී.ඩී.ඇම්. 33/65 | ... මහතුන්ගේ, අත් ඔර්ලෝසු (පිලිප්ස් ගල් 21 ස්විස් යන්ත්‍ර 3, ඇමිලා ඩිලක්ස් ගල් 21 ස්විස් යන්ත්‍ර 2, ස්ටැන්ඩර්ඩ් ගල් 17 ස්විස් යන්ත්‍ර 2, නිරෝ 77 ස්විස් යන්ත්‍ර 1) | 8 |
| 17. | පී.ඩී.ඇම්. 34/65 | ... මහතුන්ගේ, අත් ඔර්ලෝසු (හිංනාක් රෝල්ඩ් ගෝල්ඩ් ගල් 21 ස්විස් යන්ත්‍රය දින සහ රෝල්ඩ් ගෝල්ඩ් පටි සහිත 1, රොන්සන ඩිලක්ස් රෝල්ඩ් ගෝල්ඩ් ස්විස් යන්ත්‍ර රෝල්ඩ් ගෝල්ඩ් පටි සහිත 1, ඔරනිමා ඩිලක්ස් රෝල්ඩ් ගෝල්ඩ් ස්විස් යන්ත්‍ර රෝල්ඩ් ගෝල්ඩ් පටි සහිත 1) | 3 |
| 18. | පී.ඩී.ඇම්. 35/65 | ... මහතුන්ගේ, අත් ඔර්ලෝසු (රොපලෙක්ස් ඔයිස්ටර් වර්ගයේ ස්විස් "කළු මුහුණ" දිනය සහිත අත්ඔර්ලෝසු 1යි, කැස්ටල් පිරිමියර් වර්ගයේ ගල් 21 ස්විස් සාදන ලද පටි සහිත අත් ඔර්ලෝසු 1යි) | 2 |
| 19. | පී.ඩී.ඇම්. 208/65 | ... පන්නා මහතුන්ගේ, "බර්ටන්" ගල් 17 ස්විස් සාදන ලද ඔර්ලෝසු සහ වලල්ල ... ... | 1 |
| 20. | පී.ඩී.ඇම්. 313/65 | ... මහතුන්ගේ, පෙඩෝනා ස්විස් සාදන ලද (පිරිමි) ඔර්ලෝසු ... ... ... | 1 |
| 21. | පී.ඩී.ඇම්. 156/65 | ... මහතුන්ගේ, ලැරෙක්ස් ලක්සිරි ගල් 21 අත් ඔර්ලෝසු ... ... ... | 1 |
| 22. | පී.ඩී.ඇම්. 308/65 | ... මහතුන්ගේ, වියුනිස් සුපර් ඩිලක්ස් ගල් 21 අත් ඔර්ලෝසු ... ... ... | 2 |
| 23. | පී.ඩී.ඇම්. 134/65 | ... මහතුන්ගේ, "මිනී" වර්ගයේ (ක්‍රියා විරහිත) අත් ඔර්ලෝසු ... ... ... | 1 |
| 24. | පී.ඩී.ඇම්. 6/65 | ... මහතුන්ගේ, "ටිටෝනි" එයාර්මාස්ටර් ගල් 30 ඔටෝමැටික් දින සහ පටි සහිත අත් ඔර්ලෝසු ... | 1 |
| 25. | පී.ඩී.ඇම්. 61/65 | ... මහතුන්ගේ, අත් ඔර්ලෝසු (ඔරනිමා ඩිලක්ස් ස්විස් යන්ත්‍ර 15, මැටි ස්විස් යන්ත්‍ර 24, මිකී සුපර් ඩිලක්ස් 2) | 41 |
| 26. | පී.ඩී.ඇම්. 167/65 | ... (1) මහතුන්ගේ ඔරනිමා ඩිලක්ස් ස්විස් සාදන ලද ඔර්ලෝසු ... ... ... | 25 |
| | | (2) එම ... ... ... ... ... | 25 |
| | | (3) එම ... ... ... ... ... | 25 |
| | | (4) එම ... ... ... ... ... | 25 |
| | | (5) එම ... ... ... ... ... | 19 |

2. එදින ඉහත සඳහන් එකී ස්ථානයේ දී එම වේලාවට ටෙන්ඩර් පත් විවෘත් කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට එසේ විවෘත කරන විට ඉදිරිපිට සිටිය හැක.

3. රේගු කාර්යාලයේ දී ටෙන්ඩර් පත් සඳහා රු. 100ක් ගෙවා කුවිතාන්සියක් ලබා ගෙන එය ප්‍රධාන නිවාරණ නිලධාරි තුමා වෙත ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍රයක් ලබා ගත හැක.

4. සියළුම ටෙන්ඩර් කවරයක බහා එහි වම් පැත්තේ උඩ කෙලවරේ "අත් ඔර්ලෝසු සඳහා ටෙන්ඩරය" යන්න ලියා, ලියාපදිංචි කළ තැපෑලෙන් කොළඹ රජයේ රේගුවේ ප්‍රධාන රේගු අයකැමි තුමා වෙත ටෙන්ඩර් විවෘත කරන දිනයට ද, වේලාවට ද පෙර ලැබෙන ලෙස හෝ ප්‍රධාන රේගු අයකැමි තුමාගේ කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුයි.

5. රේගුවේ ප්‍රධාන නිවාරණ නිලධාරි තුමාගේ කාර්යාලයේ දී 1965 සැප්තැම්බර් මස 6 වෙනි දින සිට 11 වෙනි දින දක්වා පස්වරු 1 සිට 4 දක්වා මෙම ඔර්ලෝසු පරීක්ෂා කළ හැක.

6. තේරුනු ටෙන්ඩර් කරුවාට/කරුවන්ට අත් ඔර්ලෝසු වල සම්පූර්ණ වටිනාකමට සරිලන මුදල ගෙවන තුරු මෙම බඩු භාර දෙනු නොලැබේ.

7. සියළු ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමට ද, සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් ප්‍රතික්ෂේප කිරීමට ද, බලය හා අවසාන තීරණ ගැනීමේ බලයද ප්‍රධාන රේගු අයකැමි සතුය.

8. වැඩි විස්තර රේගු කාර්යාලයේ ප්‍රධාන නිවාරණ නිලධාරි තුමාගෙන් ලබා ගත හැක.

ග. කුමාරසිංහ,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

රේගු කාර්යාලය,
නිවාරණ අංශය,
කොළඹ, 1965 අගෝස්තු මස 23 වෙනි දින දිය.

9–123—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

## සේවයට අයෝග්‍ය මෝටර් රථ මිලයට ගැනීම

කොළඹ 3, පහළ වැව පාරේ සමාජසේවා දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1965 සැප්තැම්බර් 17 වැනි සිකුරාදා පෙ. ව. 9.30 වන තෙක් අංක 1 ශ්‍රී 9311, 1 ශ්‍රී 9748 හා ඊ. ඈන්. 8732 දරණ විලිස් ජීප් රථ මිලට ගෙන ඉවත් කිරීම සඳහා ටැන්ඩර් භාර ගනු ලැබේ.

2. කාර්යාල වේලාවන් තුළ මේ කාර්යාලයේදී රථ බැලිය හැකිය.

3. ටැන්ඩර් ඇප මුදල වශයෙන් රු. 50ක් සමාජසේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ කච්චේරියක තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ කල්හි කොළඹ 3, පහළ වැව පාරේ සමාජසේවා අධ්‍යක්‍ෂ තැනගෙන් ලබාගත හැකි ආකෘතිවල ලියූ ටැන්ඩර් පිටපත් දෙකක් ඇතුව එවිය යුතුය. කිසිවෙකුගේ ටැන්ඩර් පිළිගත් බව ඔහුට ලියුමකින් දන්වා පස් දිනක් ඇතුළත ඔහු ටැන්ඩරයේ සඳහන් කළ මුළු මුදල ගෙවීමට ප්‍රතික්ෂේප කළ හොත් හෝ එසේ ගෙවීමට නොහැකි වුවහොත් ඔහුගේ ඇපය රාජ සන්තක කොට රථ වෙන ටැන්ඩර්කරුවෙකු වෙත ඉදිරිපත් කරනු ලැබේ. සඵලවූ ටැන්ඩරය හිමියා මුළු මුදල ගෙවා දින තුනක් ඇතුළත රථ දැනට තිබෙන ස්ථානයෙන් ඉවත් කළ යුතුය.

4. වර්ෂ 1963 සැප්තැම්බර් 15 වැනි බදාදා ප. ව. 4 දක්වා ටැන්ඩර් ආකෘතීන් නිකුත් කරනු ලැබේ.

5. එක රථයක් හෝ රථ සියල්ල සඳහා ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ හැක.

6. මුද්‍රා තබන ලද ටැන්ඩර් "මෝටර් රථ මිළට ගැනීමට ටැන්ඩර්" යනුවෙන් සටහන් කළ කොපුවක බහා ලියාපදිංචි කළ තැපැලෙන් කොළඹ 3, තැපැල් පෙට්ටි 577, සමාජසේවා දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත එවිය යුතුය.

7. තම ටැන්ඩර් ලියාපදිංචි කළ තැපැලෙන් නොයවන්නට තීරණය කර ගන්නා ටැන්ඩර්කරුවන් කොළඹ 3, පහළ වැව පාරේ පිහිටි සමාජසේවා දෙපාර්තමේන්තුවේ මේ සඳහා තබා ඇති "ටැන්ඩර් පෙට්ටිය" තුළට ඒවා බහාලිය නොවේ. ටැන්ඩර්කරුවාගේ නම හා ලිපිනය ලියුම් කොපුවේ ලිවිය යුතුය. එවැනි ටැන්ඩරයක් ලැබුණු බවට ලිපියක් අවශ්‍ය නම් එය කාර්යාල සහකාර තැන විසින් නිකුත් කරනු ලැබේ.

8. ටැන්ඩර්වල වෙනස් කරන ලද හෝ මකන ලද සෑම ස්ථානයකම ටැන්ඩර්කරුගේ කෙටි අත්සන යෙදිය යුතුය.

9. ටැන්ඩර් භාරගැනීමේ අවසාන දිනයේ සිට සති 4ක් ගතවන තුරු ටැන්ඩර්කරුවන් බලාපොරොත්තු වන ගණන් නොවෙනස්ව තබා ගත යුතු බව අපේක්‍ෂිතය.

10. වර්ෂ 1965 සැප්තැම්බර් 17 වැනි සිකුරාදා පෙ. ව. 10ට කොළඹ 3, ගාලුමුවදොර, පහළ වැව පාරේ පිහිටි සමාජසේවා අධ්‍යක්‍ෂ තැනගේ කාර්යාලයේදී ටැන්ඩර් විවෘත කරනු ලැබේ.

11. ටැන්ඩර් විවෘත කරනු ලබන වේලාවෙහි පැමිණ සිටීමට කැමති නම් එසේ කිරීමට ටැන්ඩර්කරුවන්ට හෝ ඔවුන් විසින් බලය පවරන ලද නියෝජිතයින්ට අවසර දෙනු ලැබේ.

12. 3 වැනි ඡේදයෙහි දැක්වෙන කොන්දේසියට යටත්ව ටැන්ඩර් ඇප මුදල් ආපසු ගෙවනු ලැබේ.

13. කිසියම් ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර සියල්ලම ප්‍රශ්න වීරහිතව ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය රජය සතුව තිබේ.

14. වැඩිපුර විස්තර සමාජසේවා අධ්‍යක්‍ෂ තැනගෙන් ලබාගත හැකිවේ.

දොස්තර ආර්. එල්. තිරුවෙල්වම්,
සමාජ සේවා අධ්‍යක්‍ෂ.

තැපැල් පෙට්ටිය අංක 577,
1955.8.24 වැනි දින,
කොළඹ දී ය.

9-21—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

## සමාජ සේවා දෙපාර්තමේන්තුව

වත්තේගම අන්ධයින් පුනරුත්ථාපනය කිරීමේ හා පුහුණු කිරීමේ මධ්‍යස්ථානයට පාන් සහ රස කැවිලි සැපයීම සඳහා, 1965.10.1 වෙනි දින සිට 1966.9.30 වන දින දක්වා (දෙදිනම ඇතුලත්ව) ටෙන්ඩර් පහත අත්සන් තබා ඇති අය විසින් 1965.9.17 දින පෙ. ව. 10 දක්වා භාරගනු ලැබේ.

මෙම ටෙන්ඩර් ඉදිරිපත් කළයුත්තේ කච්චේරියක රු. 25 ක් තැන්පත් කොට එම කුවිතාන්සිය මෙම කාර්යාලයේ ප්‍රදානය කොට ටෙන්ඩර් පිටපත් ලබා ගැනීමෙනි.

ටෙන්ඩර්වල මුද්‍රාව තබා ලියුම් කවරේ ඉහල වම් පැත්තේ "පාන් සහ රසකැවිලි සැපයීමේ ටෙන්ඩර්" යන සටහන සඳහන් කොට ලියාපදිංචි කරන ලද තැපැලෙන් එවිය යුතුය.

ටෙන්ඩර් පිටපත් වලට අමුනා ඇති උපලේඛනවල මිල ගණන් වචනයෙන් සහ ඉලක්කම්වලින් පැහැදිලිව සටහන් කළ යුතුයි.

ටෙන්ඩර් කැඳවා හමාරවූ පමණින් උය පරීක්‍ෂා කරනු ලැබේ. එවිට ටෙන්ඩර්කරුවන්ට පැමිණිය හැක.

වෙනයම් විස්තර උවමනා නම් උය වත්තේගම අන්ධයින් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ කළමනාකාර තැන ගෙන් ලබා ගත හැක.

දොස්තර ආර්. එල්. තිරුවෙල්වම්,
සමාජ සේවා අධ්‍යක්‍ෂ.

සමාජ සේවා දෙපාර්තමේන්තුව,
කොළඹ, 1965.8.13.

9-4—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

## සමාජ සේවා දෙපාර්තමේන්තුව

වත්තේගම අන්ධයින් පුනරුත්ථාපනය කිරීමේ හා පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ කිළිටි රෙදි පිරිසිදු කිරීමේ කාර්ය සඳහා, 1965.10.1 වෙනි දින සිට 1966.9.30 වන දින දක්වා (දෙදිනම ඇතුළත්ව) ටෙන්ඩර් පහත අත්සන් තබා ඇති අය විසින් 1965.9.17 වන දින පෙ. ව. 10 දක්වා භාරගනු ලැබේ.

2. මෙම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ කච්චේරියක රු. 25 මුදලක් තැන්පත් කොට එම කුවිතාන්සිය මෙම කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍රවලය.

3. තැපැල් මඟින් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම්කරන්නවුන් එසේ එම ආකෘති පත්‍ර ලබා ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට හැකි වන අයුරු, තැන්පත් මුදල් කුවිතාන්සි සැහෙන තරම් කලියෙන් ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර මුද්‍රා තබා ලියුම් කවරයේ ඉහළ වම් පැත්තේ "කිළිටි රෙදි පිරිසිදු කිරීමේ ටෙන්ඩර්" යන්න සඳහන් කොට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපැලෙන් එවීමට අදහස් නොකරන ටෙන්ඩර්කරුවන්ට තම ටෙන්ඩර් පත්‍ර කොළඹ 3, පහළ වැව පාරේ සමාජ සේවා දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ ටෙන්ඩර් පත්‍ර තැන්පත් කිරීම සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ හැකිය. ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ටෙන්ඩර් පත්‍ර බහාලූ කවර මත සටහන් කළ යුතුය.

5. ටෙන්ඩර් පත්‍රවල මිළ ගණන් වචනයෙන් හා ඉලක්කම් වලින් පැහැදිලිව සඳහන් කළ යුතුය.

6. පිළිගත් ටෙන්ඩර් ජයකරු ගිවිසුමට බැඳී කොන්ත්‍රාත්තුවේ වැඩ පටන් ගැනීමට කලින් මුදලින් රුපියල් පනහක ඇපයක් තැබිය යුතුය. කොන්ත්‍රාත්තුව සතුටුදායක ලෙස ඉටුකොට අවසානවූ පසු ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

7. කිසියම් ටෙන්ඩර්කරුවෙකු, ඔහුගේ ටෙන්ඩරය පිළිගෙන ඇති බව දන්වනු ලැබූ විට කොන්ත්‍රාත්තුවට බැඳීම පැහැර හැරියොත් හෝ ඇප තැබීමට නියම කළ විට එසේ කිරීම පැහැර හැරියොත් හෝ ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල ඔහුට අහිමි වන්නේය.

8. 7 වන ඡේදයේ කොන්දේසි අනුව තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

9. ටෙන්ඩර් පියවීමේ වේලාව අවසන් වූ විගස ටෙන්ඩර් විවෘත කරනු ලබන්නේය. එවිට ටෙන්ඩර්කරුවන්ටද පෙනී සිටිය හැක.

10. වැඩි දුරටත් විස්තර අවශ්‍ය වෙතොත් කොළඹ 3, තැ. පෙ. 577, සමාජ සේවා අධ්‍යක්‍ෂ තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

දොස්තර ආර්. එල්. තිරුවෙල්වම්,
සමාජ සේවා අධ්‍යක්‍ෂ.

1965 අගෝස්තු මස 13 දින,
කොළඹ, සමාජ සේවා දෙපාර්තමේන්තුවේ දී ය.

9-5—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

## ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

### පාවිච්චි කිරීමට නොහැකි නිසා දෙපාර්තමේන්තුවෙන් අස් කැරෙන මෝටර් වාහන මිලයට ගැනීම

පහත සඳහන් මෝටර් වාහන මිලයට ගෙන ඉවත් කරගැනීම පිණිස ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත අධ්‍යක්ෂක තැන නමට කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ, අංක 578 තැපැල් පෙට්ටියට එවනු ලබන ටෙන්ඩර් පත්‍ර 1965 සැප්තැම්බර් 24 වැනි දින පෙරවරු 9.30 තෙක් බාරගනු ලැබේ:—

වාහන

1. අංක ඊ. වයි. 880 ඔස්ටින් රථය
2. අංක ඊ. වයි. 883 ඔස්ටින් රථය
3. අංක ඊ. එල්. 6865 විලීස් ස්ටේෂන් වැගන්

ඉහත සඳහන් වාහන කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකි ය.

2. තමන්ගේම අංකෘතියක පිටපත් දෙකකින් යුතුව සකස් කළ යුතු ටෙන්ඩර "අස් කැරෙන මෝටර් වාහන මිලයට ගැනීමට ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කළ ලියුම් කොපුවක බහා අස් ඔබා (සීල් කර) එවිය යුතු යි. එක් රථයක් සඳහා හෝ රථ තුනම සඳහා හෝ ටෙන්ඩර එවීමට ඉඩ තිබේ. කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත අධ්‍යක්ෂක කාර්යාලයට රු. 50 ක් (රුපියල් පනහක්) ටෙන්ඩර තැන්පත් මුදලක් ගෙවා ලබාගත් කුවිතාන්සියක් ද ටෙන්ඩර පත්‍රයට ඇමිණිය යුතු වේ.

3. මෙහි 1 ඡේදයේ සඳහන් දින සහ වේලාව නොඉක්මවා ලැබිය යුතු ටෙන්ඩර පත්‍ර කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ පිහිටි, ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත අධ්‍යක්ෂක කාර්යාලයෙහි ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතු ය. නොහොත් කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත අධ්‍යක්ෂක තැන නමට ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතු යි.

4. කිසිම ප්‍රශ්නයකට ඉඩ නොතබා කවර ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර සියල්ලම හෝ ප්‍රතික්ෂෙප කිරීමේ බලය ආණ්ඩුවට තබා ගෙන ඇති බව සැලැකිය යුතු වේ. මේ නිවේදනයෙහි එන සියලුම කොන්දේසිවලට එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් බාර නොගැනෙනවා ඇත.

5. තමන් විසින් ඉදිරිපත් කැරෙන ටෙන්ඩර් ඉවත් කරගැනීමට ටෙන්ඩර ඉදිරිපත් කළ කවරකුට හෝ අවසර දෙනු නොලැබේ.

6. මෙහිලා පිළිගැනුණු ටෙන්ඩරය එව්වනු විසින්, වාහනය නොහොත් වාහන සඳහා ගෙවීමට කැමැති වුණු මිලය නොහොත් මිලයන් ටෙන්ඩරය පිළිගැනුණු බව නිවේදනය වී හත් (7) දිනක් ඉක්මීමට කලින් ග්‍රාමසංවර්ධන සහ කුඩා කර්මාන්ත අධ්‍යක්ෂක තැනට සම්පූර්ණයෙන් ගෙවිය යුතු යි. එසේ ම මුදල් ගෙවා තුන් දිනක් ඇතුලත ඔහු විසින් ඒ වාහනය නොහොත් වාහන බාර ගෙන, දැනට තිබෙන තැනින් ඉවත් කරගත යුතු වෙයි.

7. ඉහළින් එන 6 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට එකඟව ක්‍රියා නොකළහොත් ටෙන්ඩර තැන්පත් මුදල් රජය සන්තක වන බව ද සැලැකිය යුතු වේ.

8. ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර එවූ සියලුදෙනාට එහි පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර විවෘත කැරෙන්නේ 1965 සැප්තැම්බර් 24 වැනි පෙරවරු 10 ට ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත අධ්‍යක්ෂක තැනගේ කාර්යාලයෙහි දී ය.

9. ටෙන්ඩර ඉදිරිපත් කරන්නෝ සිය ටෙන්ඩර ලියාපදිංචි කළ තැපැලෙන් එවීමට නොකැමැති වෙත් නම්, ඔවුන් විසින් ඒ ටෙන්ඩර "අස් කැරෙන මෝටර් වාහන මිලයට ගැනීමට ටෙන්ඩරය" යනු සඳහන් ලියුම් කොපුවල බහා අස්තබා ඒ ඒ ටෙන්ඩරය ඉදිරිපත් කරන්නහු ගේ නම සහ ලියුම් යොමුවට සඳහන් කොට ටෙන්ඩර් බාරගන්නා අන්තිම දින, පෙ.ව. 9.30 ට නොහොත් එයට කලින් ගෙනවුත්, පෞද්ගලිකව හෝ නියෝජිතයෙකු මුහින් හෝ ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ කාර්යාලය සහකාර නිලධාරී තැනගේ කාර්යාලයේ ඇති ටෙන්ඩර පෙට්ටියේ තැන්පත් කළ යුතු යි.

පී. එච්. පී. ද සිල්වා,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත
අධ්‍යක්ෂක.

9-155—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දඹරාව වැඩ ප්‍රතිසංස්කරණය කිරීම

මහනුවර උප කොට්ඨාශයේ දඹරාව වැව වැඩිදියුණු කිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 30,000 කට හෝ වැඩි ගණනකට ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන්, සමූපකාර සමිති වලින්, ග්‍රාමසංවර්ධන සමිතිවලින් මහනුවර මධ්‍යම කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැන විසින් 1965 සැප්තැම්බර් මස 29 වැනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ. භාර ගැනීම අවසන් වූ විගස ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

2. 1965 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 27 වැනි දින දක්වා කාර්යාල වේලාවන් තුළදී මහනුවර, මාතලේ, හඟුරන්කෙත මිනිපේ සහ නුවරඑළිය, උප කොට්ඨාශීය වාරිමාර්ග කාර්යාලවලින් ලබාගත හැකි පෝරම වල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. සමිතිහැර අනෙක් කොන්ත්‍රාත්කරුවන් පෝරම ලබාගැනීමට රුපියල් 50 ක තැන්පත් මුදලක් ඉහත කී කාර්යාල වලට හෝ ඕනෑම කච්චේරියකට ගෙවා ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළයුතුය.

3. මෙම වැඩය සඳහා අවශ්‍ය සිමෙන්ති, යකඩ, සහ හසියුම් පයිප්ප දෙපාර්තමේන්තුව මගින් සපයනු ලැබේ.

4. වැඩිවිස්තර සඳහා මහනුවර උප කොට්ඨාශභාර නිලධාරීතැන ගෙන් විමසන්න.

ඩී. ඒජ්. බාත්ලෝ,
වාරිමාර්ග උප කොට්ඨාශීය නිලධාරීතැන,
මහනුවර උප කොට්ඨාශය.

1965 අගෝස්තු මස 20 වැනි දින,
මහනුවර මාර්ගිමාර්ග කාර්යාලයේ දී.

9-30—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### මහියංගන උප කොට්ඨාශය

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 16,000 ට හෝ ඊට වැඩි මුදලකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ගෙන් මහියංගන උප කොටසට අයත් මොණරවාන ව්‍යාපාරයේ වම්ඉවුරු ප්‍රධාන ඇළෙහි පළමුවෙනි සැතපුම කැපීම සඳහා ටෙන්ඩර්පත්, ඌව කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1965 සැප්තැම්බර් මස 15 වෙනි බදාදා පෙරවරු 10 තෙක් බාර ගනු ලැබේ.

2. 1965 සැප්තැම්බර් මස 13 වෙනි දින පස්වරු 4.30 දක්වා මහියංගන බදුල්ල හෝ මොණරාගල වාරිමාර්ග කාර්යාලවලින් කාර්යාලයීය වේලාවන්හිදී රු. 25 ක මුදලක් තැන්පත් කිරීමෙන් පසු ටෙන්ඩර් පෝරම ලබාගත හැක. ටෙන්ඩර් පෝරම පිටපත් දෙකකින් යුතුව සකස් කොට 1965 සැප්තැම්බර් මස 15 වෙනි දින පෙරවරු 10ට පෙර ඌව කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැන වෙත සීල් තැබූ කවරයක බහා ලියා පදිංචි තැපැලෙන් එවිය යුතුය. ටෙන්ඩර්පත් විවෘත කිරීම 1965 සැප්තැම්බර් මස 15 වෙනි දින පෙරවරු 10ට එම කාර්යාලයේදී සිදු කරනු ලැබේ.

3. දැනට රජයේ කොන්ත්‍රාත් බාරගෙන වැඩ කරන කොන්ත්‍රාත් කරුවන් විසින් එම වැඩකිරීම කොතෙක් දුරට සාර්ථක ඇයි දැන ගැනීම සඳහා, එම වැඩ සම්බන්ධ වග කිවයුතු නිලධාරියෙකුගෙන් ලබා ගන්නා ලද සහතිකයක් ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කිරීමේදී ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත් බහා එවන කවරයේ වම් කෙළවරෙහි "මහියංගන උ. කො. මොණරවාන ව්‍යාපාරය සඳහා ටෙන්ඩර්" යන්න සඳහන් කළ යුතු ය.

මේ පිළිබඳ වැඩි විස්තර මහියංගන උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිය.

එන්. කන්දසාමි,
වාරිමාර්ග ඉංජිනේරු—මහියංගන උ. කො.

1965 අගෝස්තු මස 23 දින,
මහියංගන වාරිමාර්ග කාර්යාලයේදීය.

9-28—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මහනුවර උප කොට්ඨාශය

මහනුවර උප කොට්ඨාශයේ පහත සඳහන් වැඩ සඳහා එහි දක්වා ඇති ප්‍රමාණයන්ට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන්, සමුපකාර සමිතිවලින් හා ග්‍රාමසංවර්ධන සමිතිවලින් 1965 සැප්තැම්බර් මස 29 වැනි දින පෙරවරු 10 දක්වා මහනුවර මධ්‍යම කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් භාරගනු ලැබේ:—

(1) මුරපොල ඇල ප්‍රගුණ කිරීමේ සැතපුම් 0 සිට 1/2 දක්වා ඇලේ සක්ක බැමි බැඳීම, ඇල කොන්ක්‍රීට්වලින් බැඳීම සහ ඒ සඳහා යකඩ කූරු සවි කිරීම—රු. 40,000.

(2) මුරපොල ඇල ප්‍රගුණ කිරීමේ සැතපුම් 1/2 සිට 1 දක්වා ඇලේ සක්කබැමි බැඳීම, ඇල කොන්ක්‍රීට්වලින් බැඳීම සහ ඒ සඳහා යකඩ කූරු සවිකිරීම—රු. 40,000.

(3) මුරපොල ඇල ප්‍රගුණ කිරීමේ 1 වැනි සැතපුමේ ඇල කැපීමේ කැලය එළිකිරීම, පස් වැඩ, ගල් කැඩීම සහ පිඩැලි ඇල්ලීම—රු. 35,000.

(4) මුරපොල ඇල ප්‍රගුණ කිරීමේ පළමුවන සැතපුමේ ඇලේ නිර්මානයන් ගොඩනැගීම—රුපියල් 15,000.

2. 1965 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 27 වැනි දින දක්වා මහනුවර, මාතලේ, ගසලක, මිනිපේ හෝ නුවරඑළිය, වාරිමාර්ග කායභීලවලින් ලබාගත හැකි ෆෝරමවල ටෙන්ඩර් පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ෆෝරම ඉල්ලීමේ දී ලියාපදිංචි පොත් ඉදිරිපත් කළ යුතුය. දැනටමත් දෙපාර්තමේන්තුවේ වැඩ තමා යටතේ ඇති කොන්ත්‍රාත්කරුවන්ට ෆෝර්ම දිය යුතු දැයි සලකා බැලීම පිණිස ඒ පිළිබඳව විස්තර හා ප්‍රගතිය සඳහන් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය. සමිති හැර සෙසු අය ටෙන්ඩර් ෆෝරම ලබ ගැනීමට අංක (1), (2) හා (3) සඳහන් වැඩට රුපියල් 50ක සහ අංක (4) සඳහා රුපියල් 25ක තැන්පත් මුදලක් ගෙවිය යුතුය. එම මුදල ඉහත සඳහන් කායභීලවල හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ඉදිරිපත් කළ හැක.

3. මෙම වැඩවලට අවශ්‍ය සිමෙන්ති හා යකඩ පමණක් දෙපාර්තමේන්තුව මගින් කුණ්ඩසාලේ පිහිටි ගබඩාව අසලදී සපයනු ලැබේ.

4. වැඩි විස්තර සඳහා මහනුවර උප කොට්ඨාශ භාර නිලධාරි තැනගෙන් කායභීල වේලාවන් තුලදී විමසන්න.

ඕ. ආර්ජ්. බාත්ලෝ,
උප කොට්ඨාශ නිලධාරී,
මහනුවර උප කොට්ඨාශය.

1965 අගෝස්තු මස 24 වැනි දින,
මහනුවර වාරිමාර්ග කායභීලයේදී.

9-74—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—නිකවැරටිය උප කොට්ඨාශය

1965.10.1 සිට 1966.9.30 වෙනි දින දක්වාවූ මුදල් වර්ෂය තුළ මාහෝ දුම්රිය ස්ථානයේ සිට නිකවැරටියේ වාරිමාර්ග කාර්යාලයේ බඩු ගබඩාවට සහ එහි සිට වැඩපළවලට බඩු බාහිරාදිය ගෙනයාම සඳහා ටෙන්ඩර් පත්‍ර වයඹ කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් 1965 සැප්තැම්බර් 28 වෙනි අඟහරුවාදා පෙරවරු 10 වන තෙක් භාරගනු ලැබේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 15,000කට සහ ඊට වැඩි ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවෝ පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසු වෙති. 1965 සැප්තැම්බර් 24 වෙනි සිකුරාදා පස්වරු 4.30 වනතෙක් නිකවැරටියේ උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි ෆෝර්මවල දෙපිටපතකින් යුතුව ටෙන්ඩර් ෆෝර්ම සකස් කළ යුතුයි. කොළඹ වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කොට, ඒ වෙනුවෙන් ලබාගත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කර ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැකිය.

1965 සැප්තැම්බර් මස 28 වැනි අඟහරුවාදා පෙරවරු 10ට ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් අයදුම්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ.

ටෙන්ඩර් කොන්දේසි ඇතුළත් වැඩි විස්තර නිකවැරටිය වාරිමාර්ග උප කොට්ඨාශ කාර්යාලයෙන් ලබාගත හැක.

ඒ. සුන්දරම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන, නිකවැරටිය උ. කො.

1965.8.26 දින,
නිකවැරටිය වාරිමාර්ග කාර්යාලයේදීය.

9-96—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—නුවරඑළිය උප කොට්ඨාශය

නුවරඑළිය දිස්ත්‍රික්කයේ නුවරඑළියේ වාරිමාර්ග උප කොට්ඨාශයේ ගබඩා ද්‍රව්‍ය ප්‍රවාහණය සඳහා මහනුවර මධ්‍යම කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1965 සැප්තැම්බර් මස 29 වෙනි දින දහවල් භ.ග 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

කොන්ත්‍රාත්කරුගේ ලියාපදිංචි ප්‍රමාණය රු. 15,000 හෝ ඊට වැඩි විය යුතුය. ටෙන්ඩර් තැන්පත් මුදල රු. 25 කි.

1965.9.3 වෙනි දින සිට 1965.9.27 දින දක්වා කාර්යාල වේලාවන් තුළ දී නුවරඑළිය, මහනුවර, මාතලේ, හසලක සහ මිනිපේ යන වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කාර්යාලවලින් ලබාගත හැකි ෆෝර්මවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් පත් සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩද ඒවායේ වටිනාකමද ඒවායේ වැඩ සුදුසු ලෙස ප්‍රගතියේ ඇති බැව් දක්වෙන ප්‍රකාශයක් එම ඉංජිනේරු තැනගෙන් ලබාගෙන ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතු ද යන්න සලකා බැලීමට නුවරඑළියේ වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් තැන්පත් මුදල වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

ඒ. ඇස්. ද සිල්වා,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
නුවරඑළිය උප කොට්ඨාශය.

9-93—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මාතලේ උප කොට්ඨාශය

මාතලේ දිස්ත්‍රික්කයේ නබරල වැව ව්‍යාපාර යටතේ වම් ඉවුරේ ප්‍රධාන ඇල ඉදිකිරීම සම්බන්ධයෙන් 1965 අගෝස්තු මස 27 වැනි දින දරණ රජයේ ගැසට් පත්‍රයේ පළවන දැන්වීම සම්බන්ධවයි.

මෙම වැඩය සඳහා ටෙන්ඩර් පත් භාරගැනීමේ අවසාන දිනය 1965 සැප්තැම්බර් මස 22 වෙනි දින තෙක් දීර්ඝ කරණ ලදී.

ආර්. සෝමසුන්දරම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
මාතලේ උප කොට්ඨාශය.

9-126—65.9.3 දින අංක 61,466 දරන ගැසට් පත්‍රය

---

## ආහාර දෙපාර්තමේන්තුව

අංක 14,458 සහ 65.7.23 දාතම දරණ ලංකා රජයේ ගැසට් පත්‍රයෙහි සඳහන් ටෙන්ඩර් දැන්වීමෙහි දැක්වෙන ලොරි වැසි 50 සඳහා ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය 1965.9.21 දින 2.30 දක්වා කල් දමන ලදී. අයදුම්කරුවන් විසින් මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සිං 1965.9.20 දින දහවල් 12ට පෙර, ආහාර කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගත හැක.

පී. ඒ. සිල්වා,
ආහාර කොමසාරිස්.

1965.9.1,
කොළඹ 2,
ගුණියන් පෙදෙසේ,
ආහාර කොමසාරිස් කායභීලයේදීය.

9-242—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පැල්වෙහෙර හා මහඉළුප්පල්ලම පාසැල් ගොවිපලවල නිෂ්පාදන ද්‍රව්‍ය විකිණීම

උක්ත මැයෙන් 1965 අගෝස්තු මස 20 වැනි දින ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළවූ නිවේදනයෙහි, පැල්වෙහෙර ගොවිපලේ විකිණීම සඳහා ඇති මිරිස් ඇසුරු ප්‍රමාණය රාත්තල් 600 ක් පමණ නොව රාත්තල් 1,400 (එක් දහස් හාරසීයක්) පමණ බව සැළකිය යුතුය.

ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය 1965 සැප්තැම්බර් මස 10 වැනි දින පස්වරු 2.30 දක්වා දීර්ඝ කර ඇත.

ඩී. සී. එල්. අමරසිංහ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1965.8.27 වැනි දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදීය.

9-131—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### (නියමිත මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම)

කොළඹ එඩින්බරෝ චන්ද්‍රවංක අංක 42 ස්ථානයෙහි ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් මුතූර් හි සහ කිලිවෙඩ්ඩි හි පිහිටි නියමිත මිල යෝජනා ක්‍රම ගබඩාවල් සිට ත්‍රිකුණාමලය දක්වා (මුහුදු ප්‍රවාහනය ද ඇතුළුව) ප්‍රවාහන සේවා 1965.10.1 සිට 1966.9.30 වර්ෂය දක්වා සැපයීම සඳහා කැඳවනු ලබන ටැන්ඩර පත් 1965 සැප්තැම්බර් 24 වෙනි සිකුරාදා අ. භා. 2.30 වනතෙක් භාරගනු ලැබේ.

2. දිවයිනේ කච්චේරියකට හෝ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අංක 60, හෝර්ටන් පෙදෙස කාර්යාලයේ ගණකාධිකාරි තැනට රු. 50 ක මුදලක් ගෙවා ලබාගන්නාලද කුවිතාන්සියක් දෙපාර්තමේන්තුවේ අංක 42, එඩින්බරෝ චන්ද්‍රවංක කාර්යාලයේ ටැන්ඩර් අංශයට ඉදිරිපත් කොට ලබාගන්නා ලද ටැන්ඩර් පත් අනුපිට පතක්ද සහිතව පුරවා එවිය යුතුයි. 1965 සැප්තැම්බර් 21 වෙනි සිකුරාදා දවල් 12 වනතෙක් ටැන්ඩර් නිකුත් කරනු ලැබේ.

3. වැඩිපුර විස්තර මෙම කාර්යාලයෙන් හෝ ත්‍රිකුණාමලෙහි පිහිටි ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් විමසා දැනගත හැක.

කේ. සිත්තම්බලම්,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
42, එඩින්බරෝ චන්ද්‍රවංක, කොළඹ 7,
1965.9.3 දින.

9-123—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කන්තලේ වී ගොවිපලේ මඩි වී බුසල් 236 ක් විකිණීම

වවුනියාවේ ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් කන්තලේ වී ගොවිපලේ විකිණීම සඳහා ඇති මඩි වී බුසල් 236 ක් සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත් 1965.9.17 වන දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ. වී, ගොවිපල් කළමනාකාර තැන සමග ගොවිපලේ වැඩ කරන වේලාවේදී පරීක්ෂා කර බැලිය හැකිය.

2. මිළ ගණන් සඳහන් කළ යුත්තේ වී බුසලක් සඳහායි.

3. ටෙන්ඩර් පෝරම වවුනියාවේ කෘෂිකර්ම නිලධාරි (ගොවිපල් පාලනය හා නිෂ්පාදනය) තැන විසින් ටෙන්ඩර් භාර ගන්නා අන්තිම දින දවල් 12 දක්වා නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝරම එසේ නිකුත් කරනු ලබන්නේ, එක් ටෙන්ඩරයක් සඳහා රු. 50 ක් බැගින් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසුවය. මුදල් තැන්පත් කිරීම ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ හැකිය.

4. ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන් වවුනියාවේ ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන නමට එවිය යුතු අතර, ලියුම් කවරයේ වම් කෙළවරේ "මඩි වී විකිණීම සඳහා ටෙන්ඩරය—වී ගොවිපල, කන්තලේ" යනුවෙන් සඳහන් කළ යුතුය.

5. තෝරා ගනු ලබන ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය භාරගත් බව දන්වා සතියක් ඇතුළතදී වී මිළදී රැගෙන යා යුතුය.

6. වැඩි විස්තර කන්තලේ ගොවිපල කළමනාකාර තැනගෙන් ලබා ගත හැකිය.

ඩී. සී. එල්. අමරසිංහ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1965.8.25 දින,
පේරාදෙණියේදීය.

9-128—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කෘෂිකර්ම රසායන ද්‍රව්‍ය සැපයීම

කොළඹ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් කෘෂිකාර්මික රසායන ද්‍රව්‍ය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට සැපයීම සඳහා 1965 සැප්තැම්බර් මස 17 දින පස්වරු 2.30 දක්වා ටෙන්ඩර්පත්‍ර භාරගනු ලැබේ. ඇසිරීම් තීරුබද්දු ප්‍රවාහන හා වාහනවලට පැටවීම ආදිය ඇතුළත්ව පහත සඳහන් ප්‍රමාණවලට අසුරන ලද මෙම ද්‍රව්‍ය කොළඹ, නාරාහේන්පිට කෘෂිකර්ම මධ්‍යම ගබඩාවට ගෙන ගොස් භාර දිය හැකි මිළ සඳහන් කරන ලෙස ටෙන්ඩර්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ:—

| කෘෂිකාර්මික රසායන ද්‍රව්‍ය විස්තර | අසුරන ලද ප්‍රමාණය | අවශ්‍ය වෙතැයි සිතන ප්‍රමාණය |
|---|---|---|
| 1. ඩී. ඩී. ටී. 25% සාන්ද්‍ර පෙනලෝද්‍ය ... | අවු. 16 හෝ 24 ඊ... බෝතල්වල | බෝතල් 2,000 |
| 2. ලෙපටික් ඩයිමිතයිල් ඩයින... හෝ කාබමේට | අවු. 8 වෙ පැකට්වල | පැකට් 1,000 |

ඉහත දක්වා ඇති කෘෂි-රසායනික ද්‍රව්‍ය එහි සඳහන් වී ඇති ආකාරයට අනුකූල වන බවට නිෂ්පාදකයින්ගෙන් සහතිකයක් ටෙන්ඩර්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුය.

2. කොළඹ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති) ගෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල අනු පිටපතක් ද සහිතව ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. මේ සම්බන්ධයෙන් එවන සෑම ටෙන්ඩරයක් ම කොළඹ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති නමට යැවිය යුතු අතර ටෙන්ඩර් බහාලන කවරයේ වම් පස මුදුන් කෙළවර "කෘෂිකාර්මික රසායන ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතුය.

3. මේ සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කිරීම හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් ඉදිරිපත් කිරීම කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් යොමු කරන්නේ නම් ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ද කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "කෘෂිකාර්මික රසායන ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් ද සඳහන් කොට මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර, ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් ටෙන්ඩර් භාර ගැනීමට බලය ලත් නිලධාරි තැන වූ කොළඹ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පරිපාලන නිලධාරි (ව්‍යාප්ති) වෙත පෞද්ගලිකව භාර දී ලැබුණු බවට කුවිතාන්සියක් ලබා ගත යුතුය. එවනු ලබන ටෙන්ඩර් පත්‍රවල ඒ සඳහා සපයා ඇති ස්ථානයෙහි ටෙන්ඩර්කරු විසින් යථා පරිදි අත්සන් කරන ලද, ටෙන්ඩර් කොන්දේසිවල පිටපතක් ද තිබිය යුතුය.

4. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම්, ඔවුන්ට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයින්ට ටෙන්ඩර් විවෘත කරන වේලාවෙහි පැමිණ සිටීමට හෝ ඒ වේලාවෙහි තම තමන්ගේ ටෙන්ඩර් පත්‍රවල අනු පිටපතක් පරීක්ෂා කර බැලීමට අවසර දෙනු ලැබේ. කොළඹ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දින ඉහත කී වේලාවට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

5. ටෙන්ඩරයකට රුපියල් 100 බැගින් තැන්පත් කළ බවට ඉදිරිපත් කරන කුවිතාන්සිය මත 1965 සැප්තැම්බර් මස 17 දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. කොළඹ, මහා භාණ්ඩාගාරයෙහි, තමන් කැමති කච්චේරියක හෝ පේරාදෙණියේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි මෙම මුදල තැන්පත් කළ යුතු ය.

6. නියමිත පෝරමයේ ඇතුළත ලියන ලද, හා එහි නියමිත කොන්දේසිවලට සම්පූර්ණයෙන් අනුකූල නොවන කිසිම ටෙන්ඩරයක්, ටෙන්ඩරයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් හා ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාක් මෙන් ම, යම්කිසි වෙනස් කිරීමක් හෝ මැකීමක් ඇතොත් එතැනට ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යෙදිය යුතුය.

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අංක 14,486 හා 65.8.20 වැනි දින දරණ රජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡෙදයේ, පිටු අංක 1,109යේ පළවූ අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ආයතනයන්ට ලෙලි ගැලවූ පොල් සැපයීම, කුකුල් මස් සැපයීම හා ගව මස් සැපයීම සඳහා වූ ටෙන්ඩර් දැන්වීම් 3 තේ ටෙන්ඩර් බාර ගැනීමේ අවසාන දිනය 1965 සැප්තැම්බර් මස 10 වැනි සිකුරාදා නොව, 1965 සැප්තැම්බර් මස 13 වැනි සඳුදා යනු වෙන් නිවැරදි විය යුතුයි.

1965 සැප්තැම්බර් මස 13 වැනි සඳුදා දවල් 12 දක්වා ටෙන්ඩර් පෝරම ලබාගත හැක.

පී. ජී. ජී. බම්බිද්ද,
වැඩ බලන අලෙවිකිරීමේ කොමසාරිස් වෙනුවට.

1965.8.30 වැනි දින,
කොළඹ 1,
අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවේදීය.

9–160—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### 1964/65 වර්ෂයේ දෙවන භාගය සඳහා ගොඩනැගිලි උපකරණ සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර

පහත සඳහන් ව්‍යාපාරයන් වෙනුවෙන් ගොඩනැගිලි උපකරණ සැපයීම සඳහා පොළොන්නරුවේ ඉඩම් සංවර්ධන නිලධාරි විසින් 65.9.14 දින පෙ.ව. 10 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. එක් එක් ව්‍යාපාරය සඳහා ටෙන්ඩර් පත්‍ර වෙන් වෙන් වශයෙන් විය යුතුයි :—

(1) මඩකළපුව දිස්ත්‍රික්කයේ මාන්කර්නි සහ පානිච්චන්කර්නි ව්‍යාපාර සඳහා;
(2) මාතලේ දිස්ත්‍රික්කයට අයත් හත්තොට අමුණ, දඹුල්ල සහ අතර ගල්ලෑව ව්‍යාපාර ;
(3) පොළොන්නරුවේ තමන්කඩුව දිස්ත්‍රික්කයට අයත් කවුඩුළුවැව, මින්නේරිය, පොළොන්නරුවේ පොදු ගොඩනැගිලි අංශය, බකමූන සහ කන්දකාඩු ව්‍යාපාර.

### අවශ්‍ය ගොඩනැගිලි උපකරණ විස්තර

(1) පොල් අතු (දිගින් අඩි 70 අඩු නොවූ අහල් 18ක් පළලවූ ඉරු දෙකේ පොල් අතු 1,000ක් බැගින්) ;
(2) අලුහුණු (බුසල් ගණනින්)—(බුසලක් රු. 440 අඩු නොවිය යුතුයි);
(3) තම්බාපු හුණු (බුසල් ගණනින්-බුසලක් රු. 850 නොඅඩු) ;
(4) කලුගල් (කියුබ් ගණනින්—අහල් 6 සිට 9 දක්වා) ;
(5) තලාපු ගල් (කියුබ් ගණනින් 3/4" ප්‍රමාණය) ;
(6) තලාපු ගල් (කියුබ් ගණනින් —1" ප්‍රමාණය) ;
(7) තලාපු ගල් (කියුබ් ගණනින් —1½" ප්‍රමාණය) ;
(8) තලාපු ගල් (කියුබ් ගණනින්—2" ප්‍රමාණය) ;
(9) පිලුස්සූ ගඩොල් (සම්මත ප්‍රමාණය 8¾"×4¼"×2¾" —1,000 බැගින්)
10. ගංගා වැලි (කියුබ් ගණනින්).

2. ගෙනැවිත් භාර දීම සඳහා වෙන වෙනම මිල ගණනින් දක්විය යුතුයි :—

(අ) වන්නෙන්, පෝරනුවෙන්, ගල්වලෙන් (ලොරියෙන් ගෙනයා හැකි විය යුතුයි) ;

(ආ) වැඩපලට.

3. ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට මත්තෙන් මෙම කාර්යාලයේ හෝ කච්චේරියේ හෝ ඒ ඒ ව්‍යාපාරයනට වෙන වෙනම රු. 50 බැගින් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුයි.

4. 1965.9.13 දින පෙ. ව. 11 දක්වා ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

5. පිළිගනු ලැබූ ටෙන්ඩර්කරු මා නියෝග කරනු ලබන දින සිට සති දෙකක් ඇතුලතදී උපකරණ සැපයිය යුතුයි. යමෙක් එය පැහැර හැරිය හොත් හෝ සැපයීමට අසමත් වුව හොත් හෝ ඔහුගේ තැන්පත් මුදල රාජ සන්තක වනවා ත් හැර, ඔහුගේ නම ද රජයේ කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වන්නේය.

6. කැමති ටෙන්ඩර්කරුවෙකුට, ටෙන්ඩර් විවෘත කරන වේලාව වන 1965.9.14 දින පෙ. ව. 110 ඉදිරිපත් විය හැකිය.

7. වැඩි විස්තර පොළොන්නරුවේ ඉඩම් සංවර්ධන නිලධාරි තැනගෙන් ලබා ගත හැක.

ආර්. සැන්ට් පී. ඇස්. ද කෝස්තා,
පොළොන්නරුවේ ඉඩම් සංවර්ධන නිලධාරි.

1965.1.19 දින, පොළොන්නරුවේ
ඉඩම් සංවර්ධන කාර්යාලයේ දී ය.

9–180—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### කිරුළපනේ මධ්‍යම ගබඩාව හා වැඩපලෙහි සහ මාන්කුලම් ඉඩම් සංවර්ධන කාර්යාලයෙහි සේවයට නුසුදුසු මෝටර් වාහන විකිණීම සඳහා ටෙන්ඩර්

පහත සඳහන් සේවයට නුසුදුසු මෝටර් වාහන විකිණීම සඳහා 65.9.17 වන දින පෙරවරු 11 දක්වා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක තැන විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ :—

**කිරුළපන මධ්‍යම වැඩපල :**

| | | |
|---|---|---|
| වැයි පමණක් ... | සීඅැන්. 1415—මොරිස් කොමර්ෂල් ලොරිය | (පෙට්‍රල්) |
| | අයිසී. 1382—ඔස්ටින් ලොරිය | (ඩීසල්) |
| | අයිසී. 3575—ඔස්ටින් බී. ඇම්. සී. ලොරිය | (ඩීසල්) |
| | සීඇල්.9843—බෙඩ්ෆෝඩ් ලොරිය | (පෙට්‍රල්) |
| | ඊවයි. 4904—විලීස් ජීප් රථය | (පෙට්‍රල්) |
| | සීවයි. 1175—ෆෝඩ් ලොරිය | (පෙට්‍රල්) |
| එන්ජින් රහිත ... | අයිසී. 1995—ජෝඩසන් ලොරිය | (ඩීසල්) |
| | අයිසී. 1670—ඔස්ටින් ලොරිය | (ඩීසල්) |
| | අයිසී. 1997—ජොඩසන් ලොරිය | (ඩීසල්) |
| | අයිසී. 1112—ඔස්ටින් ලොරිය | (ඩීසල්) |
| | අයිසී. 3592—ඔස්ටින් බී. ඇම්. සී. ලොරිය | (ඩීසල්) |
| | අයිසී. 3778—ඔස්ටින් බී. ඇම්. සී. ලොරිය | (ඩීසල්) |
| | අයිසී. 1083—ඔස්ටින් ලොරිය | (ඩීසල්) |
| | අයිසී. 1942—ජොඩසන් ලොරිය | (ඩීසල්) |
| | අයිසී. [illegible]3 —ඔස්ටින් ලොරිය | (ඩීසල්) |
| | අයිසී. 1987—ජොඩසන් ලොරිය | (ඩීසල්) |
| ඇන්ජින් සහිත ... | සීඅැන්. 1452—මොරිස් කොමර්ෂල් ලොරිය | (පෙට්‍රල්) |
| | අයිසී. 1123—ඔස්ටින් ලොරිය | (ඩීසල්) |
| | අයිසී. 1104—ඔස්ටින් ලොරිය | (ඩීසල්) |
| | අයිසී. 1099—ඔස්ටින් ලොරිය | (ඩීසල්) |
| | අයිසී. 1151 —ඔස්ටින් ලොරිය | (ඩීසල්) |

**මාන්කුලම් ඉඩම් සංවර්ධන කාර්යාලය :**

| | | |
|---|---|---|
| ඇන්ජින් රහිත .. | අයිසී. 1839—ජෝඩසන් තැංකිය | (ඩීසල්) |

2. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් 1965 සැප්තැම්බර් මස 16 වෙනි දින දවල් 12.වන තෙක් ලබා ගත හැකි ටෙන්ඩර් පෝරමයක අනු පිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. කොළඹ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයෙහි හෝ ලංකා බැංකුවේ (යෝර්ක් වීදියේ) ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක තැනගේ අංක 1 දරණ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක රුපියල් 100 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩර් පෝරම බහාලූ කවරය මුද්‍රා තබා එහි උඩ වම් කෙළවරෙහි "සේවයට නුසුදුසු රථවාහන මිළ දී ගැනීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති, ඇවිලන් චතුරශ්‍රය, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ තමා විසින් ම ගෙනැවිත් දීමෙන් හෝ තමාගේ නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ ප්‍රධාන ගණකාධිකාරි තැනට භාර දී ලැබුන බව හැඟවීමේ කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. කොළඹ ඇවිලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ දී 1965 සැප්තැම්බර් මස 17 වෙනි දින, පෙරවරු 11 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

5. ටෙන්ඩර් කිරීමට අපේක්ෂා කරන්නන් එසේ කිරීමට ප්‍රථමයෙන් කිරිළපොත මධ්‍යම වැඩපොළෙහිදී හා මාන්කුලම්හිදී වාහන පරීක්ෂා කළ යුතුයි. ටෙන්ඩර්යේ ඇතිවන සියළුම වෙනස් කිරීම් හා මැකීම් ටෙන්ඩර් කරු විසින් සහතික කළ යුතුයි.

6. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් තමන්ගේ ටෙන්ඩරය පිළිගත් බැව් දන්වූ විට ටෙන්ඩර් කරනු ලැබූ මුදල දින 10 ක් ඇතුළත දී ගෙවිය යුතුයි. ඊට පසු දින 14 ක් ඇතුලත දී ගන්නා ලද වාහන අස්කර ගත යුතුයි. බැහැර කිරීම සඳහා තමන් විසින්ම පිළිවෙලක් යොදා ගත යුතුයි. නියමිත කාලය තුළදී අස් කරගනු නොලබන සියළුම වාහන ආදිය නැවත විකිණීමෙන් හෝ අන් අයුරකින් හෝ ඉවත් කරනු ලැබේ. ඊට පසු ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අනුදැනුම ඇතිව විනා අන් කිසිම අයුරකින් වාහන සඳහා ඉදිරිපත් විය නොහැක. යම් හෙයකින් සාර්ථක වූ ටෙන්ඩර්කරු කොන්ත්‍රාත්තුව පැහැර හැරිය හොත් ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක වනවා පමණක් නොව, රජයේ කොන්දේසි කඩ කරන කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයටද ඔහුගේ නම ඇතුලත් වන්නේය.

7. කැමති වාහන ගණනකට හෝ සියල්ලටම ටෙන්ඩර් ඉදිරිපත් කළ හැකි අතර, ටෙන්ඩර් පත්‍ර මුළුමනින්ම හෝ කොටස් වශයෙන් භාරගැනීමේ හෝ නොගැනීමේ අයිතිය රජය සතුය.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
ඇවිලන් චතුරශ්‍රය, කොළඹ 1,
1965.8.28

9–181—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### සී. ඇන්. 8598, සී. ඇන්. 9015 සහ සී. ඇන්. 8817 දරණ පාවිච්චි කළ නොහැකි ලොරි විකිණීම සඳහා ටෙන්ඩර්

කොළඹ, බොරැල්ලේ, කාසල් වීදියේ අංක 100 දරණ ස්ථානයේ ඇති, පාවිච්චියට ගත නොහැකි පහත සඳහන් ලොරි, මිළට ගෙන ඉවත් කිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වරයා විසින් 1965 සැප්තැම්බර් මස 30 වෙනි දින සවස 2.30 දක්වා භාරගනු ලැබේ:—

(i) අංක සී.ඇන්. 8817 දරණ ලොරිය චැසි අංකය: බීබී18-7244081, ඇන්ජින් අංකය: බීබී 18-7244081. වර්ගය: ෆෝඩ්සන් තේම්ස්, පළමු ලියාපදිංචියෙහි දිනය: 1951.8.21.

(ii) අංක සී. ඇන් 8598 දරණ ලොරිය. චැසි අංකය: බීබී18-7231525, ඇන්ජින් අංකය: බීබී 18-7231525. වර්ගය: ෆෝඩ්සන් තේම්ස්, පළමු ලියා පදිංචියෙහි දිනය: 1951.8.1.

(iii) අංක සී. ඇන්. 9015 දරණ ලොරිය, චැසි අංකය: බීබී 18-7244084, ඇන්ජින් අංකය: බීබී 18-7244084, වර්ගය: ෆෝඩ්සන් තේම්ස්, පළමු ලියා පදිංචියෙහි දිනය: 1951.8.28.

2. ටෙන්ඩර්කරු විසින්ම පිළියෙල කරගත් ටෙන්ඩර් ෆෝරම්වල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුවේ. ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 50 ක් ඕනෑම කච්චේරියකදී ගෙවා ඒ වෙනුවෙන් ලද කුවිතාන්සියක් ටෙන්ඩරය සමඟ ඉදිරිපත් කළ යුතුය. එක් එක් වාහනය වෙනුවෙන් ගෙවීමට සූදානම් මුදල වෙන වෙනම දැක්වීම අවශ්‍යය. ටෙන්ඩරයේ කර ඇති සංශෝධන හා මකා දැමීම්, ටෙන්ඩර්කරු විසින් සහතික කළ යුතුවේ. ටෙන්ඩර් පත්‍ර මෙම කාර්යාලයට ලැබුණායින් පසුව ඒවා ඉවත් කර ගැනීමට ටෙන්ඩර් කරුවන්ට ඉඩ දෙනු නොලැබේ.

ලැබුණාවූ යම්කිසි ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම හෝ හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය රජය සතුවේ.

3. ටෙන්ඩර් පත්‍ර, මුද්‍රා තබන ලද කවර වල බහා කවරයේ වම් කෙළවරේ "පාවිච්චි කළ නොහැකි ලොරි විකිණීම" යනුවෙන් සලකුණු කොට 1965 සැප්තැම්බර් මස 30 වෙනි දින සවස 2.30 ට පෙර කොළඹ, මහලේකම් කාර්යාලය, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලය, යන ලිපිනයට, ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය.

4. 1965 සැප්තැම්බර් මස 30 වෙනි දින සවස 2.30 ට කොළඹ 1, මහලේකම් කාර්යාලයේ තුන්වන මහලේ, අංක 357 දරණ කාමරයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයෙකුට එහි පැමිණ සිටිය හැක.

තමාගේ ටෙන්ඩරය භාරගත් බව දන්වා සතියක් ඇතුළත, තමා ටෙන්ඩර් කළ සම්පූර්ණ මුදල, මුදලින්ම ගෙවා වාහන ඉවත් කිරීමට, සාර්ථක ටෙන්ඩර්කරු සූදානමින් සිටිය යුතුය. කොන්දේසි කඩකරන ටෙන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල් රාජසන්තක කරනු ලැබේ.

5. මෙම කාර්යාලයෙන් කලින් ලබාගත් අවසරයක් අනුව රාජකාරි කාලවේලාව ඇතුළතදී මෙම ලොරි පරීක්ෂා කර බැලිය හැක.

6. මේ සම්බන්ධයෙන් අවශ්‍ය වන වැඩිමනත් තොරතුරු මෙම කාර්යාලයෙන් ලබාගත හැකිය.

කීර්ති වීරක්කොඩි,
අතිරේක ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව,
කොළඹ 1,
1965 අගෝස්තු 28 වැනි දින.

9–84—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### පෝර සැපයීම

1966.3.30 වැනිදයින් අවසන් වන කාල පරිච්ඡේදය වෙනුවෙන් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට පෝර සැපයීම සඳහා මිළ ගණන් ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් 1965 සැප්තැම්බර් 28 වැනි අඟහරුවාදා පෙ. ව. 10 වන තෙක් භාර ගන්නවා ඇත.

රුපියල් 50 ක මුදලක් තැන්පත් කිරීමෙන් අනතුරුව, කොළඹ, ගාළු මුවදොර මහ ලේකම් කාර්යාලයේ ඉඩම් කොමසාරිස් තැනගෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල මිළ ගණන් ඉදිරිපත් කළ යුතුය.

ලැබුණා වූ ඕනෑම මිළ ගණන් පත්‍රයක් හෝ මිළ ගණන් පත්‍ර සියල්ලම හෝ කිසිම හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය, ඉඩම් වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වරයා සතු වන්නේය.

මෙම දැන්වීමට අදාල වැඩි මනත් තොරතුරු, පහත සඳහන් නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

සී. ජේ. සේරසිංහ,
ඉඩම් කොමසාරිස්.

1965 අගෝස්තු 28,
කොළඹ,
ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ
ඉඩම් කොමසාරිස් කාර්යාලයේදීය.

9–103—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### පරෙයිගම පාරට පස් සැපීම

කොළඹ, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉඩම් සංවර්ධන නිලධාරි විසින් කළුතර දිස්ත්‍රික්කයේ පරෙයිගම පාර පිරවීම සඳහා, පස් සැපයීමට කැමති යාබද ඉඩම් හිමියන්ගෙන්, 1965 සැප්තැම්බර් මස 30 දින දහවල් 12 දක්වා මිළ ගණන් කැඳවනු ලැබේ.

පස් කැපීම සහ ඇදීම දෙපාර්තමේන්තුව මගින් කරනු ඇත. තම තමන්ගේ ඉඩම්වලින් පස් සැපයීමට කැමති ඉඩම් හිමියන් පස් කියුබ් එකක් සඳහා ගෙවිය යුතු වැඩිම මිල සඳහන් කළ යුතු අතර, ඉඩමේ සිට ඉහත සඳහන් පාරට ඇති දුර ප්‍රමාණයද සඳහන් කළ යුතුය.

විජය ගුණසිංහ,
ඉඩම් සංවර්ධන නිලධාරි,
(ප්‍රධාන කාර්යාලය).

1965.8.23 දින,
ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 529,
එවිලන් චතුරශ්‍රය,
කොළඹ 1.

9–179—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### අයිතිකරු නොකියන ලද මිනී සහ අජීව උපත් වැළලීම හා අස්කිරීම

මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය 1965 ඔක්තෝබර් මස 1 වැනිද සිට 1966 සැප්තැම්බර් 30 වැනිදායින් අවසන් වන වර්ෂය තුළ මේ සමග ඇති උපලේඛනයේ පළමු වැනි තීරයෙහි දක්වා ඇති අයිතිකාරයින් නොකියන ලද මිනී සහ අජීව උපත් අස්කිරීම හා වැළලීම සඳහා එවනු ලබන සිල් තැබූ ටෙන්ඩර්පත්‍ර ලාංකිකයන්ගෙන් හෝ ලාංකික ආයතනවලින් මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. මෙම කාර්යාලය මගින් සපයන ලද පෝරමවල පමණක් පිටපත් දෙකකින් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

3. මේ සමග ඇති උපලේඛනයේ 4 වෙනි තීරයෙහි සඳහන් දිනට පෙරවරු 10 ට ටෙන්ඩර්පත්‍ර භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැකිය. ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ඔවුන් විසින් ටෙන්ඩර් පත්‍රවල සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින්නන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවකුට ටෙන්ඩර්පත්‍ර පරීක්ෂා කිරීමට අවශ්‍ය වුවහොත් සෞඛ්‍ය සේවා අධිකාරි හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ වෙනත් නිලධාරියකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

4. මේ සමග ඇති උපලේඛනයේ 3 වැනි තීරයෙහි සඳහන් ප්‍රමාණයේ මුදලක් කච්චේරියක තැන්පත් කළ බවට නිකුත් කෙරෙන කුවිතාන්සියක් ටෙන්ඩර්පත්‍රය ලබාගැනීමට පළමුව ඉදිරිපත් කළ යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපාකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර්පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

5. අයදුම්කරුවන් විසින් තැන්පත් කරන ලද මුදලට ලබාගත් කුවිතාන්සි ටෙන්ඩර්පත්‍ර නිකුත් කෙරෙන අවසාන දිනට පෙරදින දහවල් 12 ට පෙර ඉදිරිපත් කර අවශ්‍ය පෝරම ලබා ගත යුතුයි. තැපෑලෙන් පෝරම ඉල්ලුම් කරන අයට මුදල් තැන්පත් කළ කුවිතාන්සි කල් වේලා ඇතිව එවීමෙන් අවසාන දිනට ප්‍රථම ටෙන්ඩර් එවීම සඳහා අවශ්‍ය පෝරම ලබාගත හැකිය.

6. සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර්පත්‍ර ඉල්ලා එවීමට පෙර තම තමන්ගේ වටිනාකම පිළිබඳ තොරතුරු සෞඛ්‍ය සේවා අධිකාරි වෙත දන්විය යුතුයි. මේ සඳහා අවශ්‍ය පෝරම එම කාර්යාලවලින් ලබා ගත හැක.

ටෙන්ඩර්කරුවන්ගේ මුදල් තත්ත්වයේ ස්ථිරභාවය පිළිබඳ තොරතුරු දැනගැනීමට පෙර ඔවුන් විසින් එවන ලද ටෙන්ඩර් පිළිබඳ තීරණයක් කළ නොහැකි බැවින් තම තමන්ගේ වටිනාකම පිළිබඳ තොරතුරු කල්වේලා ඇතිව ඉදිරිපත් කළ යුතුයි.

7. සෑම ටෙන්ඩරයක්ම ඉහත සඳහන් සෞඛ්‍ය සේවා අධිකාරිතැනගේ නමට එවිය යුතුයි. සිල්තැබූ ටෙන්ඩර්පත්‍රය බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා යන්න සඳහන් කළ යුතුයි. ඒ කවරයේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් පත් එම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලේකම් ගණකාධිකාරි වරයාට පුද්ගලිකව බාර දීමෙන් හෝ එය ලැබුණ බවට කුවිතාන්සියක් ද ලබාගත හැක. ටෙන්ඩර්කරුවන් තම ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපෑලෙන් ද එවීමට පුළුවන. ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන දින පෙරවරු 10 ට පසු තැපෑලෙන් එවන හෝ පැමිණ භාරදෙන සෑම ටෙන්ඩරයක්ම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. එක් ආයතනයක අස්කළ යුතු හා වැළලිය යුතු මිනී හා අජීව උපත් ප්‍රමාණය දළ වශයෙන් ආයතන භාර වෛද්‍ය නිලධාරි තුමාගෙන් හෝ මෙම කාර්යාලයෙන් ලබා ගත හැකිය.

9. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර්පත්‍රයේ පිටු පස දක්වා ඇත. ටෙන්ඩරයක් ඉල්ලුම් කරන විට එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය.

10. කිසිම විමසුමක් නොමැතිව ටෙන්ඩරය සම්පූර්ණයෙන් හෝ කොටසක් භාර ගැනීමට ද නැතහොත් සියළුම ටෙන්ඩර් හෝ කොටසක් ප්‍රතික්ෂේප කිරීමේ බලය ද රජය සතුව ඇත.

11. වැඩි විස්තර මෙම කාර්යාලයට අයදුම්පතක් එවීමෙන් දැන ගත හැකිය.

ජී. එන්. ආර්. නැතැනියල්,
මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරි.

සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය,
මහනුවර,
1965 අගෝස්තු මස 21 වෙනි දින දීය.

### උපලේඛනය

| (1) සේවය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | | (3) ඇප මුදල | | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| | රු. ශ. | | රු. ශ. | | |
| අයිතිවාසිකම නොකියන ලද මෘත ශරීර අස් කිරීම හා වැළලීම, මහනුවර රජයේ රෝහල | 100 0 | ... | 300 0 | ... | 65. 9.21 පෙ.ව. 10 ට |

9–91—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### පිරිසිදු එළකිරි සැපයීම

වර්ෂ 1965 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1966 සැප්තැම්බර් මස 30 වැනිදායින් අවසන් වන කාලය තුළ කල්මුණේ දිසා රෝහලට පිරිසිදු එළකිරි සැපයීම සඳහා ලාංකිකයින්ගෙන් හෝ ලාංකික ආයතනයන්ගෙන් ටෙන්ඩර්පත්‍ර මඩකලපුවේ සෞඛ්‍ය සේවා අධිකාරි විසින් භාරගනු ලැබේ.

2. මෙහි උපලේඛනයේ 4 වැනි තීරයෙහි සඳහන් වන දින පෙරවරු 10 ට ටෙන්ඩර්පත්‍ර භාරගැනීම අවසන් කොට ඒ වහාම ඒවා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්පත්‍ර විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන්ට එම ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් විසින් සඳහන් කර ඇති මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකුට ටෙන්ඩර්පත්‍ර පරීක්ෂා කර බැලීමට අවශ්‍ය වුවහොත් මඩකලපුවේ සෞඛ්‍ය සේවා අධිකාරිගේ හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ වෙනත් නිලධාරියෙකුගේ අනුමතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැක.

3. ටෙන්ඩර්පත්‍ර නියමිත පෝරමයෙහි පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. මෙම පෝරම කොළඹ, කළුතර, මහනුවර, මාතලේ, ගාල්ල, මාතර, යාපනය, වව්නියාව, අනුරාධපුරය, මඩකලපුව, බදුල්ල, රත්නපුරය, කෑගල්ල, කුරුණෑගල හා පුත්තලම යන සෞඛ්‍ය සේවා අධිකාරීන්ගේ කාර්යාල වලින් ලබා ගත හැක. නියමිත පෝරමයෙහි නොවන ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලබන්නේ පහත සඳහන් සුදුසුකම් ඇති අයට පමණි :—

(අ) ඔහුගේ කිරි පට්ටිය ලියාපදිංචි කරන ලද එකක් විය යුතුයි. එය ලියා පදිංචිකිරීම අවශ්‍ය ප්‍රදේශයක තිබේ නම් ඒ ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තුමා විසින් පහත සඳහන් කරුණු අලලා නිකුත් කරනු ලබන සහතිකයක් දිය යුතුය :—

(1) කිරිපට්ටියේ නම සහ පිහිටි ස්ථානය ;

(2) දනට අයිතිකරුගේ නම සහ ලිපිනය ;

(3) කිරිපට්ටිය ලියාපදිංචි කර තිබේ ද ? එසේ නම් කුමන කාලයකට ද ?

(4) පට්ටියේ සිටින කිරිදෙනුන් ගණන ;

(5) දවසකට පට්ටියෙන් නිපදවිය හැකි වැඩිම කිරි ප්‍රමාණය ;

(6) කිරි සැපයීමට නියමිත ආරෝග්‍යශාලාවේ සිට පට්ටියට ඇති දුර ප්‍රමාණය :

(7) පට්ටියේ සිට ආරෝග්‍යශාලාවට කිරි ගෙනයාමට බලාපොරොත්තු වන ක්‍රමය.

(ආ) තමාගේ ටෙන්ඩරය බාරගෙන දෙමසක් ගතවීමට පෙර ආයතනයට නුදුරුව දෙපාර්තමේන්තුව පිළිගන්නා තත්වයේ කිරිපට්ටියක් ආරම්භ කිරීමට ලියවිල්ලකින් පොරොන්දු වන යම් ටෙන්ඩර්කරුවෙකුට. ටෙන්ඩර් පෝරමයේ දැක්වෙන පොරොන්දු ලියවිල්ල ටෙන්ඩර්කරු විසින් අත්සන් කළ යුතුයි.

සැලකිය යුතුයි.—මෙම ඡේදයෙහි වන සුදුසුකම් නොතිබීම නිසා හෝ වෙනත් හේතුන් නිසා හෝ ඉල්ලුම්කරුවෙකුට ටෙන්ඩර් පෝරම නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ හැක. ටෙන්ඩර් පෝරමයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට හේතු දක්වීමට හෝ නොදක්වීමට පුළුවන.

4. ටෙන්ඩර් පෝරම ඉල්ලුම්කරුවන් විසින් 3 වැනි ඡේදයේ (අ) තීරය අනුව කිරිපට්ටිය සඳහා ලයිසන් පත්‍රය හෝ පලාතේ-සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගෙන් ලබාගත් සහතිකයක් හෝ (ආ) තීරයෙහි සඳහන් පරිදි කිරිපට්ටියක් පිහිටුවන බවට පොරොන්දු ලියවිල්ලක් ඉදිරිපත් කළ යුතුය.

5. කිරි සැපයීමට නියමිත ආයතනයට පහසුවෙන් කිරි සැපයීමට හැකි වනු පිණිස කිරිපට්ටිය එයට නුදුරුව තිබිය යුතුයි.

6. මෙහි උපලේඛනයේ දෙවෙනි තීරයෙහි සඳහන් ප්‍රමාණයේ මුදලක් මගේ නමින් කච්චේරියක තැන්පත් කළ බවට නිකුත් කෙරෙන කුවිතාන්සියක් ටෙන්ඩර් පෝරම ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිතිවලට හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිතිවලට හෝ විවිධ සේවා සමුපකාර සමිතිවලට හෝ විවිධ සේවා සමුපකාර සමිති සංගම් වලට හෝ තැන්පත් මුදලක් නොගෙවා ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කළ හැක.

7. අයදුම්කරුවන් ටෙන්ඩර් බාරගන්නා අවසාන දිනට පෙරදින දවල් 12 ට පෙර ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කළ කුවිතාන්සි ඉදිරිපත් කොට නියමිත පෝරම ලබා ගත යුතුය. තැපෑලෙන් ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කරන අය මුදල් තැන්පත් කළ කුවිතාන්සි කල් ඇතිව එවා ටෙන්ඩර් පෝරම ලබා ගත යුතුය.

8. ටෙන්ඩර්පත්‍ර මඩකලපුවේ සෞඛ්‍ය සේවා අධිකාරි නමට ලියා පදිංචි කළ තැපෑලෙන් එවීමට හෝ එම කාර්‍යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහා ලීමට හෝ එම කාර්‍යාලයේ ප්‍රාදේශීය ලේකම්ට පුද්ගලිකව භාරදීමට හෝ පුලුවන. ප්‍රාදේශීය ලේකම්ට පුද්ගලිකව භාරදෙන ටෙන්ඩර්පත්‍ර සඳහා ඔහුගෙන් කුවිතාන්සියක් ලබා ගත යුතුය. ටෙන්ඩර් භාරගන්නා අවසාන දින පෙරවරු 10 ට පසුව තැපෑලෙන් හෝ පුද්ගලිකව ගෙන එනු ලබන ටෙන්ඩර් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පත්‍ර කවරයක බහා සිල් තබා එහි වම් පස උඩ කොටසෙහි "කල්මුනේ රෝහලට පිරිසිදු එළකිරි සැපයීම සඳහා ටෙන්ඩර්" යන්න ද පහත කොටසෙහි ටෙන්ඩර්කරුගේ ලිපිනය ද සඳහන් කළ යුතුය.

9. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කිරීමට පෙර තමන්ගේ වටිනාකම පිළිබඳ තොරතුරු ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට බලාපොරොත්තු වන සෞඛ්‍ය සේවා අධිකාරිවරයා වෙත දැනුම් දිය යුතුයි. මේ සඳහා අවශ්‍ය පෝරම සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාල වලින් බලා ගත හැක.

සැලකිය යුතුයි.—ටෙන්ඩර්කරුවන්ගේ මුදල් තත්ත්වයේ ස්ථිරභාවය පිළිබඳ තොරතුරු දනගැනීමට ප්‍රථම ඔවුන් විසින් එවන ලද ටෙන්ඩර ගැන තීරණයක් කළ නොහැකි බැවින් තම තමන්ගේ වටිනාකම් පිළිබඳ තොරතුරු කල්වේලා ඇතිව ඉදිරිපත් කරන ලෙස ටෙන්ඩර්කරුවන්ට අවවාද කරනු ලැබේ.

10. පසුගිය වර්ෂය තුල සැපයූ සාමාන්‍ය කිරි ප්‍රමාණය එම ආයතනය භාර වෛද්‍ය නිලධාරි තැන ගෙන් දත ගත හැක. පසුගිය අවුරුද්ද තුලදී ලබා ගන්නා ලද කිරි ප්‍රමාණය ම හෝ එයට ආසන්න කිරි ප්‍රමාණයක් ලබා ගන්නා බවට සහතික කළ නොහැක. ආයතනයේ අවශ්‍යතාවයන් පරිදි ඇනවුම් කෙරෙන කිරි ප්‍රමාණය සැපයීමට ටෙන්ඩර්කරුවන් සූදානමින් සිටිය යුතුය.

11. ටෙන්ඩරය පිළිබඳ කොන්දේසි ටෙන්ඩර්පත්‍රයේ පිටුපස දක්වා ඇත. මෙම කොන්දේසි හොඳින් අවබෝධ කර ගත යුතුවාක් මෙන්ම ටෙන්ඩරය ඉදිරිපත් කළ පසු ඒවා පිළිපැදිය යුතු ද වන්නේ ය.

එස්. විවේකානන්ද රාජා,
මඩකලපුවේ සෞඛ්‍ය සේවා අධිකාරි.

1965 අගෝස්තු මස 27 වැනි දින,
මඩකලපුවේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාලයේ දී ය.

## උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් පත් සඳහා තැන්පත් මුදල රු. ශ. | (3) ඇප මුදල රු. ශ. | (4) ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය සහ වේලාව |
|---|---|---|---|
| කල්මුනේ දිසා රෝහල ... ... ... | 100 0 ... | 300 0 ... | 1965.9.21 වැනි දින පෙරවරු 10 ට |

9-125—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිරිසිදු එළකිරි එහා මෙහා ගෙන යාම

ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.—වර්ෂ 1965 ඔක්තෝබර් 1 දින සිට 1966 සැප්තැම්බර් 30 වැනිද දක්වා (දෙදින ඇතුළුව) කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන, ආයතනයන්ට, සෞඛ්‍ය කාර්යාලවල සිට කිරි මධ්‍යස්ථාන වලට පිරිසිදු එළ කිරි ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම් විසින් එවනු ලබන සිල් තැබූ ටෙන්ඩර් පත්‍ර කළුතර සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.—මෙහි උපලේඛනයෙහි දෙවන ඡේදයෙහි සඳහන් පරිදි, රු. 100ක තැන්පත් මුදලක් මා නමට, කච්චේරියේ තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ii) ටෙන්ඩර් පත්‍ර.—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්‍යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, කොළඹ, මඩකලපුව, ගාල්ල, යාපනය, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පෝරම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි, පෝරම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසන් එවිය යුතුයි.

3. වත්කමෙ විස්තර.—මෙම දෙපාර්තමේන්තුවේ දනට කොන්ත්‍රාත්තුවක් නොදරණ අය ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝරම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුය. මේ සඳහා වුවමනා පෝරම ඉහත පෙනෙන දෙවන ඡේදයේ සඳහන් ඕනෑ තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරණ ලෙස දන් වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. ප්‍රමාණයන්.—සැපයිය යුතු එළකිරි ප්‍රමාණයන් දළ වශයෙන් දන ඇනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 3 වැනි තීරය බලන්න.

5. ටෙන්ඩර් එවිය යුතු අන්දම.—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධිකාරී, කළුතර" කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවන් සඳහා ද යන්න පැහැදිළිව සඳහන් කළ යුතුවාක් මෙන් ම, එහි වම්පස පහළ කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිළිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාල යේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී මහතාට දීමෙන් එය ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියා පදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැකි ය.

6. ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර්පත් භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. ටෙන්ඩර් පත් විවෘත කිරීම.—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර් කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමහ කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකි ය.

8. ටෙන්ඩරයේ සඳහන් කරණ ලද මිළ ගණන් වලංගු කාල සීමාව.—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුල වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. තැන්පත් මුදල්.—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු නියමිත ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

10. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාත් හැර පිළිපැදිය යුතුද වන්නේය.

11. වෙනත් විස්තර.—තවදුරටත් විස්තර දන ගැනීම සඳහා දෙවන ඡේදයේ සඳහන් කුමන කාර්යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුළුවන.

ඒ. නාගෙන්ද්‍රන්,
කළුතර සෞඛ්‍ය සේවා අධිකාරී.

සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය,
කළුතර, 1965 අගෝස්තු 25.

### උපලේඛනය

| (1) සේවය | (2) ප්‍රදේශය | (3) යැවිය හැකි ප්‍රමාණය මසකට පයින්ට | (4) අවසාන දිනය |
|---|---|---|---|
| 1. දකුණු කළුතර, කළුතර ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තැනගේ කාර්යාලයේ සිට කළුතර, ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තැනගේ කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථානවලට ගෙනයාමට ... ... ... | කළුතර ... | 9,500 | 1965.9.16 පෙ.ව.10ට |
| 2. පානදුර, පානදුර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තැනගේ කාර්යාලයේ සිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තැනගේ කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථානවලට ගෙන යාමට ... | පානදුර ... | 8,500 | |
| 3. හොරණ, පානදුර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තැනගේ කාර්යාලයේ සිට හොරණ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තැනගේ කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථානවලට ගෙනයාමට ... | හොරණ ... | 7,500 | |

9–77—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—යාපනය කොට්ඨාශය

### කිළිටි රෙදි සේදීම

සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.—1965 ඔක්තෝබර් 1 වැනි දින සිට 1966 සැප්තැම්බර් 30 වනදින් (දින දෙකක් ඇතුලුව) අවසන් වන වර්ෂය තුල, මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවෙනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර යාපනය සෞඛ්‍ය සේවා අධිකාරී විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් තැන්පත් මුදල.—(i) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ii) ටෙන්ඩර් පත්‍ර.—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ බදුල්ල, මඩකලපුව අනුරාධපුර, කොළඹ, ගාල්ල, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුර සහ වව්නියා යන ස්ථානයන්හි පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලවලින් ටෙන්ඩර් පෝරම ලබාගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි.

ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝරම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝරම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. වත්කම් විස්තර.—සියළුම ටෙන්ඩර් කරුවන් ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර්පත්‍ර භාරගැනීමට සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම මට දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝරම ඉහත පෙනෙන දෙවන ඡේදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. සෝදන කැලි ප්‍රමාණය පිළිබඳ විස්තර.—දළ වශයෙන් මාසයකට සේදියයුතු කැලි ප්‍රමාණය මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. ටෙන්ඩර් එවිය යුතු අන්දම.—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරී, යාපනය " කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිළිව සඳහන් කළයුතුවාක් මෙන්ම, එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිළිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී/ප්‍රාදේශිය ලේකම් මහතාට දීමෙන් ඒ ලැබුනු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 6 වැනි තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. ටෙන්ඩර් පත් විවෘත කිරීම.—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙළ කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත්වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දුපත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස්කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. තැන්පත් ඇප මුදල.—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු ඔහුගේ ටෙන්ඩරය පිළිගත් දින සිට දින 10ක් ඇතුළත මෙහි පහත පෙනෙන උපලේඛන යෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන්වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් හැර, පිළිපැදිය යුතුද වන්නේය.

11. ප්‍රවාහනය.—(i) කොන්ත්‍රාත්කරුවන්ට රෝගීන්, මළ සිරුරු, ආදිය ප්‍රවාහනයට සිදුවුවහොත් ඊට යන වියදම් ආදිය පළාත් ආදායම් පාලක නිලධාරිතුමා සක්සේරු කළ ගණන්වලට අනුව වවුචරයෙන් කපා ගනු ලැබේ.

(ii) සිවිල් ලේඛන වලින් සහ රෝහල් වලින් ඉවත් කරන ලද මළ සිරුරු.—යම් ප්‍රදේශයක මිලිටරි රෝගී ලේඛනට පළමු ඒවායේ විෂබීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙනයාමට සිදු වුවහොත් ඒවා එහා මෙහා ගෙනයාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.—පළාත් පාලන මණ්ඩල තුළ ඇති ආයතනයන්ට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ, ඒ ඒ මණ්ඩලවල නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවාට නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

ඇස්. රාසරත්නම්,
සෞඛ්‍ය සේවා අධිකාරි, යාපනය.

යාපනය සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය,
1965.8.27.

උපලේඛනය

| (1) | (2) | (3) | (4) | (5) | (6) |
|---|---|---|---|---|---|
| ආයතනය | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ඇප මුදල රු. | මසකට රෙදි සේදිය යුතු වාර ගණන | මසකට සේදිය යුතු කෑලි ගණන සාමාන්‍ය | ටෙන්ඩර් භාර ගැනීම අවසාන වන දිනය හා වේලාව |
| රජයේ රෝහල—යාපනය : | | | | | |
| 1 වෙනි කොටස—වාට්ටු 1 හා 2 (මාතෘ වාට්ටු), වාට්ටු 11 හා 15 (ළමා වාට්ටු) ... | 50 ... | 100 ... | 12 ... | 16,800 ... | 1965 සැප්තැම්බර් 17 පෙරවරු 10 ට |

9–105—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

යොමු අංකය : එෆ්.ටී.සී. 57/65.

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

### ක්ලෝරොප්‍රොමසින් බී. පී. ආදිය සැපයීම

මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි සඳහන් පරිදි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනට ක්ලෝරොප්‍රොමසින් බී.පී. ආදිය සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1965 දෙසැම්බර් 7 වෙනි අඟහරුවාදා උදේ 10 දක්වා භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. අවශ්‍ය ටෙන්ඩර් ආකෘති පත්‍ර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 දරණ තැන පිහිටි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනගේ (සැපයීම් අංශය) කාර්යාලයෙන් ලබා ගත හැක. මෙම දැන්වීමේ 5 වන හා 6 වන ඡෙදයන්හි සඳහන් කරුණු අනුව 1965 දෙසැම්බර් 6 වන සඳුදින උදේ 10 දක්වා ඉල්ලුම්කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත් සීල් තබන ලද කවරයක බහා, "සභාපති තැන, ටෙන්ඩර් මණ්ඩලය, සෞඛ්‍ය අමාත්‍යාංශය, තැ.පෙ. 500, පළමුවන මහල, මහා රෝහල් පාරේ, ගාලු මුවදොර, කොළඹ" යන ලිපිනයට එවිය යුතු වෙයි. සීල් තබන ලද ටෙන්ඩර්පත් බහා ලන ලද කවරයේ වම් පැත්තේ උඩ, "ක්ලෝරොප්‍රොමසින් බී.පී. ආදිය සැපයීම සඳහා ටෙන්ඩර් 1965.12.7 වන දින උදේ 10ට පෙර" යනුවෙන් සඳහන් කළ යුතු වෙයි.

4. ටෙන්ඩර් පත්, ගාලු මුවදොර මහා රෝහල් ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය අමාත්‍යාංශයේ කාමර අංක 155හි ඇති ටෙන්ඩර් පෙට්ටියකට දැමීම හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් හෝ එවීම කළ හැක. එසේත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන්, තමනට අවශ්‍ය යැයි හැඟේ නම් සීල් තබන ලද ටෙන්ඩර් පත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ උප රෝහල් තැන වෙත පුද්ගලිකව ගෙනැවිත් බාරදීම ද කළ හැක. එසේ බාරදෙන සීල් තබන ලද කවරයේ පිට පැත්තේ එය කිනම් සැපයීමක් සඳහා දයන වග හා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ද පැහැදිලිව සඳහන් කළ යුතු වෙයි. එම ටෙන්ඩර් පත් බාර ගැනීම සඳහා ඉහත කී නිලධාරි තැනට බලය ඇත. සීල් තබන ලද ටෙන්ඩර් පත් බාර ගත් බවට කුවිතාන්සියක් එවිට ටෙන්ඩර්කරු වෙත ඔහුගෙන් ලැබෙනු ඇත. ප්‍රසිද්ධ නිෂ්පාදන සමාගමක ඒජන්තවරයකුට හෝ වෙළඳ නියෝජිතයකුටවුවද ටෙන්ඩර් ආකෘති පත්‍ර දෙනු ලැබේ. එසේත් අයදුම්කරු නම් කරන ලද නිෂ්පාදන සමාගමයේ නියෝජිත ඒජන්තවරයෙකු බව සහතික කළ යුතු වේ. (මේ සඳහා නියෝජිතත්වය පිළිබඳ ඔප්පු කිරීමක් ඉදිරිපත් කළ යුතු වෙයි.)

5. අයදුම්කරු මුදලින් රු. 100ක් කොළඹින් පිට කච්චේරියක හෝ කොළඹ කොටුවේ යෝක් වීදියේ පිහිටි ලංකා බැංකුවේ හෝ තැන්පත් කර, එසේ තැන්පත් කළ බවට ඔවුන්ගෙන් ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතු වෙයි. (කිසිම කොන්ත්‍රාත්තුවක් සඳහා කිසිම ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීම සඳහා දයන වග එම කුවිතාන්සියේ සඳහන් කර තිබිය යුතු වෙයි.) ලංකා බැංකුවේ එම මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය ආකෘති පත්‍ර මෙහි 2 වන ඡෙදයේ සඳහන් ලිපිනයේ ඇති සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

6. ලාංකික සම්බන්ධතා ඇති රටවල් වූ ඇල්බේනියාව, ඔස්ට්‍රියාව, බල්ගේරියාව, චීන මහජන සමූහාණ්ඩුව, චෙකොස්ලෝවැකියාව, ඩායිවාන්, ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව, හන්ගේරියාව, ජපානය, කොරියාව, පෝලන්තය, රුමේනියා මහජන සමූහාණ්ඩුව, ස්පාඤ්ඤය, සෝවියට් රුසියාව, යුගෝස්ලාවියාව, වියට්නාම් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව, ආදී රටවල්වලින් මෙම සැපයීම ආනයනය කර සැපයීමට බලාපොරොත්තු වන ටෙන්ඩර්කරුවන් වෙතොත්, ඔවුන් ලියා පදිංචි කරන ලද වෙළෙඳුන් විය යුතු අතර, ආනයන පාලක තැන විසින් නිකුත් කරන ලද සාමාන්‍ය බඩු ගෙන්වීමේ බල පත්‍රයක් ඇත්තෝ විය යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලීමේදී ඉහත සඳහන් බල පත්‍රයක් හිමි බව ඔප්පු කළ යුතු වෙයි.

7. ටෙන්ඩර් කොන්දේසි සහ අනිකුත් විස්තර මෙම දැන්වීමේ 2 වන ඡෙදයේ සඳහන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනගේ (කොන්ත්‍රාත් හා සැපයීම් අංශය) කාර්යාලයෙන් ලබා ගත හැක. එම කාර්යාලයෙන් ලබා ගත් ආකෘති පත්‍ර, කොන්දේසි පත්‍ර ආදිය ප්‍රයෝජනයට ගත හැක්කේ ස්වදේශීය ටෙන්ඩර් කරුවනට පමණ ය.

8. මෙහි 1 වන ඡෙදයේ සඳහන් පරිදි ටෙන්ඩර්කරු විසින් තමන්ගේ ප්‍රධානය, ටෙන්ඩර් බාරගැනීමේ දින සිට යටත් පිරිසෙයින් මාස 2ක් වත් වෙනස් නොවී එම තත්ත්වයෙන්ම තිබිය යුතුය.

9. මුලින්ම ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමට කැමැති විදේශීය නිෂ්පාදක සමාගම් වලට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් සහ ඒජන්තවරුන් විසින් ටෙන්ඩර් කොන්දේසි, උප ලේඛනය හා පෝරම ටෙන්ඩරය පිළිබඳ සියළුම විස්තර පහත සඳහන් රටවල සිටින ලංකාණ්ඩුවේ නියෝජිතයන්ගෙන් ලබා ගත හැකි බව නිෂ්පාදන සමාගම්වලට දන්විය යුතු වේයි. මහා බ්‍රිතාන්‍ය, ඇමෙරිකා එක්සත් ජනපදය, ඉතාලිය, පකිස්ථානය, ජපානය, ප්‍රංශය, බටහිර ජර්මනිය, චීන මහජන සමූහාණ්ඩුව, සෝවියට් රුසියාව, කැනඩාව, නෙදර්ලන්තය, බෙල්ජියම, හන්ගේරියාව, බල්ගේරියාව, නැගෙණහිර ජර්මනිය, එක්සත් අරාබි සමූහාණ්ඩුව, බුරුමය, අයර්ලන්තය, අයිරානය, ඉරාකය, මාලදිවයින, උතුරු කොරියාව, ස්පාඤ්ඤය, සහ ඉන්දියාවේ බොම්බායේ සහ මද්‍රාසියේ පිහිටි සිටින ලංකා වෙළඳ කොමසාරිස් සහ ලංකාවේ සිටින විදේශීය ආණ්ඩු නියෝජිතවරු සහ ඉන්දියාවේ දිල්ලියේ සිටින ලංකාවේ විදේශීය නියෝජිතයන්ගෙන්.

10. ටෙන්ඩර්කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර සමග නිකුත් කරන ටෙන්ඩර් කොන්දේසිවල 11 වැනි ඡේදය කෙරෙහි ටෙන්ඩර්කරුවන්ගේ අවධානය යොමු කරනු ලැබේ. කොළඹ, රජයේ බෙහෙත් ගබඩා අධිකාරිට යැවිය යුතු වෙම බවුලෙ ආදර්ශ භාණ්ඩ (සැම්පල්ස්) සම්බන්ධව එහි සඳහන් කර ඇත. ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුත්තේ ටෙන්ඩරය පමණි. ආදර්ශ භාණ්ඩ (සැම්පල්ස්) එහි තැන්පත් නොකළ යුතුයි. ටෙන්ඩර් සමර්පන කළ දිනයේ නියම වේලාවට ප්‍රමාදව ලැබුණු සැම්පල්ස් සැලකිල්ලට භාජනය කරනු නොලැබේ.

11. මෙහි 1 වන ඡේදයේ සඳහන් ස්ථානයේ ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේ සෑම ටෙන්ඩර්කරුවෙකුට ම එම ස්ථානයේ සිටීමට අවසර තිබේ. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ මිළ ගණන් එහිදී පැමිණ සිටි ටෙන්ඩර්කරුවන්ට කියනු ලැබේ. ලැබී තිබුණ ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට යම්කිසි ටෙන්ඩර්කරුවෙකුට අවශ්‍ය නම්, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන සමග කටයුතු පිළියෙළ කර ගැනීමෙන් පසු එය පරීක්ෂා කර බැලීමට ඉඩ දෙනු ලැබේ.

12. ටෙන්ඩර්කරුවන් විසින් රුපියල්ල වටිනාකම හා විදේශීය විනිමය වටිනාකම වෙන වෙනම තමන්ගේ මිළ ඉදිරිපත් කිරීමේදී සෑම විෂය අංකයක් වෙනුවෙන් ම සඳහන් කළ යුතු වන්නේ ය.

එස්. බාලක්‍රිෂ්නන්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1965 8.27 වනදා,
කොළඹ 10, ඩීන්ස් පාරේ,
අංක 55 දරණ තැන පිහිටි,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) කාර්යාලයේ දී ය.

## අදාල උපලේඛනය

| විෂයය අංකය | විස්තරය | ඇස්තමේන්තු කළ අවශ්‍යතා | අවශ්‍ය ඇසිරීම |
|---|---|---|---|
| 1. | ක්ලෝරොප්‍රොමයිඩ් බී.පී. 100 මි.ග්‍රෑ. ... ... ... ... | 1,800,000 පෙති | ... පෙති 500 බෝතල තුළ |
| 2. | ඒප්‍රිඩන් කොම්පවුන්ඩ් කෝටඩ් පෙති—සෑම පෙත්තකම පහත සඳහන් අයුරින් අඩංගු—එෆිඩ්‍රින් හයිඩ්‍රොක්ලෝරයිඩ් 20මි. ග්‍රෑ. (⅓ග්‍රෑ.): ඇමයිනොබාර්බිටෝන් බී.පී. 30 මි.ග්‍රෑ. (½ග්‍රෑ.): ඇමිනොෆිලින් බී.පී. 130මි.ග්‍රෑ. (2ග්‍රෑ.). ආලෝකය ඇතුලුවීමෙන් තොර කළ වැකුම්සීල් කළ ගබඩා කිරීමට හා සර්මකලාපීය දේශගුණයට ඔබින පේ බෝතල්වල අසුරා | 3,000,000 පෙති | ... පෙති 1,000 බෝතල් තුළ |
| 3. | සින්කොකේන් හයිඩ්‍රොක්ලෝරයිඩ් බී.පී.සී. නික්ෂේපනය 20 සීසී—සෑම එකකම 1 : 1,500 0·5% සේලයින් තුළ ... ... ... ... | 24,000 ඇම්පියුල | ... ඇම්පියුල 100 පෙට්ටි තුළ |
| 4. | සින්කොකේන් හයිඩ්‍රොක්ලෝරයිඩ් බී.පී.සී. නික්ෂේපනය 3 සීසී—සෑම එකකම 1 : 200—6% ග්ලූකෝස් ... ... ... ... | 20,000 | ... එම |
| 5. | හෙපරින් මැලියන්ට නික්ෂේපනය—සෑම ඇම්පියුලයකම හෙපරින්—බී.පී.මි.ග්‍රෑ. 25ක් බැගින් සීසී එකක අඩංගු විය යුතු. (2·5% ඩබ්.වී.) ... ... | 40,000 කුප්පි | ... ඇම්පියුල 100 ගේ පෙට්ටි තුළ |
| 6. | ක්ලෝරම්ෆෙනිකෝල් සෝඩියම් සක්සිනේට්—ක්ලෝරම්ෆෙනිකෝල් බී.පී.ග්‍රෑම් 1කට සමාන වන—නහර ගත හා මාංශ ගත යන දෙආකාරයේම ප්‍රයෝජනයට සුදුසු නික්ෂේපනය (සෑම කුප්පියක්ම එසේ ලේබල් කළ යුතු) ... ... | 40,000 කුප්පි | ... කුප්පි 100 බැගින් අඩංගු පෙට්ටි තුළ |
| 7. | හයිඩ්‍රොකෝර්ටිසෝන් හෙමිසක්සිනේට් සෝඩියම් නික්ෂේපනය—සෑම කුප්පියක්ම නහරගත හා මාංශ ගත ප්‍රයෝජනයට සුදුසු හයිඩ්‍රොකෝර්ටිසෝන් මි.ග්‍රෑ. 100කට සමානව අඩංගු | 40,000 රබර් මූඩි ගැසූ කුප්පි | කුප්පි 12 බැගින් අඩංගු පෙට්ටි තුළ |
| 8. | නැන්ඩ්‍රොලෝන් නික්ෂේපනය (තෙල් ගතිය ඇති) නොරන්ඩ්‍රොස්ටෝ—නොලෝන් ෆීනයිල් ප්‍රොපියොනේට්) සීසී එකකට මිලිග්‍රෑම් 25 බැගින් මාංශගත (ඉන්ට්‍රාමස්කුලර්) ප්‍රයෝජනයට සුදුසු | 40,000 × 1 සීසී ඇම්පියුල ... | ඇම්පියුල 100 පෙට්ටි තුළ |
| 9. | අර්ගොමෙට්‍රින් මැලියන්ට බී.පී. නික්ෂේපනය මිලි ලීටරයක 0·5 මි.ග්‍රෑ. බැගින් ... | 600,000 ඇම්පියුල | ... එම |
| 10. | ස්ට්‍රෙප්ටොමයිසින් සල්ෆේට් බී.පී. ... ... ... | 10,000 ග්‍රෑම්ස් | ... මනාව වැසූ කළ ග්‍රෑම්ස් 5ගේ කුප්පි තුළ |
| 10අ. | එම ... | 15,000 ග්‍රෑම්ස් | ... මනාව වැසූ කළ ග්‍රෑම්ස් 10ගේ කුප්පි තුළ |
| 10ආ. | එම ... | 20,000 ග්‍රෑම්ස් | ... මනාව වැසූ කළ ග්‍රෑ. 25 කුප්පි තුළ |
| 10ඇ. | එම ... | 30,000 ග්‍රෑම්ස් | ... මනාව, වැසූම කළ ග්‍රෑ. 100 කුප්පි තුළ |
| 11. | හැලෝතේන් බී.පී. ඇනෙස්තටික් වැඩ සඳහා ... ... ... | 1,500 × 250 සීසී බෝතල් ... | පහසු ආකාරයක ඇසිරීමක් |

බාරදීමේ ක්‍රමය.—විෂයය අංක 1 සිට 11 දක්වා ඇති සියළුම භාණ්ඩ සමාන තොග දෙකකින් කොළඹ රජයේ බෙහෙත් ගබඩාවට ගෙනැවින් බාර දිය යුතුය. පළමුවන තොගය ඇනවුම් කළ දින සිට මාස 3ක් ඇතුළදී ද, අනෙක් තොගය ඉන්පසු එන මාස 3 ඇතුළ දී ද සැපයිය යුතුය.

ටෙන්ඩර්කරු ණයවර ලිපියක් විවෘත කරන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා සිටින්නේ නම්, සඳහන් කරන ලද මිළ ගණන, මිල සහ කොළඹට ගෙනඒමේ ගාස්තුව සහිතව, හා ඇතිවීම හා අනිකුත් සියළුම ගාස්තු ඇතුළුව මිල භාණ්ඩ නිෂ්පාදන රටේ මුදලින් හා ලංකා මුදලින් ද සඳහන් කළ යුතුය. නැව් මාරුවට ඉඩ දෙනු නොලැබේ.

මෙම සැපයීමේ සෑම භාණ්ඩයකම හා ඒවා බහා එවන සෑම භාජනයකම "මවුන්න ලකුණ" හා "සී/ඩීඑම්එස් 2627/65-66" යනුවෙන් සඳහන් කර තිබිය යුතුය.

9-154—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

## සොබ්‍ය දෙපාර්තමේන්තුව—මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශය

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වැඩ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් කලවාන රෝහලට ජල සම්පාදන ක්‍රමයක් තැනීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1965.10.5 වැනි කුජදා පෙරවරු 10 වන තෙක් භාර ගනු ලැබේ.

2. කොළඹ 7 හේ පිහිටි මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගේ කාර්‍යාලයෙන් ලබා ගත හැකි පෝරම්වල, පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍රිකා ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන විසින් 1965.9.17 වැනි සිකුරාදා පස්වරු 4 වන තෙක් නිකුත් කරනු ලබන්නේ ජල සම්පාදන කර්මාන්තයන් සඳහා මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ "ඊ" කොටස යටතේ ලියා පදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවන්ට පමණී. ටෙන්ඩර් පත්‍රිකා ලබා ගැනීමට පෙර ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගේ නමට අයවන ලෙස කොළඹ, ලංකා බැංකුවේ හෝ කොළඹින් පිටත නම් කච්චේරියක හෝ රු. 50 ක මුදලක් තැන්පත්කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් පත් කොළඹ, ගාළු මුවදොර පිහිටි මහ ලේකම් ගොඩනැගිල්ලේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වැඩ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාගේ කාර්‍යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. නැතහොත් ලියා පදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුය. ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් ඉහත සඳහන් ස්ථානයේ සිටින ටෙන්ඩර් භාර ගැනීමට බලය දී තිබෙන නිලධාරි තැනට භාර දිය හැකිය. පෝච්චියේ පිටතද ටෙන්ඩර් කරුවන්ගේ නම සහ ලිපිනයද කවරයේ සඳහන් කළ යුතුය. ටෙන්ඩරය භාර ගත් බවට ඉහත සඳහන් නිලධාරි තැන කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

4. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේදී නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේදී සැම ඉල්ලුම් කරුවෙකුට ම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ මිල ගණන් පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියේදී කියවනු ලැබේ. ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන්ගේ අනුමැතිය අනුව කිසියම් ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට ටෙන්ඩර් කරුවකුට අවශ්‍ය වුවහොත් එකී ටෙන්ඩරයේ පිටපත පරීක්ෂා කර බැලීම සඳහා අවසර දෙනු ලැබේ.

5. වැඩය පිළිබඳ වැඩිමනත් විස්තර ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

ආස්. ඊ. ජේ. මේතරී,
වැ. බ. ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන.

තැ. පෙ. 1434, කොළඹ 7,
1965.8.26 වෙනි දින.

9-130—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

වර්ෂ 1965 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1966 සැප්තැම්බර් 30 වැනි දින දක්වා ඇති කාලය තුළ දෙමටගොඩ රට අඟුරු පොළේ රට අඟුරු බෑම, ගොඩගැසීම සහ පැටවීමද, දෙමටගොඩ රට අඟුරු පොළේ සිට කොළඹ සහ අවට ප්‍රදේශයන්හි පිහිටි ඒ ඒ ස්ථාන කරා රට අඟුරු බෙදා හැරීමද සඳහා ටෙන්ඩර් පත් ප්‍රවාහන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1965 සැප්තැම්බර් 22 වැනි බදාදා පූ. භා. 11 වනතුරු භාරගනු ලැබේ.

මරදානේ දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකි පෝරමයන්හි ටෙන්ඩර්පත් (අනුපිටපතක්ද සහිතව) සකස් කළ යුතුය. ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 50ක් මරදානේ ප්‍රධාන දුම්රිය ගණකාධිකාරී කාර්යාලයෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1965 සැප්තැම්බර් 21 වැනි අඟහරුවාදා දහවල් 12 වන තෙක් පෝරම ලබා ගත හැක.

එම්. සදීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

1965 අගෝස්තු 27 වැනිදා,
කොළඹදී ය.

9-120—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ප්‍රවාහණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපති තැන විසින් කම්කරු නිවාස ජෝඩු පහක් (5) මිදුරත්කුලියේ ඉදිකිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1965 සැප්තැම්බර් මස 29 වැනි බදාදා පෙරවරු 11 දක්වා බාර ගනු ලැබේ. එදිනම පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවනට එහි පැමිණිය හැක.

2. කොළඹ මැක්ලම් පාරේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග හා වැඩ අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් (තැ. පෙ. 370) මේ සඳහා පෝරම කොළ ලබාගෙන සම්පූර්ණ කොට අනු පිටපතක්ද සමග එවිය යුතුයි. මේ සම්බන්ධයෙන් සියළු විස්තර මෙම නිලධාරි තැනගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්‍යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. 1965 සැප්තැම්බර් මස 15 වැනි බදාදා පස්වරු 4 දක්වා රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ වැඩ සඳහා රුපියල් 1,00,000කට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ හෝ මෙම මුදලට වඩා වටිනාකම් ඇති කොන්ත්‍රාත් වැඩක් දුම්රිය දෙපාර්තමේන්තුවට සතුටුදායක අන්දමින් අවසන් කර ඇති කොන්ත්‍රාත්කරුවනට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැන වෙත (අ) තමාගේ ලියාපදිංචි කිරීම පිළිබඳ ලියකියවිලිද (ආ) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල වන රු. 200 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10 ක්ද තැන්පත්කර ලබාගත් පිසිට් පත්‍ර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝරම ලබා ගත හැකිය.

මෙම මුදල් තැන්පත් කළ යුත්තේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්‍යාලයේදීය.

එන්. ඒ. වෛත්‍යලිංගම්,
ප්‍රධාන ඉංජිනේරු තැන.
ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව,

1965 අගෝස්තු මස 27 දින,
තැ. පෙ. අංක 370,
කොළඹදීය.

9-159—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ප්‍රවාහණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපති තැන විසින් කම්කරු නිවාස ජෝඩු පහක් (5) බත්තුලුඔයේ ඉදිකිරීම සඳහා ටෙන්ඩර්පත්‍ර 1965 සැප්තැම්බර් මස 29 වැනි බදාදා පෙරවරු 11 දක්වා බාර ගනු ලැබේ. එදිනම පස්වරු 2.30ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පැමිණිය හැක.

2. කොළඹ මැක්ලම් පාරේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග හා වැඩ අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් (තැ. පෙ. 370) මේ සඳහා පෝරම කොළ ලබාගෙන සම්පූර්ණකොට අනු පිටපතක්ද සමග එවිය යුතුයි. මේ සම්බන්ධයෙන් සියළු විස්තර මෙම නිලධාරි තැනගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්‍යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. 1965 සැප්තැම්බර් මස 15 වැනි බදාදා පස්වරු 4 දක්වා රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ වැඩ සඳහා රුපියල් 1,00,000 කට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ හෝ මෙම මුදලට වඩා වටිනාකම් ඇති කොන්ත්‍රාත් වැඩක් දුම්රිය දෙපාර්තමේන්තුවට සතුටුදායක අන්දමින් අවසන් කර ඇති කොන්ත්‍රාත්කරුවනට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැන වෙත (අ) තමාගේ ලියා පදිංචි කිරීම පිළිබඳ ලියකියවිලිද (ආ) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල වන රු. 200 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10 ක්ද තැන්පත් කර ලබාගත් පිසිට්පත්‍ර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝරම ලබා ගත හැකිය.

මෙම මුදල් තැන්පත් කළ යුත්තේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්‍යාලයේදීය.

එන්. ඒ. වෛත්‍යලිංගම්,
ප්‍රධාන ඉංජිනේරු තැන.
ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව.

1965 අගෝස්තු මස 27 දින,
තැ. පෙ. අංක 370,
කොළඹදීය.

9-158—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ප්‍රවාහණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපති තැන විසින් කම්කරු නිවාස ජෝඩු දහයක් (10) පුත්තලමේ ඉදිකිරීම සඳහා ටෙන්ඩර්පත්‍ර 1965 සැප්තැම්බර් මස 29 වැනි බදාදා පෙරවරු 11 දක්වා බාර ගනු ලැබේ. එදිනම පස්වරු 2.30ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පැමිණිය හැක.

2. කොළඹ මැක්ලම් පාරේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග හා වැඩ අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් (තැ. පෙ. 370) මේ සඳහා පෝර්ම නොමිලේ ලබාගෙන සම්පූර්ණකොට අනු පිටපතක් ද සමග එවිය යුතුයි. මේ සම්බන්ධයෙන් සියළු විස්තර මෙම නිලධාරී තැනගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. 1965 සැප්තැම්බර් මස 15 වැනි බදාදා පස්වරු 4 දක්වා රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ වැඩ සඳහා රුපියල් 2,00,000 කට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ හෝ මෙම මුදලට වඩා වටිනාකම් ඇති කොන්ත්‍රාත් වැඩක් දුම්රිය දෙපාර්තමේන්තුවට සතුටුදායක අන්දමින් අවසන් කර ඇති කොන්ත්‍රාත්කරුවනට පමණක් ඉහත සඳහන් ඉංජිනේරුතැන වෙත (අ) තමාගේ ලියා පදිංචි කිරීම පිළිබඳ ලිය කියවිලිද (ආ) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදලද වන රු. 250 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10 ක්ද තැන්පත් කර ලබාගත් රිසිට්පත්‍ර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැකිය.

මෙම මුදල් තැන්පත් කළ යුත්තේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනගේ කාර්යාලයේදීය.

එන්. ඒ. වෛත්‍යලිංගම්,
ප්‍රධාන ඉංජිනේරු තැන,
ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව.

1965 අගෝස්තු මස 27 දින,
කොළඹදීය,
(තැ. පෙ. අංක 370).

9-157—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

## ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුව-රත්මලාන

### නිර්මාණය සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ හා ආයුද සැපයීම හා ගෙනැවිත් බාරදීම

පහත දක්වෙන යන්ත්‍රෝපකරණ හා ආවුද රත්මලානේ ජලසම්පාදන හා ජලාපවහන අධ්‍යක්ෂ වෙත සැපයීම සඳහාවූ ටැන්ඩර් ඉල්ලුම් පත්‍ර කොළඹ 1—යෝර්ක් වීදියේ අංක 75 1/1 දරණ හේමාස් ගොඩනැගිල්ලේ පළමුවැනි මහලේ පිහිටි පළාත් පාලන අමාත්‍යාංශ ටැන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1965 ඔක්තෝබර් මස 1 වැනි සිකුරාදා පෙරවරු 10 දක්වා බාරගනු ලැබේ. ටැන්ඩර් ඉල්ලුම් පත්‍ර විවෘත කරනු ලබන වේලාවේදී එනම් එදිනම පෙරවරු 10.10 ට ටැන්ඩර් ඉල්ලුම් කරුවන්ට අමාත්‍යාංශ ටැන්ඩර් මණ්ඩල කාමරයට පැමිණ සිටිය හැකිය.

ඉහත සඳහන් ද්‍රව්‍ය විස්තර

| | | |
|---|---|---|
| කම්පක (වයිබ්‍රේටර්) | 6 | කි. |
| කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍ර | 1 | කි. |
| කම්බනවන යන්ත්‍ර | 1 | කි. |
| "ඔක්සි ඇසිටිලින්" වෑක්කුම් හා වෙල්ඩින් උපකරණ කට්ටල | 1 | කි. |
| විදුලිධාරාලෝක උපකරණයන් | 3 | කි. |
| පරීක්ෂණ අත් ලාම්පු | 3 | කි. |
| විදුලි බුබුලු දුසිම් | 2 ½ | කි. |
| පයිප්ප පොට්කපන යන්ත්‍ර කැට සමග කට්ටල | 4 | කි. |
| දික් කරන ඉණිමං | 2 | කි. |
| අතින් ක්‍රියාකරවන "හයිඩ්‍රොලික්" පරීක්ෂණ පොම්ප | 2 | කි. |
| පීඩන යන්ත්‍ර (ප්‍රෙෂර්ස්) | 4 | කි. |
| පයිප්ප අවුරණ ඇවුද කට්ටල | 5 | කි. |
| ඊයම් කරන (ලෙයිත්) ක්ලිප් | 1 | කි. |
| ඊයම් දියකරන භාජන | 2 | කි. |
| සැහැල්ලු ඊයම් හැඳි | 2 | කි. |
| නලාකාර වීරුපණ | 1 | කි. |
| ගෙනයාහැකි (පෝටබල්) පයිප්ප දඬුඅඬු | 1 | කි. |
| වබුවන්ගේ අඟල් 20 අත්කියත් | 2 | කි. |
| වබුවන්ගේ අඟල් 18 අත්කියත් | 2 | කි. |
| වඩුවන්ගේ අඩුමිටි (ක්ලෝහැමර්) | 2 | කි. |
| (ජැක්) යතුකැට | 2 | කි. |
| (ටුයින්) යතුකැට | 2 | කි. |
| වඩුවන්ගේ මුලමට්ටම | 2 | කි. |
| වඩුවන්ගේ පැතලි නියන කට්ටල | 1 | කි. |
| තෙල්ගල් | 1 | කි. |
| වැලිගල් | 1 | කි. |
| තුන්හුලස් පීර | 12 | කි. |
| ලී පීර (රැස්පීර) | 1 | කි. |
| හේත්තු කලම්ප | 2 | කි. |
| වඩුවන්ගේ දඬු අඬුව | 1 | කි. |
| සිව්බියලි (බෙක්ස්වුඩ්) කෝදුව | 3 | කි. |
| අඩි 100 "ලිනන්" වේප්පටි | 1 | කි. |
| වඩුවන්ගේ බුරුමකටු | 1 | කි. |
| වඩුවන්ගේ බුරුමය | 2 | කි. |
| අතින් ක්‍රියාකරවන විදිනය | 1 | කි. |
| "හයිස්ප්‍රීඩ්" විදිනකටු කට්ටල | 2 | කි. |
| දෙදෙනකු ක්‍රියාකරවන හරස් පොලු සහිත හරස් කියත | 1 | කි. |
| ඉස්කුරුප්පු කියත | 2 | කි. |

2. රත්මලානේ ජලසම්පාදන හා ජලාපවහන අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයේ ටැන්ඩර් ලියවිලි පරීක්ෂා කිරීම පිණිස ඇත.

3. ඉදිරිපත්වීමට අදහස් කරනු ලබන ටැන්ඩර් ඉල්ලුම්කරුවන් රත්මලානේ ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුවේ නිර්මාණ හා නඩත්තු පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැන වෙත ඉල්ලුම් කරනු ලැබූ විට ටැන්ඩර් ලියවිලි පිටපත් දෙකකින් යුක්තව නිකුත් කරනු ලැබේ. එසේ නිකුත් කිරීමට පළමුව ඔවුන් විසින් මෙම දෙපාර්තමේන්තුව විසින් හෝ ඕනෑම කච්චේරියකින් රු. 25 ක වටිනා කමට නිකුත් කරනු ලැබූ රිසිට් පතක්ද ඉදිරිපත් කළ යුතුය. මෙම ටැන්ඩර් ඇප මුදල ටැන්ඩර් කොන්දේසිවලට අනුකූලව ඇපසු ගෙවනවා ඇත.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් ඇප මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන.

නිදසුනක්—වෙනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝර්පරේෂන්.

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති හා

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරනු ලැබූ සමුපකාර සමිති.

5. ටැන්ඩර් ඉදිරිපත් කල යුත්තේ ඉහත සඳහන් පරිදි ලබාගත් ටැන්ඩර් ආකෘති පත්‍ර වලය. 1965 සැප්තැම්බර් මස 17 වැනි සිකුරාදා දවල් 12 දක්වා ටැන්ඩර් ලියවිලි නිකුත් කරනවා ඇත. ටැන්ඩර් ලියවිලි නිකුත් කිරීමේ අවසාන දිනය වනතෙක් නොසිට හැකි තරම් ඉක්මණින් ටැන්ඩර් ලියවිලි ඉල්ලුම් කරන ලෙස ටැන්ඩර් කරුවන් ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

ලාංකික කරනු ලැබ රටවලින් එනම් ජපානය, ජර්මනිය, චීනය, ඇල්බේනියාව, අවුස්ත්‍රියාව, බෙල්ගේරියාව, සැකෝස්ලොවේකියාව, එස්තෝනියාව, හන්ගරිය, ලැට්වියාව, ලිතුවේනියාව, පෝලන්තය, ස්පාඤ්ඤය, සෝවියට් රුසියාව සහ යුගෝස්ලේවියාව වැනි රට වලින් මෙකී උපකරන ආනයනය කර සැපයීමට බලාපොරොත්තුවන ටැන්ඩර් කරුවන්, ලියාපදිංචි ලාංකික ටැන්ඩර් කරුවන් වියයුතු අතර, ආනයන පාලක තැන විසින් නිකුත් කරනු ලැබූ පොදු ආනයන බලපත්‍රයක් ඇතියවුන් විය යුතුය.

සී. රාසයියා,
ජලසම්පාදන හා ජලාපවහන අධ්‍යක්ෂ.

1965 අගෝස්තු 23 වැනි දින,
රත්මලානේ ජලසම්පාදන හා ජලාපවහන,
දෙපාර්තමේන්තුවේදීය.

9-111—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

## ආයුර්වේද දෙපාර්තමේන්තුවේ නාවින්නේ පිහිටි ආයුර්වේද පර්යේෂණායතනයේ කිලිටි රෙදි ඇපිල්ලීමේ ටෙන්ඩරය—1965 66 මුදල් වර්ෂය

1965 ඔක්තෝබර් මස 1 දා සිට 1966 සැප්තැම්බර් මස 30 වෙනිදා දක්වා (මුල අග දෙදිනද ඇතුළුව) කාලය තුළ නාවින්නේ පිහිටි ආයුර්වේද පර්යේෂණායතනයට අයත් කිලිටි රෙදි ඇපිල්ලීම සඳහා ආයුර්වේද කොමසාරිස් විසින් 1965 සැප්තැම්බර් 17 දින පූ. භා. 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. එම වේලාව ඉක්මවූ විගස ආයුර්වේද කොමසාරිස් විසින් ටෙන්ඩර් පත්‍ර විවෘත කොට පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැනගැනීම පිණිස නම් හා ගාස්තු ප්‍රමාණ කියවනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව ආයුර්වේද කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 10ක් ආයුර්වේද කොමසාරිස් නමට කච්චේරියක හෝ ආයුර්වේද කොමසාරිස් වෙතම හෝ තැන්පත් කොට, ඒ සඳහා ලබාගත් කුවිතාන්සිය ආයුර්වේද කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍ර පෝරම ලබාගත හැක. කොමසාරිස්ගේ කාර්යාලයට පැමිණ පෞද්ගලිකවම ටෙන්ඩර් පත්‍රය භාර දුනහොත් ආයුර්වේද කොමසාරිස් විසින් හෝ යථා පරිදි බලය පවරන ලද ඔහුගේ නියෝජිතයා විසින් හෝ එය භාරගත් බවට කුවිතාන්සියක් දෙනු ලැබේ. තමා කැමති නම්, ආයුර්වේද කොමසාරිස් වෙත, ලියාපදිංචි තැපෑලෙන් ටෙන්ඩර් පත්‍රය ඉදිරිපත් කිරීමට ටෙන්ඩර්කරුට පුළුවන.

3. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනට පෙර දින මධ්‍යාහ්නයේ 12ට පෙර ටෙන්ඩර් පත්‍ර පෝරම ලබාගත යුතුය. නියමිත පෝරමයේ නොලියූ කිසිම ටෙන්ඩර් පත්‍රයක් සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනයට හා වේලාවට පසුව ලැබෙන ටෙන්ඩර් පත්‍ර සලකා නොබලනු ඇත.

4. භාර දී තිබෙන ඕනෑම ටෙන්ඩර් පත්‍රයක අනු පිටපත, ආයුර්වේද කොමසාරිස් සමග කටයුතු පිළියෙල කර ගැනීමෙන් පසු පරීක්ෂා කර බැලීමට ටෙන්ඩර්කරුවනට පුළුවන.

5. සාර්ථකවූ ටෙන්ඩර්කරු විසින් ඇප වශයෙන් ටෙන්ඩරයෙහි වටිනාකමින් 5%ක මුදලක් තැන්පත් කළයුතු වන අතරම කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කිරීම සම්බන්ධයෙන් ගිවිසුමකට හා බැඳුම්කරයකට අත්සන් තැබිය යුතුය. සාර්ථක වූ ටෙන්ඩර්කරු කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු අසාර්ථක වූ ටෙන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

6. මෙම සේවය පිළිබඳ සියලුම විස්තර ආයුර්වේද කොමසාරිස්ගෙන් ලබාගත හැකිය.

ඇස්. ආර්. ප්‍රනාන්දු,
ආයුර්වේද කොමසාරිස් වෙනුවට.

1965 අගෝස්තු 26 දින,
කොළඹ 8,
ආයුර්වේද දෙපාර්තමේන්තුවේ දී ය.

9–75—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය

---

## දෙහිවල සත්වෝද්‍යානය

### 1965-66 වර්ෂය සඳහා සත්වාහාර සැපයීම

1965 ඔක්තෝබර් මස 1 සිට 1966 සැප්තැම්බර් 30 වැනි දින දක්වා කාලය තුළ දෙහිවල සත්වෝද්‍යානයට පහත සඳහන් සත්වාහාර සැපයීම සඳහා ටෙන්ඩර්පත්‍ර කොළඹ ලොන්ඩන් පෙදෙසේ අංක 19, රාජ්‍ය කටයුතු අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1965 සැප්තැම්බර් 17 වැනි සිකුරාදා උදේ 9.30 දක්වා භාරගනු ලැබේ :—

| | | | |
|---|---|---|---|
| *1. ෆේජාරේජ් ආහාර | රාත්තල් | 320,000 ක් | පමණ |
| 2. එළවළු පළතුරු ආදිය | ,, | 145,000 ක් | ,, |
| 3. මස් හා මස් ආහාර | ,, | 105,000 ක් | ,, |
| 4. කොළ අතු | හොන්ඩර | 10,000 ක් | ,, |
| 5. තණකොළ | ,, | 7,350 ක් | ,, |

* ටෙන්ඩර්පත්‍ර භාරදුන් විගසම ෆේජාරේජ් ආහාරවල සාම්පල් සුදුසු භාජනවල බහා සත්වෝද්‍යාන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

2. (ඒ) දෙහිවල සත්වෝද්‍යාන අධ්‍යක්ෂගෙන් ලබාගත් අංකිත පත්‍රවල පිටපත් දෙක බැගින් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එක් එක් කරුණ ගැන වෙන වෙනම ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ මුද්‍රා තැබූ කවර තුළ බහා ය. එම කවරයේ පිටපැත්තේ වම් කොනේ මුදුනේ, "ලංකා සත්වෝද්‍යානයට ෆේජාරේජ් ආහාර" හෝ "ලංකා සත්වෝද්‍යානයට මස්" (ඒ ඒ කරුණට ගැලපෙන පරිදි ලිවිය යුතුය), සඳහා 1965.9.17 දිනෙන් අවසන් වන ටෙන්ඩර් පත්‍රයයි" යනුවෙන් සටහන් කොට කොළඹ, ලොන්ඩන් පෙදෙසේ අංක 19 දරණ ස්ථානයේ රාජ්‍ය කටයුතු අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. ටෙන්ඩර් පත්‍රයේ යම් කිසි වෙනසක් කළොත් හෝ මකා වුවහොත් ටෙන්ඩර්කරු විසින් එය අත්සන යොදා සහතික කළ යුතුය.

(බී) "ටෙන්ඩර් කොන්දේසි" පිටපත් දෙකක් ටෙන්ඩර් පත්‍රය සමග නිකුත් කරනු ලැබේ. එයින් එක් පිටපතක් පුරවා ටෙන්ඩර්කරු විසින් අත්සන් කර ටෙන්ඩර් පත්‍රයට අමුණා එවිය යුතුය.

(සී) ටෙන්ඩර් පත්‍ර, රාජ්‍ය කටයුතු අමාත්‍යාංශයේ කාර්යාල සහකරුගේ කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. නැතහොත් ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ඒ කෙසේ වෙතත් ටෙන්ඩර්කරුවෙක් හෝ ඔහුගේ නියෝජිතයෙක් ටෙන්ඩර් පත්‍ර අතින්ම භාරදීමට බලාපොරොත්තුවන්නේ නම් ටෙන්ඩර් පත්‍ර බහාලූ කවරය මුද්‍රා තබා ටෙන්ඩරය කුමක් සඳහා දී යන විස්තරත් ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනයත් කවරයේ පිට ලියා, කොළඹ, ලොන්ඩන් පෙදෙසේ අංක 19 දරණ, රාජ්‍ය කටයුතු අමාත්‍යාංශයේ කාර්යාල සහකරු වෙත අතින්ම භාරදිය හැකිය. එම නිලධාරි තැන ටෙන්ඩර් භාරගැනීමට බලය ලබා ඇත. ඔහු ටෙන්ඩරය ලද බවට රිසිට් පත්‍රයක් නිකුත් කරනු ඇත.

3. ටෙන්ඩර් පෝරම ලබාගැනීමට එක් එක් කරුණ සඳහා රුපියල් 50 බැගින් කොළඹ කච්චේරියේ තැන්පත් කොට ලබාගත් රිසිට්පත්‍ර දෙහිවල සත්වෝද්‍යාන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම 1965.9.16 දින සවස 3 දක්වා කාර්යාල වේලාවන් තුළ, දෙහිවල සත්වෝද්‍යාන අධ්‍යක්ෂගෙන් ලබාගත හැකිය.

4. අවශ්‍ය වෙනත් තොරතුරු වේනොත් මෙහි පහත නම් සඳහන් අයගේ කාර්යාලයෙන් සෙනසුරාදා දිනවල උදේ 9 සිට සවස 1 දක්වාද, ඉරිදා හැර අනෙක් සතියේ දිනවල උදේ 9 සිට සවස 4.30 දක්වා ලබාගත හැකිය.

ඩබ්ලිව්. ඇල්. ඊ. ද අල්විස්,
අධ්‍යක්ෂ.

1965.8.26 වැනි දින,
දෙහිවල, සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ දීය.

9–76—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### කර්මාන්ත ප්‍රදර්ශනයෙහි ප්‍රදර්ශනාගාර කැඩීම සඳහා මිල ගණන් කැඳවීම

කොළඹ, තුරග තරග පිටියෙහි ඉදිකර ඇති කර්මාන්ත ප්‍රදර්ශනයෙහි සංයුක්ත මණ්ඩලීය ප්‍රදර්ශනාගාර ගොඩනැගිලි කැඩීම සඳහා පිළිගත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලැබේ.

ටෙන්ඩර්පත් ඉල්ලුම්කරු ප්‍රදර්ශනාගාරය කඩා, එහි ඇති වීදුරු, යකඩ, දැව හා වහල සෙවිලි කරන ලද ද්‍රව්‍ය ප්‍රවේසම් සහිතව ගොඩ ගැසිය යුතුයි. මේකී ද්‍රව්‍ය සංයුක්ත මණ්ඩලයට අයිතිවේ.

ගඩොල්, කොන්ක්‍රීට් හා වෙනත් ගල්වැඩ කොන්ත්‍රාත්කරු විසින් හාරගෙන, එම ස්ථානය පොළවට සමතලාකොට, සියලුම සුන්බුන් ඉවත් කර, පිරිසිදු කළ යුතුයි.

කවරයෙහි "ප්‍රදර්ශනයෙහි ඇති ප්‍රදර්ශනාගාරය කැඩීම සඳහා" යනුවෙන් සඳහන් කොට, ලියාපදිංචි කළ ලියුම් කවරයක බහා, සාමාන්‍යාධිකාරී නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය, 70, යෝක් වීදිය, කොළඹ 1 යන ලිපිනයට 1965 සැප්තැම්බර් 11 දිනට ප්‍රථම ලැබෙන්ට සැලැස්විය යුතුයි.

සාමාන්‍යාධිකාරී,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

70, යෝක් වීදිය,
කොළඹ 1,
1965 අගෝස්තු 23 දින.

9–82—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය

## අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය

අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ කාර්යාලීය ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම සඳහා අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි තැන විසින් 1965 සැප්තැම්බර් 27 වැනි දින පෙරවරු 10 දක්වා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන් රජයේ හෝ පළාත් පාලන සේවයේ හෝ රජයේ සංයුක්ත මණ්ඩලයන්හි හෝ සංස්ථාවන්හි සිවිල් ඉංජිනේරු වැඩ පිළිබඳ රුපියල් 10,000 කට හෝ වැඩි ප්‍රමාණයකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් විය යුතුයි.

3. ටෙන්ඩරය ප්‍රදානය කරනු ලැබූ අය විසින් ගිවිසුම් පත්‍ර අත්සන් කළ දින සිට මාස දෙකක් ඇතුළත සම්පූර්ණ වැඩය නිමකළ යුතුයි. අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි තැනගෙන් ලබා ගත් නියමිත ආකෘති පත්‍ර මගින් ඉල්ලුම් කළ යුතුයි.

4. රුපියල් 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි වෙත ටෙන්ඩර් පෝරම නිකුත් කිරීමට පෙර තැන්පත් කළ යුතුයි. 2 වැනි ඡේදයේ ප්‍රකාර කොන්ත්‍රාත්කරුගේ ලියාපදිංචිවීමේ සහතිකය ඉදිරිපත් කිරීමෙන් පසු 1965 සැප්තැම්බර් 16 වැනි දින ප.ව. 2 දක්වා ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල් භාරගනු ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල් රිසිට් පත්‍රය ඉදිරිපත් කළ විට 1965 සැප්තැම්බර් 17 දින ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ඇත.

5. අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි තැනගේ කාර්යාලයේදී 1965.9.27 වැනි දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් විවෘත කරනු ඇත. ඕනෑම ටෙන්ඩර්කරුවෙකුට තමා කැමතිනම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී පෙනී සිටිය හැක.

6. අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ කාර්මික අංශයේදී මේ වැඩයට අදාල විස්තර සටහන් සාමාන්‍ය කාර්යාල වේලාවන්හිදී බලා ගැනීමට හැක.

7. ටෙන්ඩර් පතක් භාර ගැනීම හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලු ටෙන්ඩර් පත්‍ර භාර නොගැනීමේ බලය අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි තැනට හිමිවේ.

8. වැඩි විස්තර සාමාන්‍ය කාර්යාල වේලාවන්හිදී අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි තැනගෙන් ලබා ගත හැක.

සාමාන්‍යාධිකාරි,
අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය.

1965 අගෝස්තු මස 17 වැනි දින,
අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ දීය.

9-935—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

## සමූපකාර තොග වෙළඳ සංස්ථාව

### කොළඹ වරායේ සිට කරවල බෑම, පැටවීම හා වැලිසර පිහිටි සතොස ගුදම්වලට ප්‍රවාහණය කිරීම

ඉහත සඳහන් සේවාව සඳහා, 1965 සැප්තැම්බර් මස 15 වැනි බදාදා අ.භා. 2 වන තුරු, කොළඹ 2, චොක්ස්වෝල් වීදියේ අංක 21 දරණ ස්ථානයේ සතොස සාමාන්‍යාධිකාරිවරයා විසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ. වාප්පුවෙන් බඩු ඉවත් කිරීමේ පළපුරුද්දක් තිබෙන අඛණ්ඩ කාර්යක්ෂම සේවාවක් ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් වාහන සංඛ්‍යාවක් හා කම්කරු පිරිසක් ඇති, ප්‍රසිද්ධ ප්‍රවාහන කොන්ත්‍රාත්කරුවන් විසින් එවනු ලබන ටෙන්ඩර් පත් පමණක් සලකා බලනු ලැබේ.

කොළඹ 10, මැකලම් පාරේ අංක 85 දරණ ස්ථානයේ පිහිටි සතොස ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ, කළමනාකරුගේ කාර්යාලයෙන්, රු. 250 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවීමෙන් (රුපියල් දෙසිය පණහක් පමණයි). තවදුරටත් විස්තර හා ටෙන්ඩර් පෝරමද ලබාගත හැක.

සාමාන්‍යාධිකාරි,
සමූපකාර තොග වෙළඳ සංස්ථාව.

21, චොක්ෂෝල් වීදිය,
කොළඹ 2.

9-81—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

## ප්‍රයෝජනයට ගත නොහැකිබවූ විකිණීම සඳහා

මෙම කාර්යාලයෙන් ලබා ගැනීමට හැකි ටෙන්ඩර් පෝරමයේ පරණ ටයර්, ටියුබ් සහ පරණ උපකරණ වලට මිළ ගණන් බාරගනු ලැබේ.

ඉල්ලුම් පත්‍ර කවරයේ වම් කෙළවරේ "පරණ බඩු සඳහා ටෙන්ඩරය" කියා ලියා කොළඹ 7, 52, රෝස්මීඩ් පෙදෙසේ, ලංකා රාජ්‍ය වැවිලි මණ්ඩලයේ සභාපති තැන වෙත එවිය යුතුයි. කාර්යාල වේලාවන්හිදී මෙම බඩු පරීක්ෂා කළ හැකිය. 1965, සැප්තැම්බර් මස 24 වැනි සිකුරාදා සවස 2.30ට ටෙන්ඩර් පත්‍ර කැඳවීම අවසන් වේ.

කොළඹ 7, 52, රෝස්මීඩ් පෙදෙසේ පිහිටි කාර්යාලයේ රු. 50 ක අත්තිකාරම් මුදලක් ගෙවිය යුතුය. එසේ නැතිනම් කොළඹ, යෝක් වීදි ශාඛාවේ පිහිටි ලංකා බැංකුවේ ලංකා රාජ්‍ය වැවිලි මණ්ඩලයේ නමින් මෙම මුදල තැන්පත් කර ඊට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

මෙම දිනයේ එම වේලාවටම ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරනවා ඇත. 1965 සැප්තැම්බර් මස 17 වැනි දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

සභාපති,
ලංකා රාජ්‍ය වැවිලි මණ්ඩලය.

52, රෝස්මීඩ් පෙදෙස,
කොළඹ 7,
1965.8.23.

9-142—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

## ලංකා පිඟන් කර්මාන්ත සංස්ථාව

### මීගමුවේ, පිඟන් කම්හලේ ටොප් හැට් කිල්නයට විදුලි උපකරණ සපයා සවිකිරීමේ ටෙන්ඩරය

ටෙන්ඩර්පත භාරගැනීමේ අවසාන දිනය 65 සැප්තැම්බර් 22 වෙනි දින සවස 3 තෙක් දීර්ඝ කර ඇත. ටෙන්ඩර් ආකෘති පත්‍ර 65 සැප්තැම්බර් 18 වෙනි දින දහවල් 12තෙක් නිකුත් කරනු ලැබේ.

සැපයීම් සහ වාප්පු දෙපාර්තමේන්තුව,
110, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, කොළඹ 2.

ඔ. ඩී. ඩබ්. ජේ. ඊ. අබේසරත්න,
සැපයීම් නිලධාරි.

9-162—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

# තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## ටෙන්ඩර් ප්‍රතිඵල—1965 අවුරුද්ද තුල වෛද්‍ය ආයතනවලට පිසූ ආහර සැපයීම

(මාතර සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය)

| ආයතනයේ නම | සේවකයින් සඳහා | | | | ලෙඩුන් සඳහා | | | | තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු |
|---|---|---|---|---|---|---|---|---|---|
| | මාළු | මස් | කරවල | එළවළු | මාළු | මස් | කරවල | එළවළු | |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | |
| අම්බලන්තොට, ග්‍රා.රෝ. | 1 71 | 2 15 | 1 46 | 1 18 | 1 63 | 2 0 | 1 40 | 1 08 | ඩබ්ලිව්. බී. ආර්. සොයිසා මහතා |
| දෙයියන්දර, මා.නි. | 1 50 | 1 40 | 1 35 | 1 25 | 1 45 | 1 40 | 1 35 | 0 95 | ඇම්. බී. සෙනවිරත්න මහතා |
| දෙවිනුවර, මා.නි. | 2 25 | 2 0 | 2 0 | 1 75 | 2 0 | 1 90 | 1 90 | 1 75 | ඩී. දීරසිංහ මහතා |
| ගැටමාන්න, මා.නි. | 2 30 | 2 20 | 1 85 | 1 10 | 2 20 | 2 0 | 1 80 | 1 10 | ජේ. විජේසිංහ මහතා |
| හකුරුවෙල, මා.නි. | 3 0 | 2 75 | 2 75 | 2 50 | 3 0 | 2 75 | 2 75 | 2 50 | ඩී. දීරසිංහ මහතා |
| බෙලිගල්ල, මා.නි. | 2 0 | 1 80 | 1 90 | 1 75 | 2 0 | 1 80 | 1 90 | 1 70 | ඩී. දීරසිංහ මහතා |
| කිරම, මා.නි. ... | 1 85 | 1 55 | 1 45 | 1 0 | 1 75 | 1 55 | 1 65 | 0 80 | ටී. ඩී. ඇස්. කරුණානායක මහතා |
| කොටපොල, මා.නි. | 1 90 | 1 90 | 1 80 | 1 68 | 1 80 | 1 80 | 1 70 | 1 55 | ඩී. පී. සුබසිංහ මහතා |
| මිද්දෙනිය, මා.නි. ... | 1 95 | 1 95 | 1 95 | 1 50 | 1 90 | 1 80 | 1 85 | 1 45 | ඩී. දීරසිංහ මහතා |
| මිරිස්ස, මා.නි. ... | 2 70 | 2 30 | 2 65 | 2 25 | 2 70 | 2 30 | 2 65 | 2 25 | ඩී. ඉලංපෙරුම මහතා |
| නාකුළුගමුව, මා.නි. | 1 80 | 1 70 | 1 70 | 1 40 | 1 75 | 1 60 | 1 60 | 1 30 | ඩී. දීරසිංහ මහතා |
| පලතුඩුව, මා.නි. ... | 2 40 | 2 20 | 2 20 | 1 90 | 2 40 | 2 20 | 2 20 | 1 90 | ඩී. දීරසිංහ මහතා |
| උඩුවිල, මා.නි. ... | 1 90 | 1 70 | 1 90 | 1 24 | 1 90 | 1 60 | 1 80 | 1 24 | ඩී. දීරසිංහ මහතා |
| වැලිපිටිය, මා.නි. ... | 2 85 | 2 22 | 2 27 | 2 07 | 2 68 | 2 05 | 2 10 | 1 90 | ඩී. ඉලංපෙරුම මහතා |

එච්. පී. ගෝමස්,
මාතර සෞඛ්‍ය සේවා අධිකාරී.

1965 අගෝස්තු මස 25 වැනි දින,
මාතර සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී ය.

9-107/1.—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මාතර කොට්ඨාශය

### 1964–65 අවුරුද්ද සඳහා තෝරාගනු ලැබූ ටෙන්ඩර්—වෛද්‍ය ආයතන වලට පිසූ ආහාර සැපයීම

| ආයතනයේ නම | සේවකයින් සඳහා | | | | ලෙඩුන් සඳහා | | | | තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු |
|---|---|---|---|---|---|---|---|---|---|
| | මාළු | මස් | කරවල | එළවළු | මාළු | මස් | කරවල | එළවළු | |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | |
| අකුරැස්ස, ග්‍රා. රෝ. ... | 0 30 | 0 30 | 0 30 | 0 30 | 1 40 | 1 30 | 1 05 | 0 70 | *ඇම්. ඒ. පෙරේරා |
| අකුරැස්ස, ග්‍රා. රෝ. ... | 1 40 | 1 25 | 0 95 | 0 75 | 1 40 | 1 30 | 1 05 | 0 84 | ඒ. ඩී. යාපා |
| අඟුනකොලපැලැස්ස, ග්‍රා. රෝ. | 2 25 | 1 60 | 1 60 | 1 10 | 2 25 | 1 55 | 1 55 | 1 0 | ඩබ්ලිව් .බී . ආර්. සොයිසා |
| බ,රගම, ග්‍රා. රෝ. ... | 1 80 | 1 75 | 1 65 | 1 20 | 1 75 | 1 68 | 1 68 | 1 20 | ඩබ්ලිව්. බී. ආර්. සොයිසා |
| දික්වැල්ල, ග්‍රා රෝ. ... | 1 70 | 1 45 | 1 22 | 1 0 | 1 65 | 1 40 | 1 15 | 0 80 | *ඇම්. ඒ. පෙරේරා |
| දික්වැල්ල, ග්‍රා රෝ. ... | 1 75 | 1 55 | 1 45 | 1 20 | 1 70 | 1 50 | 1 40 | 1 15 | ඩී. දීරසිංහ |
| ග.ගොඩගම, ග්‍රා රෝ. | 1 90 | 1 75 | 1 80 | 1 04 | 1 90 | 1 70 | 1 60 | 0 98 | ඩී. දීරසිංහ |
| කඹුරුපිටිය, ග්‍රා. රෝ. | 1 67 | 1 45 | 1 40 | 1 10 | 1 65 | 1 42 | 1 35 | 1 04 | කහගල අකුර ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය |
| කාරියමඩිත්ත, ග්‍රා. රෝ. | 1 85 | 1 80 | 1 56 | 1 18 | 1 80 | 1 70 | 1 50 | 1 10 | ඩබ්ලිව්. බී. ආර්. සොයිසා |
| කතරගම, ග්‍රා. රෝ. ... | 1 48 | 1 45 | 1 27 | 1 0 | 1 50 | 1 40 | 1 32 | 0 94 | *ඩබ්ලිව්. ජී. කුලසූරිය මහත්මිය |
| කතරගම, ග්‍රා. රෝ. ... | 1 75 | 2 10 | 1 55 | 1 12 | 1 70 | 2 0 | 1 45 | 1 0 | ඩබ්ලිව්. බී. ආර්. සොයිසා |
| කටුව න, ග්‍රා. රෝ. ... | 1 65 | 1 40 | 1 40 | 0 88 | 1 65 | 1 35 | 1 29 | 0 90 | ඩබ්ලිව්. ඩී. ඩී. සිල්වා මහත්මිය |
| මාවරල, ග්‍රා. රෝ. ... | 1 65 | 1 50 | 1 50 | 0 90 | 1 65 | 1 40 | 1 40 | 1 0 | *ඩබ්ලිව්. ජී. කුලසූරිය මහත්මිය |
| මාවරල, ග්‍රා. රෝ. ... | 1 60 | 1 50 | 1 40 | 0 90 | 1 35 | 1 40 | 1 35 | 0 85 | ඇස්. සිරිසේන |
| මීගහජඳුර, ග්‍රා. රෝ. | 1 95 | 1 50 | 1 70 | 1 20 | 1 95 | 1 40 | 1 65 | 1 50 | පෙරේරා සහ ලලිතා සමාගම, මීගහජඳුර |
| මිදිගම, ග්‍රා. රෝ. ... | 2 0 | 2 0 | 2 0 | 1 90 | 1 60 | 1 50 | 1 50 | 1 20 | ආර්. වික්‍රමතුංග මහත්මිය |
| මොරවක, ග්‍රා. රෝ. | 1 55 | 1 45 | 1 45 | 1 0 | 1 50 | 1 40 | 1 40 | 0 90 | ඇම්. ධර්මවංශ |
| නරවැල්පිට, ග්‍රා. රෝ. | 1 50 | 1 40 | 1 30 | 0 99 | 1 50 | 1 40 | 1 35 | 0 95 | *ඩබ්ලිව්. ජී. කුලසූරිය මහත්මිය |
| නරවැල්පිට, ග්‍රා. රෝ. | 1 75 | 1 65 | 1 60 | 1 18 | 1 70 | 1 60 | 1 55 | 1 0 | ඩී. දීරසිංහ |
| රන්න, ග්‍රා රෝ. ... | 1 80 | 1 60 | 1 50 | 1 15 | 1 60 | 1 52 | 1 40 | 1 18 | ඩබ්ලිව්. ඩී. ඩී. සිල්වා මහත්මිය |
| තිස්සමහාරාමය, | 1 45 | 1 40 | 1 40 | 0 99 | 1 42 | 1 40 | 1 35 | 0 80 | *පී. ඇම්. රොද්‍රිගෝ |
| තිස්සමහාරාමය, | 1 40 | — | 1 25 | 1 0 | 1 40 | — | 1 25 | 1 0 | ටී. ඒ. ඇම්. ප්‍රනාන්දු |
| ඌරුබොක්ක, | 1 60 | 1 50 | 1 45 | 1 0 | 1 55 | 1 45 | 1 35 | 0 95 | ඇම්. ධර්මවංශ |
| වැලිගම, ... | 1 40 | 1 25 | 1 15 | 0 88 | 1 40 | 1 25 | 1 15 | 0 78 | බී. ඇස්. ප්‍රනාන්දු |

* මෙම ලකුණෙන් හඳුන්වා ඇති අය සේවය ටික දිනක් කර ගොස් නතර කර ඇත.

එච්. පී. ගෝමස්,
මාතර සෞඛ්‍ය සේවා අධිකාරී.

1965. 8. 25 වැනි ද,
මාතර සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී ය.

9–107/2.—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### අගල් කැනීමේ යන්ත්‍රයක් මිළ දී ගැනීම—ටෙන්ඩර් ප්‍රතිඵල

| ලැබුණු ටෙන්ඩර් ගණන | සාර්ථක ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් ටෙන්ඩර් ගණන |
|---|---|---|
| හතයි (7) ... | සීමාසහිත බාර්බර්-ග්‍රීන් ඔල්ඩින් සහ සමාගම, එක්සත් රාජධානිය (ක්‍රවුන් ඒජන්තවරුන් මගින්) ... | තිරු ගාස්තු සමග ප. 11,481, ශි. 2[illegible] පැ. 10. |

ඩී. ජේ. රාමනායක,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට

1965 අගෝස්තු 24 දින,
කොළඹ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දී ය.

9-85—65.9,3 දින අංක 14,495 දරන ගැසටපත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම්

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසියේ විකිණීම

රත්නපුර, මූවගන්කන්ද මධ්‍ය දැව ඉරුම්පලෙහි ඇති ඝන අඩි 1,002.1 කින් යුත් II, III, IV වන පංතියේ විවිධ හරස් කැපුම් හා දිග ප්‍රමාණවල ඉරු දැව තොග 17 ක් මවිසින් 1965.9.27 දින පෙ. ව. 10ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසියේ ඉල්ලුම් කිරීමට අපේක්ෂා කරන භවතුන්හට වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම දැව පරීක්ෂාකර බැලීමට උපදෙස් දෙනු ලැබේ.

වෙන්දේසිය පිළිබඳ තවදුරටත් අවශ්‍ය විස්තර පහත අත්සන් කොට ඇති අයගෙන් හෝ මූවගන්කන්ද මධ්‍ය දැව ඉරුම්පල භාර ගබඩා පාලකගෙන් හෝ ලබාගත හැක.

හෙක්ටර් සේනානායක,
බටහිර දිසාවේ දිසා වන නිලධාරී.

දිසා වන නිලධාරි කාර්යාලය,
රත්නපුර,
1965.8.19 දින.

9-115—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසියේ විකිණීම

බුරුත, රානි, මැන්ඩෝරා, කොහොඹ, තේක්ක, හල්මිල්ල, කළුවර යනාදියෙන් සමන්විත කඳන් තොග එකොළහක්ද, 1 වැනි හා 2 වැනි පංතියේ ඉරු දැව තොගයක්ද, කැලෑ දෙපාර්තමේන්තුවට අයත් මොරටුවේ වේල්ස් කුමාර මාවතේ පිහිටි දැව ගබඩාවේදී 65.9.23 වෙනි දින උදේ 10ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසියේ දැව මිලදී ගැනීමට අදහස් කරන අය වෙන්දේසියට කලින් එම ස්ථානයට ගොස් දැව පරීක්ෂා කර බලා දැවවල තත්ත්වය හා මිණුම් ප්‍රමාණය ගැන සෑහීමට පත්විය යුතුය. සෑම තොගයක් සඳහාම වැඩිම ලංසුව තබන්නා, එම විකිණීම අවසන් වූ වහාම දැවවල සම්පූර්ණ මුදල ගෙවිය යුතු අතර, දැව වෙන්දේසි කළ දින සිට රජයේ වැඩ කරන දින තුනක් ඇතුළතදී දැව ඉවත්කර ගත යුතුය.

වැඩි විස්තර, කොළඹ වන සංරක්ෂණ කාර්යාලයෙන් හෝ මොරටුවේ දැව ගබඩාවේ ගබඩා භාරකරුගෙන් හෝ පැමිණ ලබාගත හැක.

වී. ජෝ. වීරරත්න,
වැඩ බලන වන සංරක්ෂක වෙනුවට.

වන සංරක්ෂණ කාර්යාලය,
තැ. පෙ. 509,
කිව් පාර, කොළඹ 2,
65.8.27.

9-116—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව

### බුරුත හා කළුවර කඳන් වෙන්දේසියේ විකිණීමයි

කැලෑ දෙපාර්තමේන්තුවට අයත්, කොළඹ මැකලම් පාර අද්දර පිහිටි කැළණිවැලි දැව ගබඩාවේ තිබෙන අපනයන කිරීමට සුදුසු ඝන අඩි 572.6 කින් සමන්විත බුරුත කඳන් 25ක්ද, ඝන අඩි 198.3කින් සමන්විත කළුවර කඳන් 20 ක්ද 65.9.30 දින උදේ 10.30ට එම ගබඩාවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසියේ කඳන් මිලදී ගැනීමට අදහස් කරන අය, වෙන්දේසියට කලින් එම ස්ථානයට ගොස් දැව පරීක්ෂා කර බලා දැවවල තත්ත්වය හා මිනුම් ප්‍රමාණ ගැන සෑහීමට පත් විය යුතුය. සෑම තොගයක් සඳහාම වැඩිම ලංසුව තබන්නා එම විකිණීම අවසන් වූ වහාම දැවවල සම්පූර්ණ මුදල ගෙවිය යුතු අතර, දැව වෙන්දේසි කළ දින සිට රජයේ වැඩ කරන දින තුනක් ඇතුළතදී, දැව සියල්ල ඉවත්කර ගත යුතුය.

වැඩි. විස්තර කොළඹ වන සංරක්ෂකගේ කාර්යාලයෙන් හෝ කොළඹ කැළණිවැලි දැව ගබඩාවේ ගබඩාකරුගෙන් හෝ පැමිණ ලබා ගත හැක.

වී. ජෝ. වීරරත්න,
වැඩ බලන වන සංරක්ෂක වෙනුවට.

වන සංරක්ෂණ කාර්යාලය,
තැ. පෙ. 509,
කිව් පාර, කොළඹ 2,
65.8.27.

9-117—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසියේ විකිණීම

නිකවැරටිය අඩවියේ ඇති හල්මිල්ල, පලු, බුරුත හා තේක්ක කඳන් 220 කින් සමන්විත ඝනඅඩි 593.1 ක්ද, බුරුත, හල්මිල්ල හා තෙක්ක ඉරු ලී කැලි 211කින් සමන්විත ඝනඅඩි 136.1ක්ද, 1 වන පංතියේ වටලී 16ක්ද 1965 සැප්තැම්බර් මස 13 වන දින උදය 10ට නිකවැරටිය අඩවි කැලෑ කාර්යාලයේදී වයඹ දිසා කැලෑ නිලධාරි විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉල්ලුම්කරුවන්ට දැව වෙන්දේසියට පෙර පරීක්ෂා කර බැලිය හැක.

වැඩි විස්තර සඳහා වයඹ දිසා කැලෑ නිලධාරි හෝ නිකවැරටිය අඩවි කැලෑ නිලධාරි විමසන්න.

ස. මුත්තයියා,
වයඹ දිසාභාර කැලෑ නිලධාරී.

දිසා කැලෑ කාර්යාලය,
කුරුණෑගල,
65.8.21.

9-118—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

## කැලෑ දෙපාර්තමේන්තුව

### වෙන්දේසියේ විකිණීම්

කැලෑ දෙපාර්තමේන්තුවේ උතුරු මැද දිසා භාර කැලෑ නිලධාරි විසින් ත්‍රිකුණාමලය දැව ගබඩාවේ ඇති I, II, හා III පන්තියේ ඉරු ලි තොග 4ක්ද (ඝ. අ. 190.6 පමණ) I හා II පන්තියේ වට කඳු 1,746 ක්ද, හැඹිලි කඳු 258 ක්ද, දර මිටි තොග 35ක්ද, පිටපලු ටොන් 5, සාර්තු 12 ක්ද 65.9.13 දින පෙරවරු 10ට දැව තිබෙන ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉල්ලුම්කරුවනට දැව වෙන්දේසි කිරීමට පෙර පරීක්ෂා කර බැලිය හැක.

වැඩි විස්තර සඳහා පහත සඳහන් කරන මාගෙන් හෝ ත්‍රිකුණාමලය දැව ගබඩාකරුගෙන් විමසන්න.

ජා. ආ. ද සිල්වා,
දිසා වන නිලධාරි (උ. මැ. දි.)

1965 අගෝස්තු මස 22 දින,
ත්‍රිකුණාමලය, දිසා වන කාර්යාලයේදී.

9-119-61.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පාවිච්චි කළ ගිස්ගෝනි සහ සත්වාහාර කබදාසි මළු වෙන්දේසියේ විකිණීම

1965 සැප්තැම්බර් 30 දින පස්වරු 2ට පාවිච්චි කළ ගිස් ගෝනි සහ සත්වාහාර කබදාසි මළු 5000ක් පමණ විකිණීම සඳහා, ගාල්ලේ ලබුදූව රජයේ ගොවිපලේ දී ප්‍රසිද්ධ වෙන්දේසියක් පැවැත් වේ. සාමාන්‍ය රාජකාරි වේලාව තුළ දී ඉහත සඳහන් ස්ථානයේ දී මෙම ද්‍රව්‍යයන් පරීක්ෂා කර බැලිය හැකිය.

වෙන්දේසි දිනයේ දී පැමිණෙන ගැනුම්කරුවන් හා සමග සාමාන්‍ය ගිවිසුමකට එළැඹ ගැනුම්කරුවන්ගේ පහසුව තකා මෙම ද්‍රව්‍ය 100 හෝ ඊට වැඩි තොග වශයෙන් වෙන්දේසි කිරීමට යෝජනා කෙරේ.

වෙන්දේසිය අවසන් වූ විගාම ලබුදූව රජයේ ගොවිපලේ කළමනාකරුට මුදල් ගෙවා ඔහුගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය. වෙන්දේසිය පවත්වන දිනයේ ම එකී ද්‍රව්‍ය ඉවත් කර ගත යුතුය.

ඞී. සී. ඇල්. අමරසිංහ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1965.8 23 දින,
පේරාදෙනියේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දීය.

9-129/1—65.9.3 දින අ ක 14,495 දරණ ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පාවිච්චි කළ ගිස් ගෝනි සහ සත්වාහාර කබදාසි මළු වෙන්දේසියේ විකිණීම

1965 සැප්තැම්බර් 28 දින හා 1965 සැප්තැම්බර් 30 දින පෙරවරු 10ට පාවිච්චි කළ ගිස්ගෝනි සහ සත්වාහාර කබදාසි මළු 5000ක් පමණ විකිණීම සඳහා, කොළඹ 7 ග්‍රෙගරි පාරේ අංක 54 දරණ ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියක් පැවැත්වේ. වෙන්දේසිය පැවැත්වෙන දිනට පෙරදින ඉහත සඳහන් ස්ථානයේදී මෙම ද්‍රව්‍යයන් පරීක්ෂා කර බැලිය හැකිය.

වෙන්දේසි දිනයන්හි දී පැමිණෙන ගැනුම් කරුවන් හා සමග සාමාන්‍ය ගිවිසුමකට එළැඹ ගැනුම්කරුවන්ගේ පහසුව තකා මෙම ද්‍රව්‍ය 100ක් හෝ ඊට වැඩි තොග වශයෙන් වෙන්දේසි කිරීමට යෝජනා කෙරේ.

වෙන්දේසිය අවසන් වූ විගාම වෙන්දේසිය පවත්වනු ලැබූ නිලධාරියාට ගෙවීම් කොට ඔහුගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය. වෙන්දේසිය පවත්වන දිනයේ ම එකී ද්‍රව්‍ය ඉවත් කරගත යුතුය.

ඞී. සී. ඇල්. අමරසිංහ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1965 8.23 දින,
පේරාදෙනියේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දීය.

9-129/2—65.9.3 දින අ ක 14,495 දරණ ගැසට් පත්‍රය.

---

## රේගුවේ වෙන්දේසියක්

පහත සඳහන් භාණ්ඩ කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ බෙල්ජට් තටාකයේ අංක 1, 2, 4 යන ගුදම්වලදී 1965 සැප්තැම්බර් මස 10 වැනි දින (සිකුරාදා) උදේ 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

සාමාන්‍ය වැඩ කරණ වේලාවල ඉහත සඳහන් ස්ථානවලදී මෙම භාණ්ඩ පරීක්ෂා කර බැලීමට පිළිවන.

මෙම වෙන්දේසිය සම්බන්ධ වැඩිමනත් විස්තර දැනගැනීමට අවශ්‍ය නම් කොළඹ රේගු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ලිපිකාර තැනගෙන් දැනගත හැකිය.

රෙදිපිළි, මෝටර් රථ උපකරණ, කිරි බෝතල්, උදළුතල, තේ පෙට්ටි, කබදාසි, සිස්ට්, තීන්ත, ප්ලාස්ටික් බඩු, සරනේරු, හිස් බෝතල්, වීදුරු බඩු, සයිකල් විසුබ, ටයර්, යන්ත්‍රෝපකරණ, ක්‍රීඩා භාණ්ඩ, එඬරුතෙල් ඇතුළුව නොයෙකුත් භාණ්ඩ.

බී. අයි. ගුණතුංග,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

අංක [illegible]/65/13
1965 අගෝස්තු 25 දින,
කොළඹ රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

9-162—65.9.3 දින අ ක 14,495 දරණ ගැසට් පත්‍රය.

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## 1965-66 වර්ෂය තුළදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ රා තැබෑරුම් නැවත විකිණීම

1965 ඔක්තෝබර මස 1 වැනි දින සිට 1966 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි පිහිටි පහත සඳහන් තැබෑරුමේ සිල්ලරට පැසුනු රා විකිණීමේ පූර්ණ බලතලය මිල දී ගැනීම සඳහා 1965.7.23 දින අංක 14,458 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි මවිසින් පළකරන ලද අනුරාධපුර තැබෑරුම විකිණීමෙහි දන්වීමෙහි සඳහන් නීතිරීති වලට අනුකූලව ටෙන්ඩර්පත් මෙයින් කැඳවනු ලැබේ.

2. 1965.9.16 වෙනි බ්‍රහස්පතින්ද පෙ. ව. 10 ට ටෙන්ඩර්පත් භාරගැනීම අත්හිටවනු ඇත :—

| අනු අංකය | කොට්ඨාශය | තැබෑරුම පිහිටිය යුතු කොටස | විවෘත වේලාව | වහන වේලාව |
|---|---|---|---|---|
| 1 ... | අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය | අංක 1 දරණ කොටස (මාර්කට්) නව නගරය | පෙ.ව. ... 8.00 | ප. ව. 7.00 |

පී. එච්. ප්‍රේමවර්ධන,
අනුරාධපුර දිසාපති.

1965 අගෝස්තු මස 26 දින,
අනුරාධපුර දිසාපති කාර්යාලයේ දී.

9-89—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ දැළවත.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරණ කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත "පිටපත" කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නො ලැබේ.

10. 1962 ජූලි මස 16 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරණ ගාස්තු මෙසේයි :—

| | | | | රු. | ශ. |
|---|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... | ... | ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට | | ... | ... | 10 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | | ... | ... | 110 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | | ... | ... | 220 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

13. 63.8.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | | | | මෙරට රු. ශ. | | පිටරට රු. ශ. |
|---|---|---|---|---|---|---|
| එක් කොටසක් | ... | ... | ... | 27 50 | ... | 40 50 |
| I වැනි කොටසේ එක ඡේදයක් | | ... | ... | 17.50 | ... | 23 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් | | ... | ... | 25 0 | ... | 33 0 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|---|
| (අ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුළත දී එක කොටසක් ... ... ... | 0 30 | ... | 0 20 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, එක කොටසක් ... ... ... | 0 60 | ... | 0 20 |
| (ආ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුළත් දී, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 15 | ... | 0 15 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 30 | ... | 0 15 |

දායක මුදල් බාරගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි